The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | න්‍යාය | ඉතිහාසය| පන්ති අරගල

# ඉරානය "සුන්නද්දූලි කර දැමීමේ" ට්‍රම්ප්ගේ තර්ජනය: අධිරාජ්‍යවාදී විදේශ ප්‍රතිපත්තිය අපරාධකරණය කිරීම



සැබවින්ම, ඉරානයට එරෙහි ට්‍රම්ප්ගේ ලේ පිපාසිත තර්ජන සහ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ නායකයින් අතර ඊට එරෙහිව කිසිදු බරපතල විරෝධයක් මතුව නොතිබීමෙන් පෙන්නුම් කරන්නේ, ලෝක ධනවාදය විසින් ගෝලීය යුද්ධය සහ එහි ඓන්ද්‍රීය ඵලයක් ලෙස මුළු මහත් ජනගහනයන්ම සංහාරය කිරීම කෙතරම් සාමාන්‍යකරණය කර ඇත්ද යන්නයි.. පි.2

## සමාජවාදී සමානතා පක්ෂය (එ.ප) සහ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි අරගලය

සමාජවාදී සමානතා පක්ෂයේ නවවැනි ජාතික සම්මේලනය රැස්වන්නේ උග්‍රවන අධිරාජ්‍යවාදී යුද්ධය, ගැඹුරු වන ආර්ථික අර්බුදය, පාලක පන්ති ආඥාදායකත්වය දෙසට හැරීම සහ කම්කරු පන්තියේ රැකියා, වේතන සහ සාමාජීය අයිතිවාසිකම්වලට එල්ල වන වර්ධනය වන ප්‍රහාරයන් මධ්‍යයේ ය. පි.5

## සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාරයෙන් වසර 25 ක් පි.11

## සෞදි අරාබියේදී මරණ දඬුවම නියම වූ ශ්‍රී ලාංකික කම්කරු සිවරාසා අනෝජන්ගේ මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම වහා නවත්වනු: විදේශ විනිමය ප්‍රේෂණය සඳහා තමන්ගේම කම්කරුවන් අපනයනය කරන රාජ්‍යය පසුව ඔවුන්ව ගහලයාට අතහැර දමයි

ශ්‍රී ලංකා රජයට, සෞදි රාජාණ්ඩුවට හෝ "ජාත්‍යන්තර ප්‍රජාවට" කෙරෙන කිසිදු ඉල්ලීමකට අනෝජන් හෝ ඔහු සිටින තත්ත්වයේ සිටින සිය දහස් සංඛ්‍යාත කම්කරුවන් බේරාගත නොහැක. මේවා ඔහුගේ මෙම අකරතැබ්බයට වගකිව යුතු බලවේගයන්ගෙන්ම කෙරෙන ඉල්ලීමය. පි.15

## LTTE අපරාධ සහ රාජ්‍ය යුද අපරාධ: අපගේ ආස්ථානය පිළිබඳ දේශපාලනික පැහැදිලි කිරීමක්

අපගේ කාර්යභාරය වන්නේ මේ අපරාධවල පන්තිමය ස්වරූපය, ඒවායින් සේවය වුණේ කාටද, සහ කම්කරු පන්තිය ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන්න කම්කරු පන්තියට පැහැදිලි කර දීමයි. පි.18



## ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වාර්ගික පදනමක් මත, රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ජනගහන සංයුතිය වෙනස් කිරීමේ ක්‍රියාවලියට එරෙහි වනු! ඉදිරි මඟ කුමක් ද? පි.24

# ඉරානය "සුන්නද්දූලි කර දැමීමේ" ට්‍රම්ප්ගේ තර්ජනය: අධිරාජ්‍යවාදී විදේශ ප්‍රතිපත්තිය අපරාධකරණය කිරීම



එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිය ඇමතීමට අඟහරුවාදා, 2026 සැප්තැම්බර් 22 දින, එක්සත් ජාතීන්ගේ මූලස්ථානයට පැමිණි ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් අදහස් දක්වමින්. [AP Photo/Julia Demaree Nikhinson]

**ඇන්ඩ්‍රේ ඩේමන්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* සැප්තැම්බර් *22* දින *"Trump's threat to "annihilate" Iran: The criminalization of imperialist foreign policy"* යන හිසින් පළවූ ඇන්ඩ්‍රේ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිය ඇමතූ ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්, ඉරාන ඉස්ලාමීය ජනරජය (Islamic Republic) "සුන්නද්දූලි කර දමන්නේද (annihilate)" සහ "නැවත කිසි දිනෙක බේරී මතු වීමට ඉඩ නොතබා ඔවුන් අපායටම පන්නා දමන්නේද" යන්න පිළිබඳව තමා තීරණය කරමින් සිටින බව අඟහරුවාදා පැවසීය.

ඇමරිකානු ජනාධිපතිවරයා මෙසේ ප්‍රශ්න කළේය: "මා ඉරාන ඉස්ලාමීය ජනරජය විනාශ කර දමනවාද, එය ඉක්මනින්ම කරනවාද, නැවත කිසි දිනෙක මිනිසුන් සහ රටවල් විනාශ කිරීමට ඔවුන්ට ඉඩක් නොතබාම?"

ට්‍රම්ප්ගේ මෙම මිනීමරු භාෂාව, ගෝලීය යුද්ධයේ පුපුරා යාම මධ්‍යයේ අධිරාජ්‍යවාදී විදේශ ප්‍රතිපත්තිය අපරාධකරණයට ලක්වීමේ නව අදියරක් සලකුණු කරයි. සෝවියට් සංගමයට එරෙහිව සුන්නද්දූලි කිරීමේ යුද්ධයක් (Vernichtungskrieg – war of annihilation) ගෙන ගිය ඇඩොල්ෆ් හිට්ලර්ගේ පාලන තන්ත්‍රයේ දේශපාලන කථිකාවට පරිබාහිරව, නූතන දේශපාලනය තුළ මීට පූර්වාදර්ශයක් නොමැත.

කෙසේ වෙතත්, ට්‍රම්ප් මෙන් නොව, හිට්ලර් සිය ජනගහන සංහාරක (extermination) යුද්ධය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ නැත. ඔහු එම නියෝගය රහසිගතව ලබා දුන්නේ තම ජෙනරාල්වරුන්ට ය. හමුදා මාණ්ඩලික ප්‍රධානී ෆ්‍රාන්ස් හල්ඩර්ගේ (Franz Halder) දිනපොතට අනුව, 1941 මාර්තු 30 වන දින, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 200 කට ආසන්න සංඛ්‍යාවක් සමඟ පැවැති සංවෘත සාකච්ඡාවකදී, ඉදිරියේදී සිදුවන ආක්‍රමණය "සුන්නද්දූලි කිරීමේ යුද්ධයක්" (Vernichtungskampf – war of extermination) වන බව හිට්ලර් ඔවුන්ට පැවසීය.

යුද්ධය හරහා රට යටත් කර ගැනීමට ට්‍රම්ප් දරන උත්සාහයට එරෙහිව නැගී සිටි මිලියන 93 ක ජනගහනයක් වෙසෙන ඉරානයේ ජනතාව සංහාරයකට ලක් කිරීම, සැබවින්ම ධවල මන්දිරය තුළ සක්‍රීයව සාකච්ඡා වෙමින් පවතී. මාධ්‍යවේදී සී මෝර් හර්ෂ් (Seymour Hersh) ජූනි 10 වන දින වාර්තා කළේ, ට්‍රම්ප් සිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පැවැත්වූ රහසිගත හමුවකදී ඉරානයට එරෙහිව න්‍යෂ්ටික ආයුධ (nuclear weapons) භාවිත කිරීම පිළිබඳ අදහස මතු කළ බවයි.

ඉරානයේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව, ජූනි 10 වන විට ඉරානයට එරෙහි ට්‍රම්ප්ගේ අක්‍රමණකාරී අපරාධකාරී යුද්ධයෙන් අවම වශයෙන් පුද්ගලයින් 3,468 දෙනෙකු මියගොස් 26,500 කට වැඩි පිරිසක් තුවාල ලබා තිබුණි. පසුගිය සතියේ, එක්සත් ජාතීන්ගේ කරුණු සෙවීමේ දූත මෙහෙවර (fact-finding mission), පෙබරවාරි 28 වන දින මිනාබ් (Minab) හි ප්‍රාථමික පාසලකට එල්ල කළ ඇමරිකානු මිසයිල ප්‍රහාරයෙන් ළමුන් 120 දෙනෙකු ඇතුළුව 150 කට වැඩි පිරිසක් මියයාම උපුටා දක්වමින්, “එක්සත් ජනපදය යුද අපරාධ සිදු කර ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇතැයි” සොයා ගන්නා ලදී.

ඉරානයට එරෙහි යුද්ධය යනු මුළු මැද පෙරදිග පුරාම ක්‍රියාත්මක වන ඇමරිකානු-ඉශ්‍රායල් ප්‍රහාරයේ එක් අංගයක් පමණි. එහි ඉහළම ප්‍රකාශනය වන්නේ ගාසා හි සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව පලස්තීනුවන් 73,919 දෙනෙකු මරා දමා ඇති ගාසා හි සමූල ජන සංහාරයයිi.

ඉරානයට එරෙහි මෙම තර්ජනය, එවැනි තර්ජන මාලාවක එකක් පමණි. ඇමරිකානු හමුදාව “වෙනිසියුලා අගනුවර අභ්‍යන්තරයටම” විනිවිද ගොස් මදුරෝව (Maduro) “අත්අඩංගුවට ගත්” බවත්, එහි ප්‍රතිඵලය ලෙස බැරල් බිලියන 65 ක් වන “ඉතිහාසයේ විශාලතම තෙල් ගනුදෙනුව” හිමි වූ බවත් ට්‍රම්ප් පුරසාරම් බෑවෙය. “ජයග්‍රාහකයාට කොල්ලකෑම් අයිති වේ,” ට්‍රම්ප් ප්‍රකාශ කළේය. කියුබාව “සම්පූර්ණයෙන්ම අසාර්ථක වූ රාජ්‍යයක්... එය කඩා වැටෙනු ඇත”. විශාල හමුදා කඳවුරු දෙකක් ද සමඟින් ග්‍රීන්ලන්තය එක්සත් ජනපදයේ “ස්ථිර පාලනය” යටතට පත්වීමට නියමිතය.

ට්‍රම්ප්ගේ කතාව අතරතුර, ඔහු පෙරළා දැමීමට තර්ජනය කළ ඉරානය සහ කියුබාව යන රටවල නියෝජිතයින් පමණක් විරෝධය පා සභාවෙන් පිටව ගියහ. ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් ගැන නිරන්තරයෙන් කතා කරන යුරෝපීය අධිරාජ්‍යවාදී බලවතුන්ගේ නියෝජිතයෝ කිසිවක් නොකර බලා සිටියහ. මහා මණ්ඩලයේ මුලසුන දැරූ බංග්ලාදේශ විදේශ අමාත්‍ය ඛලීලුර් රහ්මාන් (Khalilur Rahman) ඇමරිකානු ජනාධිපතිවරයාට ස්තූති කළේය.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (UN Charter) නාසි ජර්මනියේ යටත් වීමෙන් සති හතකට පසු, 1945 ජූනි 26 වන දින සැන් ෆ්‍රැන්සිස්කෝ හිදී අත්සන් කරන ලද්දේ, “අපගේ ජීවිත කාලය තුළ දෙවතාවක්ම මිනිස් සංහතියට කියා නිම කළ නොහැකි තරම් දුකක් ගෙන දුන් යුද්ධයේ ශාපයෙන් ඉදිරි පරම්පරාවන් මුදා ගැනීම සඳහාය”.

එහි 2 වන වගන්තිය සෑම සාමාජිකයෙකුම “ඕනෑම රාජ්‍යයක භෞමික අඛණ්ඩතාවයට හෝ දේශපාලන ස්වාධීනත්වයට එරෙහිව බලය පෑමට තර්ජනය කිරීමෙන් හෝ බලය භාවිත කිරීමෙන් වැළකී සිටීමට” බැඳී සිටී. නීති විරෝධී ආක්‍රමණකාරී යුද්ධයක මාස හතකට ආසන්න කාලයක් ගත කර සිටින රාජ්‍යයක නායකයෙකු විසින්, එම තර්ජනයන් තහනම් කිරීම සඳහාම ඉදිකරන ලද ගොඩනැගිල්ල තුළ සිටම සිදු කරන ලද ට්‍රම්ප්ගේ කතාව එවැනි තර්ජනයකි. ට්‍රම්ප්ගේ කතාවම ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස චෝදනා ගොනු කළ හැකිය.

ට්‍රම්ප්ට යුරෝපීය ප්‍රතිස්වරය (counterpoint) අඟහරුවාදා ලබා දුන්නේ ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් විසිනි. ඔහු කතා කළේ “අධිරාජ්‍යවාදයේ නැවත පැමිණීම, උද්ධච්චකම, කිසිදු නීතියක් නොදන්නා පාලනයකින් තොර බලයේ නැවත ආගමනය... සමහරුන් තම දේශසීමා ව්‍යාප්ත කිරීම සඳහා ජාත්‍යන්තර පටිපාටියට වල කැපිය හැකි යැයි විශ්වාස කරන ලෝකයක්” ගැනය.

ඔහු තවදුරටත් මෙසේ පැවසීය: “යුද අපරාධ කර්මාන්තයක් බවට පත් කර ඇත. සිවිල් යටිතල පහසුකම් විනාශ කිරීම, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අප දැක ඇත්තෙමු”.

නමුත් සමහර විචාරකයින් ඔහුගේ අදහස් ට්‍රම්ප්ට එල්ල කළ වක්‍ර විවේචනයක් ලෙස ගත්තද, ඔහු කිසි විටෙකත් ඇමරිකානු ජනාධිපතිවරයාගේ නම සඳහන් කළේ නැත. ඒ වෙනුවට, ඔහුගේ කතාව රුසියාව ප්‍රසිද්ධියේ හෙළා දකින එකක් වූ අතර, ට්‍රම්ප් සමඟ එක්ව යුක්‍රේනයට අරමුදල් සහ ආයුධ සැපයීම තවදුරටත් කරගෙන යාමේ ප්‍රකාශයක් විය.

රුසියාව “සිවිල් වැසියන්ට එරෙහිව කෲර යුද්ධයක් ගෙන යමින් සිටින බවත්, එය ස්වෛරී රාජ්‍යයක භූමිය අත්පත් කරගෙන සිටින බවත්” මැක්‍රොන් ප්‍රකාශ කළේය. රුසියාවට එරෙහි යුද්ධයේදී “ප්‍රංශය යුක්‍රේනයට නිර්ලෝභීව සහාය දීම තවදුරටත් සිදු කරන බව” ඔහු පැවසීය.

මැක්‍රොන්ගේ මතයට අනුව, රුසියාවේ “අධිරාජ්‍යවාදයට” සහ “යුද අපරාධවලට” සුදුසු පිළිතුර වන්නේ යුරෝපීය අධිරාජ්‍යවාදී බලවතුන් රුසියාවට එරෙහි යුද්ධය දැඩි කිරීමයි. රුසියාවට එරෙහි යුද්ධය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන යුද්ධයක් බවට වන සිය ප්‍රකාශයන්, එම යුද්ධයේ ඔහුගේ සගයා වන ට්‍රම්ප් මුළු රටකම ජනගහනය සංහාරය කිරීමට තර්ජනය කර තිබීම සමග ගැලපීමට මැක්‍රොන් කිසිදු උත්සාහයක් ගත්තේ නැත.

1920 දී ලෙනින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පූර්වගාමියා වූ ජාතීන්ගේ සංගමය (League of Nations) හැඳින්වූයේ “එකිනෙකාගේ මස් කටු උදුරා ගන්නා පිස්සු බලු රංචුවක්”

ලෙසය. සමහර විට එම යෙදුමේ පැරැණි බවක් පෙනේ. 2026 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය යනු යුද්ධය සඳහා වන සක්‍රීය සැලසුම් මධ්‍යස්ථානයකි.

එදිනම යුක්‍රේන ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කි හමුවීමෙන් පසුව, කියෙව් ඉන්ඩිපෙන්ඩන්ට් (Kyiv Independent) අඟහරුවාදා වාර්තා කළ පරිදි, යුක්‍රේනයට රේඩාර් සහ ගුවන්-ආරක්ෂක මිසයිල සැපයීමේ කොන්ත්‍රාත්තුවක් මැක්‍රොන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ට්‍රම්ප් ද අඟහරුවාදා සෙලෙන්ස්කි හමුවූ අතර, යුක්‍රේනය තුළ පේට්‍රියට් (Patriot) ගුවන් ආරක්ෂක මිසයිල නිෂ්පාදනය කිරීම පිළිබඳව සාකච්ඡා වෙමින් පවතින බව තහවුරු කළේය.

ට්‍රම්ප්-සෙලෙන්ස්කි හමුව ආරම්භ වන විට, බ්‍රිතාන්‍ය මාධ්‍යවේදියෙකු ට්‍රම්ප්ට, "එක්සත් රාජධානියේ සහ අනෙකුත් යුරෝපීය නායකයින් වෙතින් නිකුත් වන අප සහ රුසියාව අතර සෘජු ගැටුමක් ඇතිවීමේ අනිවාර්යතාව පිළිබඳ මනෝභාවී සංගීතය ගැන එක්සත් රාජධානියේ බොහොමයක් ජනතාව බෙහෙවින් කනස්සල්ලට පත්ව සිටින බවත්" පවසා, ඉන්පසු ඔහුගෙන් ඇසුවේ, "එය වැළැක්වීමට ඔබට හැකිද?" යන්නය. ට්‍රම්ප් ඊට බැරෑරුම් පිළිතුරක් දීම ප්‍රතික්ෂේප කළේය.

**සැබවින්ම, ඉරානයට එරෙහි ට්‍රම්ප්ගේ ලේ පිපාසිත තර්ජන සහ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ නායකයින් අතර ඊට එරෙහිව කිසිදු බරපතල විරෝධයක් මතුව නොතිබීමෙන් පෙන්නුම් කරන්නේ, ලෝක ධනවාදය විසින් ගෝලීය යුද්ධය සහ එහි කේන්ද්‍රීය ඵලයක් ලෙස මුළු මහත් ජනගහනයන්ම සංහාරය කිරීම කෙතරම් සාමාන්‍යකරණය කර ඇත්ද යන්නයි.**

ඩිමොක්‍රැටිකයින් මෙම යුධවාදයට විකල්පයක් නොවේ. දින කිහිපයකට පෙර, රුසියාවට පමණක් නොව ඉරානයට එරෙහිවද යුද්ධ උත්සන්න කිරීමට ඔවුහු ට්‍රම්ප්ට හිස් චෙක්පතක් ලබා දුන්හ. සැප්තැම්බර් 16 වන දින, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඩිමොක්‍රැටිකයින් 58 දෙනෙකු "ලින්ඩ්සේ ඕ. ග්‍රැහැම් රුසියාව සහ ඉරාන සම්බාධක පනතට" (Lindsey O. Graham Sanctioning Russia and Iran Act) පක්ෂව ඡන්දය දුන් අතර, එමගින් චීනය, ඉන්දියාව සහ රුසියානු තෙල් මිලදී ගන්නා අනෙකුත් විශාලතම රටවලින් කෙරෙන ආනයන සඳහා සියයට 100 දක්වා බදු පැනවීමට ජනාධිපතිවරයාට බලය පවරන අතර ඉරානයේ බලශක්ති සහ ආයුධ අංශයන්හි සම්බාධක වසර පහකට දීර්ඝ කරයි. සෙනෙට් සභාවේ ඩිමොක්‍රැටිකයින් 45 දෙනාගෙන් 36 දෙනෙකුම අගෝස්තු 7 වන දින ඊට පක්ෂව ඡන්දය දී තිබුණි.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සුළුතර නායක හකීම් ජෙෆ්රීස් (Hakeem Jeffries) ඊට "එරෙහිව" ඡන්දය දුන්නේ, පනත රුසියාවට එරෙහිව ප්‍රමාණවත් තරම් දුර නොගිය බව පවසමින්: "ඔබ මැරයා සතුටු කිරීමට නොව මැරයාට එරෙහිව නැගී සිටිය යුතුවේ". නොවැම්බර් 3 න් පසු කොන්ග්‍රසයේ ඩිමොක්‍රැටික් බහුතරයක් ඇති වුවහොත් යුද්ධය තවත් වේගයෙන් සහ දුරදිග ගෙන යනු ඇත.

තම කතාවට පෙර දින, ට්‍රම්ප් ග්‍රේසි මන්දිරයේදී (Gracie Mansion) ඇමරිකාවේ ඩිමොක්‍රැටික් සමාජවාදීන්ගේ (DSA – Democratic Socialists of America) සාමාජිකයෙකු වන නිව්යෝර්ක් නගරාධිපති ශොහ්රාන් මම්දානි (Zohran Mamdani) හමුවිය. මම්දානි යුද්ධය ගැන කිසිවක් නොකී අතර මාධ්‍යවේදීන්ට පැවසුවේ: "නගරය කෙරෙහි ජනාධිපතිවරයා දක්වන කැපවීම අපි අගය කරමු" යනුවෙනි.

"ඇමරිකාවේ ස්වර්ණමය යුගය" ගැන පුරසාරමින් ට්‍රම්ප් සිය කතාව ආරම්භ කළේ, "අලුතින් පණගන්වන ලද සහ ඉතා බලවත් එක්සත් ජනපදයේ ධනය, ශක්තිය, ජීවගුණය සහ ගම්‍යතාවය මුළු ලෝකයම ඉහළට ඔසවා තබමින් සිටින බව" ප්‍රකාශ කරමිනි.

සැබවින්ම, ට්‍රම්ප් මුලසුන දරන්නේ යටි පතුලේ සිට කුණු වෙමින් පවතින සමාජ පර්යායක් සහ දේශපාලන ක්‍රමයක් මත ය – දෙවන ලෝක යුද්ධය ආසන්නයේ ට්‍රොට්ස්කි විසින් එය විස්තර කළේ "ධනවාදයේ මරලතෝනිය" (death agony of capitalism) ලෙස ය. එම අර්බුදයම එහි විරුද්ධ පැත්ත ද නිර්මාණය කරමින් සිටී: එනම් සමාජ විරෝධයේ වර්ධනය, මහා ජනතා විරෝධතා සහ ගෝලීය පන්ති අරගලයයි.

ට්‍රම්ප්ගේ අපරාධකාරී යුද ප්‍රචාරණයට එරෙහි විරෝධය යුරෝපීය අධිරාජ්‍යවාදී බලවතුන්ගෙන් හෝ ඩිමොක්‍රැටිකයින්ගෙන් සහ DSA හි සිටින ඔවුන්ගේ සහචරයින්ගෙන් පැමිණෙන්නේ නැත. එය පැමිණෙන්නේ ජාත්‍යන්තර සමාජවාදයේ වැඩපිළිවෙලින් සන්නද්ධ වූ ජාත්‍යන්තර කම්කරු පන්තියෙනි.

[අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි]

---



 ISSN 3093-6217

# සමාජවාදී සමානතා පක්ෂය (එ.ජ) සහ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි අරගලය




**සමාජවාදී සමානතා පක්ෂය (එක්සත් ජනපදය)** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අගොස්තු *13* දින *“[The SEP and the struggle against imperialist war](#)”* යන හිසින් පළවූ ලිපියේ සිංහල පරිවර්තනය යි.

*2026* අගෝස්තු *2* සිට *7* දක්වා පවත්වන ලද සමාජවාදී සමානතා පක්ෂයේ *(*එක්සත් ජනපදය*) [Socialist Equality Party (US)]* නවවැනි ජාතික සම්මේලනය විසින් ඒකමතිකව සම්මත කරන ලද යෝජනා හයෙන් පළමුවැන්න වන *“*සමාජවාදී සමානතා පක්ෂය සහ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි අරගලය*” (“The SEP and the Struggle Against Imperialist War”)* අපි මෙහි පළ කරමු. සමාජවාදී සමානතා පක්ෂයේ *(SEP)* ජාතික සභාපති ඩේවිඩ් නෝර්ත් *(David North)* විසින් පවත්වන ලද ආරම්භක වාර්තාව මගින් මෙම යෝජනාව සම්මේලනය වෙත ඉදිරිපත් කෙරුණි.

1. සමාජවාදී සමානතා පක්ෂයේ නවවැනි ජාතික සම්මේලනය රැස්වන්නේ උග්‍රවන අධිරාජ්‍යවාදී යුද්ධය, ගැඹුරු වන ආර්ථික අර්බුදය, පාලක පන්ති ආඥාදායකත්වය දෙසට හැරීම සහ කම්කරු පන්තියේ රැකියා, වේතන සහ සමාජීය අයිතිවාසිකම්වලට එල්ල වන වර්ධනය වන ප්‍රහාරයන් මධ්‍යයේ ය. ලෝක යුද්ධයක අනතුර පිළිබඳව තවදුරටත් ප්‍රශ්නයක් නොමැත; එහි ආරම්භක අදියර දැනටමත් ආරම්භ වී ඇත. ලොව පුරා පාලක ප්‍රභූ පැලැන්තිය (elite) ෆැසිස්ට්වාදය සහ ආඥාදායකත්වය දෙසට යොමු වෙමින් සිටිති. අතීතයේ කිසිදා නොවූ විරූ අයුරින් ධනය එක් කොටසක් අත ඒකරාශී වීම, ගෝලීය උද්ධමන රැල්ලක් සහ වේගවත් වන රැකියා විනාශය සමඟ බද්ධ වී බිලියන සංඛ්‍යාත ජනතාවගේ ජීවන තත්ත්වයන් විනාශ කරමින් පවතී. නමුත් මෙම තත්ත්වයන්ම දේශපාලන රැඩිකලීකරණයකට සහ ජාත්‍යන්තරව පන්ති අරගලයේ පුනර්ජීවනයකට මග පාදයි. සමාජවාදී සමානතා පක්ෂය සිය කාර්යභාරයන් නිර්වචනය කළ යුත්තේ මෙම ප්‍රවණතා දෙකේ ගැටුම මධ්‍යයේ ය.

2. පෙබරවාරි 28 වැනිදා අලුයම ආරම්භ කරන ලද ඉරානයට එරෙහි ඇමරිකානු-ඉශ්‍රායල ආක්‍රමණශීලී යුද්ධයට මාස පහක් පිරෙන තැන මෙම සම්මේලනය රැස්වේ. ඇමරිකානු සහ ඉරාන නියෝජිතයන් අතර සාකච්ඡා තවමත් පවතිද්දී මෙම ප්‍රහාරය ආරම්භ වූ අතර, එහි සමාරම්භක ප්‍රහාරයට ඉරානයේ

රාජ්‍ය නායකයා ඝාතනය කිරීම ද ඇතුළත් විය. මාර්තු 2 වැනි දින සමාජවාදී සමානතා පක්ෂය නිකුත් කළ "ඉරානයට එරෙහි සාපරාධී ඇමරිකානු-ඊශ්‍රායල යුද්ධය නතර කරනු!" ("Stop the criminal US-Israeli war against Iran!") යන ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි, මෙම ප්‍රහාරය "එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර නීතිය බරපතල ලෙස උල්ලංඝනය කරමින් දියත් කරන ලද සාපරාධී යුද ක්‍රියාවකි" —එනම් 1945–46 නාසි නායකයන්ගේ නියුරම්බර්ග් නඩු විභාගයේදී (Nuremberg trials) "සාමයට එරෙහි අපරාධයක්" ("crime against peace") ලෙස විස්තර කරන ලද, "සමස්තයේ එකතු වූ නපුර තමන් තුළම දරා සිටීමෙන් පමණක් අනෙකුත් යුද අපරාධවලට වඩා වෙනස් වන පරම ජාත්‍යන්තර අපරාධය" කි.

3. අප්‍රේල් 7 වැනිදා ට්‍රම්ප් විසින් කරන ලද "සම්පූර්ණ ශිෂ්ටාචාරයක් අද රාත්‍රියේ මිය යනු ඇත, නැවත කිසි දිනෙක එය ගෙන එනු නොලැබේ" ("A whole civilization will die tonight, never to be brought back again") යන ජන සංහාරක ප්‍රකාශය අපකීර්තිමත් ලෙස සදාකාලිකව පවතිනු ඇත. ජූලි 11 වන දින ඔහු "ඉරානයේ සියලුම ප්‍රදේශ සම්පූර්ණයෙන්ම අළු දූලි කර විනාශ කර දමන බවට" තර්ජනය කළේය. මෙම ප්‍රකාශයන් ජාත්‍යන්තර නීතිය යටතේ ස්වයංක්‍රීයවම යුද අපරාධ වේ. ධවල මන්දිරයෙන් නිකුත් කළ මෙසේ විනාශ කිරීමේ ක්‍රමවේදයන්ගෙන් ප්‍රකාශ වන්නේ ධනපති ක්‍රමය විසින් මානව වර්ගයා ඇද දමමින් සිටින ම්ලේච්ඡත්වයයි.

4. අනුගාමී "සටන් විරාමයන්" සහ අවබෝධතා ගිවිසුම් බිඳ වැටී ඇති අතර, සෑම බිඳ වැටීමකින් පසුවම අලුත් වටයකින් යුද්ධය උග්‍ර විය. කෙතරම් තාවකාලික ස්වභාවයේ ගිවිසුම්වලට එළඹුනද, යුද්ධය මෙහෙයවෙනු ලබන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලික භූ-මූලෝපායික අභිලාෂයන් විසිනි: එනම් මැද පෙරදිග, එහි ස්වාභාවික සම්පත් සහ ලෝක ආර්ථිකය රැඳී පවතින මූලෝපායික වෙළඳ මාර්ගයන්හි ආධිපත්‍යයයි. මෙම සම්පත් පාලනය කිරීම—සහ ප්‍රතිවාදීන්ට ඒවා අහිමි කිරීමේ බලය—දශක හතකට වැඩි කාලයක් තිස්සේ කලාපය තුළ ඇමරිකානු ප්‍රතිපත්තියේ ප්‍රධාන අවධානය යොමු වූ කරුණ විය. ඉරානයට එරෙහි යුද්ධය යනු, 1979 විප්ලවය මගින් වොෂින්ටනයට එහි පඹ රෙජීමය අහිමි වූ දා සිට සෑම පාලනයක් යටතේම දියත් කරන ලද ද්වි-පාක්ෂික ව්‍යාපාරය යයි.

5. 2026 ජාත්‍යන්තර මැයි දින රැලියේ ආරම්භක වාර්තාවේ ඉදිරිපත් කරන ලද විග්‍රහය මෙම සම්මේලනය අනුමත කරයි: ඉරානයට එරෙහි යුද්ධය "දිගු හමුදා මෙහෙයුම් මාලාවක තවත් එක් කතාංගයක් පමණක් නොවේ. මෙම යුද්ධයේ ප්‍රතිවිපාක මෙම ගැටුමට පැහැදිලි ගෝලීය ස්වරූපයක් ලබා දෙයි, එනම් අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ජාත්‍යන්තර කම්කරු පන්තියට එරෙහිව දියත් කරන ලද ගෝලීය යුද්ධයකි." එහි ප්‍රතිවිපාක ලොව පුරා කම්කරුවන්ට විනාශකාරී වී ඇත. ඉරාන වරායන් නාවික අවහිරතාවයට ලක්කිරීම ලෝක වෙළඳාම සහ බලශක්ති සැපයුම කැළඹීමට ලක්කර ඇති අතර, සෑම මහද්වීපයකම අලුත් උද්ධමන රැල්ලක් ඇති කරමින් ලොව පුරා දස ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ආහාර අනාරක්ෂිතභාවයට හෝ සාගින්නට ඇද දමා ඇත.

6. ඉරානයට එල්ල වූ ප්‍රහාරය ලෝකය නැවත බෙදා වෙන් කිරීම අරමුණු කරගත් අධිරාජ්‍යවාදී ප්‍රචණ්ඩත්වයේ පොදු පුපුරායාමක එක් පෙරමුණක් පමණි. ජනවාරි 3 වන දින වෙනිසියුලාව ආක්‍රමණය කර එහි ජනාධිපතිවරයා පැහැර ගන්නා ලදී. පෙන්ටගනයේ නීති විරෝධී ප්‍රහාර හේතුවෙන් කැරිබියන් සහ නැගෙනහිර පැසිෆික් කලාපයේ ධීවරයින් සහ කම්කරුවන් අවම වශයෙන් 221 දෙනෙකු ප්‍රහාරවලින් මියගොස් ඇත. කියුබාවේ ගෙල හිරකරමින් ආක්‍රමණවල තර්ජනයට ලක්කර ඇත. ඊශ්‍රායලය ලෙබනනයට එරෙහිව අලුත් යුද්ධයක් ආරම්භ කර ඇත. තවද ගාසා තීරයේ ජන සංහාරය තෙවැනි වසරටත් ඉදිරියට යයි: දස දහස් සංඛ්‍යාත පලස්තීන දරුවන් ඝාතනය කිරීම, රෝහල්, පාසල්, ජල පද්ධති සහ නිවාස හිතාමතා විනාශ කිරීම සහ සාගින්න යුද ආයුධයක් ලෙස භාවිත කිරීම මගින් මුළු මහත් සමාජයක්ම ලෝකයේ ඇස් පනාපිට සුන්බුන් බවට පත්කර ඇත.

7. උග්‍ර වන ගෝලීය අධිරාජ්‍යවාදී යුද්ධය එල්ල වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම රුසියාවට සහ චීනයට එරෙහිව ය. ප්‍රමුඛතාවය දිය යුත්තේ කිනම් ගැටුමකටද යන්න පිළිබඳව ඇමරිකානු පාලක පන්තිය තුළ මතභේද පවතී, නමුත් මේවා අත්‍යවශ්‍ය අරමුණ මත එක්සත් වූ පාලක පන්තියක් තුළ පවතින උපායමාර්ගික වෙනස්කම් පමණි. රුසියාවේ විශාල සම්පත්—එහි බලශක්තිය, ඛනිජ සහ පැය කලාප එකොළහක් පුරා පැතිරුණු භූමිය—යටපත් කර අධිරාජ්‍යවාදී සූරාකෑමට විවෘත කළ යුතුය. තවද මෙම යුගයේ කේන්ද්‍රීය ගැටුම ලෙස පවතින්නේ, එහි ආර්ථික නැගී සිටීම ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් සිය පැවැත්මට තර්ජනයක් ලෙස සලකන, චීනයට එරෙහිව දිගු

කලක් තිස්සේ සැලසුම් කරන ලද යුද්ධයයි. එහි කල්ලි අතර කෙතරම් වෙනස්කම් තිබුණද, ඇමරිකානු පාලක පන්තිය සිය ගෝලීය ආධිපත්‍යයට එල්ල වන කිසිදු අභියෝගයක් පිළිගන්නේ නැත. ට්‍රම්ප්ගේ ඩොලර් ට්‍රිලියන 1.5 ක හමුදා අයවැය, වඩාත්ම සෘජු අර්ථයෙන් ගත් කල, ලෝක යුද්ධයක් සඳහා වූ අයවැයකි.

8. ඇමරිකානු අධිරාජ්‍යවාදය යනු පෘථිවියේ ඇති වඩාත්ම විනාශකාරී බලවේගයයි. සිය පිරිහීම ආපසු හැරවීමේ උත්සාහයේදී, එය විසින්ම වරක් ගොඩනඟන ලද පශ්චාත් යුධ පද්ධතියේ සියලු සබඳතා සහ ආයතන බිඳ දමමින් සිටී. එක්සත් ජනපදය සිය නාමික මිත්‍රයින්ට තර්ජනය කර කප්පම් ගන්නා අතර, ඔවුන්ගේ ආර්ථිකයන්ට එරෙහිව තීරුබදු යුද්ධයක් දියත් කරයි, ග්‍රීන්ලන්තය (නේටෝ සංවිධානයේ සාමාජිකයෙකු වන ඩෙන්මාර්කයේ භූමිය) ඈඳා ගැනීමට බලකර සිටින අතර කැනඩාව "පනස් එක්වන ප්‍රාන්තය" දක්වා ලඝු කිරීමට තර්ජනය කරයි. 1928 දී ට්‍රොට්ස්කි (Trotsky) කළ අනතුරු ඇඟවීම අතිශය අදාළත්වයක් සහ තියුණු බවක් ගනී: "අර්බුද කාරී කාල පරිච්ඡේදයේදී එක්සත් ජනපදයේ ආධිපත්‍යය, සමෘද්ධිමත් කාල පරිච්ඡේදයට වඩා සම්පූර්ණයෙන්, වඩා විවෘතව සහ වඩා රුදුරු ලෙස ක්‍රියාත්මක වනු ඇත. එක්සත් ජනපදය සිය දුෂ්කරතාවලින් සහ රෝගවලින් මිදීමට සහ ඒවා ජය ගැනීමට මූලික වශයෙන් උත්සාහ කරන්නේ යුරෝපයේ කරපිටින් ය; මෙය ආසියාවේ, කැනඩාවේ, දකුණු ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ හෝ යුරෝපයේම සිදු වුවද, නැතහොත් මෙය සාමකාමීව හෝ යුද්ධය හරහා සිදු වුවද යන්න අදාළ නොවේ." වසර හයකට පසු, ඉතිහාසය විසින් මානව වර්ගයා "ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගිනිකඳුමය පිපිරීමට මුහුණට මුහුණ" දෙන බව ට්‍රොට්ස්කි පෙර දුටුවේය.

9. යුරෝපීය අධිරාජ්‍යවාදී බලවතුන් නිකම්ම බලා සිටින්නන් නොව සම්පූර්ණ හවුල්කරුවෝ වෙති. නේටෝ බලවතුන් යුක්‍රේනය තුළ රුසියාවට එරෙහිව ප්‍රායෝගිකවම යුද්ධයක (de facto war) නිරත වෙමින් සිටින අතර, එය න්‍යෂ්ටික බලවතුන් වන රාජ්‍යයන් අතර සෘජු ගැටුමක් දෙසට උග්‍ර වෙමින් පවතී. තවද ඔවුහු 1950 ගණන්වල මුල් භාගයෙන් පසු වේගවත්ම ශීඝ්‍රතාවයෙන් ප්‍රතිසන්නද්ධ වීමට පටන් ගෙන ඇති අතර, පසුගිය සියවසේ ලෝක යුද්ධ දෙකේදී මෙන් සටන් කිරීමට සහ මිය යාමට අලුත් පරම්පරාවක් සූදානම් විය යුතු බව ඉල්ලා සිටිති. ජර්මන් අධිරාජ්‍යවාදය නැවත වරක් මෙම ව්‍යාපාරයේ පෙරමුණේ සිටින අතර, හමුදා බඳවා ගැනීම් සහ සිවිල් ජීවිතය යුද නිෂ්පාදනයට යටත් කිරීම සඳහා වූ රාමුව සකස් කරන යුද නීති සම්මත කර ගනී. මේ අතර ෆින්ලන්තය න්‍යෂ්ටික ආයුධ තහනම අහෝසි කර ඇති අතර, රුසියාව සමඟ ඇති සිය කිලෝමීටර් 1,300 ක දේශසීමාව නේටෝ න්‍යෂ්ටික යෙදවීම් සඳහා විවෘත කර ඇත.

10. වර්තමාන යුද්ධයේ පුපුරා යාම හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් පෙර දුටු අතර, පසුගිය වසර 35 පුරා එහි ප්‍රකාශයන් අනාගතවක්තෘ ස්වරූපයක් ගනී. පළමු ගල්ෆ් යුද්ධයෙන් පසුව සහ ස්ටාලින්වාදී නිලධාරී තන්ත්‍රය සෝවියට් සංගමය විසුරුවා හැරීම සම්පූර්ණ කරද්දී, 1991 මැයි දින නිකුත් කරන ලද "අධිරාජ්‍යවාදී යුද්ධයට සහ යටත්විජිතවාදයට එරෙහි වනු!" ("Oppose Imperialist War and Colonialism!") යන එහි ප්‍රකාශනය මගින්, පූර්ව යටත් විජිත රටවල් කොල්ලකෑම නැවත ආරම්භ කර ඇති බවට ජාත්‍යන්තර කමිටුව (ICFI) අනතුරු ඇඟවීය. 1990 අගෝස්තු තරම් ඈත දී, ඉරාකයට එරෙහි පළමු යුද්ධය ආසන්නයේදී ජාත්‍යන්තර කමිටුව (ICFI) මෙසේ පැහැදිලි කළේය: "එය ලෝකය නැවත බෙදා වෙන් කිරීමේ අලුත් අධිරාජ්‍යවාදී ආරම්භය සලකුණු කරයි. පශ්චාත් යුද සමයේ අවසානය යනු පශ්චාත් යටත් විජිත සමයේ අවසානයයි... ඉරාකයට එරෙහි සිය දරුණු ප්‍රහාරයේදී, දෙවන ලෝක යුද්ධයට පෙර පැවති පසුගාමී රටවල් මත වූ අසීමිත ආධිපත්‍යය නැවත පිහිටුවීමට අදහස් කරන බවට අධිරාජ්‍යවාදය දැනුම් දෙයි."

11. ඉන් පසුව සිදු වූ සියල්ල—ඉරාකය, යුගෝස්ලාවියාව, ඇෆ්ගනිස්ථානය, ලිබියාව, සිරියාව, යේමනය සහ යුක්‍රේනය තුළ පැවැති නොනිමෙන යුද්ධ—මෙම විග්‍රහය තහවුරු කර ඇත. *A Quarter Century of War* (2016) *(ශතවර්ෂ කාලක් පුරා යුද්ධය)* හි පූර්විකාවේ David North ලියූ පරිදි: "එක්සත් ජනපදය විසින් මෙහෙයවන ලද පසුගිය සියවසෙන් හතරෙන් පංගුවක යුද්ධ අධ්‍යයනය කළ යුත්තේ එකිනෙකට සම්බන්ධ වූ සිදුවීම් මාලාවක් ලෙසය. ගෝලීය ආධිපත්‍යය සඳහා වන එක්සත් ජනපදයේ මූලෝපායික තර්කනය මැද පෙරදිග සහ අප්‍රිකාවේ නව යටත් විජිත මෙහෙයුම්වලින් ඔබ්බට යයි. දැනට පවතින කලාපීය යුද්ධ යනු රුසියාව සහ චීනය සමඟ එක්සත් ජනපදයේ වේගයෙන් උග්‍ර වන ගැටුමේ සංඝටක මූලාංග වේ.

12. මෙම සෑම යුද්ධයක්ම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදය විසඳනවා වෙනුවට එය තවත් උග්‍ර කළේය. 2003 මාර්තු

මාසයේදී ඉරාක ආක්‍රමණය ආරම්භයේදී නෝර්ත් ලියූ පරිදි: “ඇමරිකානු අධිරාජ්‍යවාදයට විනාශය සමඟ සම්මුඛ වීමක් යෙදී ඇත. එයට ලෝකය ජය ගත නොහැක. මැද පෙරදිග මහජනතාව කෙරෙහි නැවත යටත් විජිත විලංගු දැමීමට එයට නොහැක. යුද්ධය නමැති මාධ්‍යය හරහා එහි අභ්‍යන්තර රෝගවලට සාර්ථක විසඳුමක් සොයා ගැනීමට එයට නොහැකි වනු ඇත. ඒ වෙනුවට, යුද්ධය මගින් ඇති කරන ලද නොසිතූ දුෂ්කරතා සහ වර්ධනය වන ප්‍රතිරෝධය ඇමරිකානු සමාජයේ සියලුම අභ්‍යන්තර පරස්පරතාවයන් උග්‍ර කරනු ඇත.” ඉරානය ඊට වෙනස් නොවන බව ඔප්පු කරනු ඇත.

13. වසර තිස්පහක නොනිමෙන යුද්ධයට ඇමරිකානු ධනපති ක්‍රමයේ ආර්ථික පිරිහීම ආපසු හැරවීමට නොහැකි වී ඇත. එක්සත් ජනපද වෙළඳ හිඟය වාර්තාගත මට්ටමක පවතී—එය එක් වසරක් තුළ භාණ්ඩවලින් ඩොලර් ට්‍රිලියන 1.2 කි—සහ මුළු එක්සත් ජනපද රජයේ ණය ඩොලර් ට්‍රිලියන 40 කට ආසන්න වෙමින් පවතින අතර, එය දරා ගෙන යනු ලබන්නේ ඩොලරය [සංචිත මුදල් ඒකක ලෙස] තබා ගැනීමට ලෝකය දක්වන කැමැත්ත මගින් පමණි. කඩදාසි ලබා දී පෘථිවියේ සම්පත් මත ආධිපත්‍යය දැරීමට එක්සත් ජනපදයට ඉඩ සලසන ලෝක සංචිත විනිමය ලෙස ඩොලරය ලෝකයේ දරණ ස්ථානය, විවෘත අර්බුදයකට ලක්ව ඇත. නමුත් ඇමරිකානු අධිරාජ්‍යවාදය ලෝක මට්ටමේ තම ස්ථානය පල්ලම් බැසීම පිළිගන්නේ නැත. සෑම යුද්ධයකම පරාජයට මුහුණ දෙන විට, එය පසුබැසීමෙන් නොව, පෘථිවිය මත මානව ජීවිතය විනාශ කිරීමේ තර්ජනය එල්ල කරන න්‍යෂ්ටික යුද්ධය දක්වා වන වඩාත් විශාල [මිලිටරි] උග්‍ර කිරීම් වලින් ප්‍රතිචාර දක්වයි.

14. අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි අරගලය කම්කරු පන්තිය තුළ මුල් බැස ගත යුතු අතර එය සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී වැඩපිළිවෙලක් මත පදනම් විය යුතුය. 2016 පෙබරවාරි මාසයේ ජාත්‍යන්තර කමිටුවේ සමාජවාදය සහ යුද්ධයට එරෙහි අරගලය (*Socialism and the Fight Against War*) ප්‍රකාශනය මගින් පිහිටුවන ලද මූලධර්ම මෙම සම්මේලනය නැවත තහවුරු කරයි: යුද්ධයට එරෙහි අරගලය “සමාජයේ මහා විප්ලවවාදී බලවේගය වන කම්කරු පන්තිය මත පදනම් විය යුතු අතර, ජනගහනයේ සියලු ප්‍රගතිශීලී කොටස් ඒ වටා එක්සත් කළ යුතුය”; අලුත් යුද විරෝධී ව්‍යාපාරය “ධනපති විරෝධී සහ සමාජවාදී විය යුතුය”, “ධනපති පන්තියේ සියලුම දේශපාලන පක්ෂ සහ සංවිධානවලින් සම්පූර්ණයෙන්ම සහ අනිවාර්යයෙන්ම ස්වාධීන විය යුතු අතර ඒවාට සතුරු විය යුතුය”, එමෙන්ම, “සියල්ලටම වඩා, අධිරාජ්‍යවාදයට එරෙහි එක්සත් ගෝලීය අරගලයකදී කම්කරු පන්තියේ දැවැන්ත බලය බලමුලු ගන්වන ආකාරයෙන් ජාත්‍යන්තර විය යුතුය.”

15. **එහි මූලයන් දෙස බලන කල, අධිරාජ්‍යවාදී යුද්ධය යනු ධනපති ක්‍රමයේම පවතින අත්‍යවශ්‍ය විෂයබද්ධ පරස්පරතා දෙකෙහි ප්‍රතිඵලය සහ ප්‍රකාශනයයි: පළමුවැන්න, නිෂ්පාදන මාධ්‍යවල පෞද්ගලික අයිතිය සහ නිෂ්පාදනයේ සාමාජීය ස්වභාවය අතර පවතින පරස්පරතාවයයි; දෙවැන්න, ආර්ථික නිෂ්පාදනයේ ගෝලීය ස්වභාවය සහ දේශපාලන බලය හා ප්‍රාග්ධනය ඒකරාශී වීම තවමත් සංවිධානය වන ජාතික-රාජ්‍ය පද්ධතිය අතර පවතින පරස්පරතාවයයි.** අධිරාජ්‍යවාදී යුද්ධයේ පුපුරා යාම සහ ජාත්‍යන්තර පන්ති අරගලයේ පුපුරා යාම එකම අර්බුදයක නිෂ්පාදනයන් වන අතර, දැනට පවතින යුද්ධය විප්ලවවාදී පිපිරීම් සූදානම් කරමින් සිටී.

16. **සමාජවාදී සමානතා පක්ෂය (SEP) අධිරාජ්‍යවාදී ආක්‍රමණයේ සෑම ක්‍රියාවකටම විරුද්ධ වන අතර, එය පවතින රාජ්‍යයන්ගෙන් ස්වාධීනව සහ ඒවාට එරෙහිව සිදු කරයි.** අධිරාජ්‍යවාදී ප්‍රහාරයට එරෙහිව තමන්ව ආරක්ෂා කර ගැනීමට ඉරාන ජනතාවට සහ ආක්‍රමණයේ අනෙකුත් ඉලක්කයන්ට ඇති අයිතිය එය ආරක්ෂා කරයි. **රුසියාව සහ චීනය අධිරාජ්‍යවාදී බලවතුන් ලෙස හැඳින්වීම එය ප්‍රතික්ෂේප කරයි—එය එක්සත් ජනපද යුද සැලසුම්වල ප්‍රධාන ඉලක්කයන් හරහා විදේශ ප්‍රතිපත්ති අරමුණු සුජාත කිරීම සඳහා ව්‍යාජ-වාම දේශපාලන ප්‍රවණතා විසින් භාවිතා කරන නාමකරණයකි.** නමුත් සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්තිගරුක ස්ථාවරයන්, ඒවාට ප්‍රගතිශීලී ස්වරූපයක් ආරෝපණය කිරීමක් තියා මොස්කව් සහ බීජිං රෙජීමයන්ට සහාය දැක්වීමක් වත් සමඟ කිසිදු පොදු බවක් නැත.

17. **පුටින් රෙජීමය යනු ස්ටාලින්වාදී නිලධාරී තන්ත්‍රය විසින් සෝවියට් සංගමය විසුරුවා හැරීම සහ රාජ්‍ය දේපළ කොල්ලකෑම තුළින් නැගී ආ ධනපති කතිපයාධිකාරයේ දේශපාලන මෙවලමයි — එම නිලධාරී තන්ත්‍රය යනු 2026 මැයි දින ආරම්භක වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, “ඔක්තෝබර් විප්ලවයේ මිනීවළ හාරන්නන් ලෙස ආරම්භ වී, අද වන විට පුටින් විසින් මෙහෙයවනු ලබන නව රුසියානු කතිපයාධිකාරයේ වඩාත්ම දූෂිත සහ කෑදර කල්ලිය ලෙස කෙළවර වූ” නිලධාරී තන්ත්‍රයයි.** එය මිලිටරිමය උග්‍ර කිරීම්, අධිරාජ්‍යවාදී බලවතුන් සමඟ එකඟතාවලට පැමිණීමේ ආයාචනා සමඟ ඒකාබද්ධ කරන

අතර, එහි මහා රුසියානු ජාතිකවාදය (Great Russian nationalism) විසින් රුසියානු කම්කරු පන්තිය යුක්රේන කම්කරු පන්තියෙන් වෙන් කරනු ලබයි. **බීජිං රෙජීමය ඔවුන්ගේ පැත්තෙන්, "සමාජවාදය" නාමයෙන් ධනවාදය නැවත පිහිටුවීම සහ ලෝකයේ විශාලතම කම්කරු පන්තිය සූරාකෑම සම්බන්ධයෙන් මුලසුන හොබවන අතර, එය අධිරාජ්‍යවාදයට බිය වනවාට වඩා බෙහෙවින් වැඩි ලෙස සිය කම්කරු පන්තියට බිය වේ.**

18. **සමාජවාදී සමානතා පක්ෂය, ශාස්ත්‍රලික සහ ව්‍යාජ-වම්මුන්ගේ න්‍යායධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන "බහු-ධ්‍රැවීයතා" ("multipolarity") න්‍යාය ද එක ලෙසම ප්‍රතික්ෂේප කරයි.** එම න්‍යායට අනුව, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ "ඒක-ධ්‍රැවීය" ("unipolar") අධිපත්‍යය, ගෝලීය සම්පත් වඩාත් සාමකාමී ලෙස බෙදා ගැනීම සඳහා සුසංයෝගීව මුලසුන හොබවන ධනපති රාජ්‍යයන්ගේ සාමූහිකයක් මගින් ආදේශ කළ හැකිය. **ගෝලීය ආර්ථිකය සහ ධනපති ජාතික-රාජ්‍ය පද්ධතිය අතර පවතින පරස්පර විරෝධය ඒල්ල වන්නේ සාකච්ඡා මාර්ගයෙන් ඇති කරගන්නා සමතුලිතතාවයකට නොව, යුද්ධයටයි. "බහු-ධ්‍රැවීයතා" න්‍යායේ පදනම වන්නේ, ධනපති රාජ්‍යයන්ට එරෙහිව කම්කරු පන්තිය බලමුලු ගැන්වීම වෙනුවට, එකිනෙකා හා ගැටෙන ධනපති රාජ්‍යයන් අතර තුලනය කිරීමට දරන උත්සාහය සහ ධනවාදයට එරෙහි අරගලයට දක්වන විරෝධයයි.**

19. එබැවින් අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි සටන ජාත්‍යන්තර සහ පන්ති මූලෝපායක් සමග බද්ධ විය යුතුය. ට්‍රොට්ස්කි යුද්ධය සහ හතරවන ජාත්‍යන්තරය (*War and the Fourth International*) කෘතියේ ලියූ පරිදි, අප **"ගමන් කරන්නේ යුද සිතියම ඔස්සේ නොව පන්ති අරගලයේ සිතියම ඔස්සේය."** මෙම පදනමේ සිට බලන කල, යුද්ධයේ වැදගත්ම ප්‍රතිඵලය වන්නේ ඇමරිකා එක්සත් ජනපදය සහ සෑම අධිරාජ්‍යවාදී රටක් තුළම සමාජ ආතතීන් දැඩි වීමයි. පක්ෂය 2003 දී පූර්ව අපේක්ෂා කළ පරිදි, යුද්ධය විසින් ඇමරිකානු සමාජයේ සියලු අභ්‍යන්තර පරස්පර විරෝධයන් තීව්‍ර කරමින් පවතින අතර—යුද්ධය නැවැත්වීමට සමත් බලවේගය මතුවෙමින් පවතින්නේ ද මෙම පරස්පර විරෝධයන් තුළිනි.

20. අධිරාජ්‍යවාදී යුද්ධය යනු එකම විට කම්කරු පන්තියට එරෙහි යුද්ධයකි. **ලෝක යුද්ධයකට අවශ්‍ය කරන සම්පත්, ජනගහනය සැබවින්ම වහල්භාවයට පත් කිරීමකින් තොරව සමාජයෙන් සූරා ගත නොහැක:** එනම් සමාජ සුභසාධන වැඩසටහන් විනාශ කිරීම, වේතන පහත හෙළීම, ශ්‍රමය හමුදාකරණය කිරීම සහ මෙම පියවරයන් මගින් උසිගන්වනු ලබන විරෝධතාවන් මර්දනය කිරීම සඳහා ආඥාදායකත්වයක් පිහිටුවීමයි. **යුද්ධය යනු කතිපයාධිකාරයේ විදේශ ප්‍රතිපත්තිය වන අතර, කතිපයාධිකාරය ඊට වන්දි ගෙවීමට සලස්වන්නේ කම්කරු පන්තිය ලවාය**—එනම් පහත වැටෙන ජීවන තත්වයන්ගෙන්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විනාශ කිරීමෙන් සහ රුධිරයෙනි. **ආඥාදායකත්වයට එරෙහි සටන සහ යුද්ධයට එරෙහි සටන යනු එකම සතුරෙකුට එරෙහිව කෙරෙන එකම සටනකි.**

21. **සමාජවාදී සමතා පක්ෂය, ධනපති ක්‍රමයට එරෙහි අරගලයෙන් වෙන් වූවක් සහ වෙනස් වූවක් ලෙස "යුද විරෝධී ප්‍රතිපත්තියක්" ඉදිරිපත් කරන්නේ නැත. එහි මූලෝපාය, අධිරාජ්‍යවාදී ආණ්ඩුවල හෘද සාක්ෂියට ආයාචනා කරන විරෝධතා ව්‍යාපාර සමග හෝ කම්කරු පන්තිය ධනපති පංතියේ එක් හෝ තවත් කල්ලියකට යටත් කරන මහජන පෙරමුණු (popular fronts) සමග හෝ කිසිදු පොදු බවක් නැත. යුද්ධයට එරෙහි සටන යනු කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා කෙරෙන සටනකි. එය, කම්කරු පන්තියේ විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා පක්ෂය ගෙන යන අරගලයේ වඩාත්ම සාන්ද්‍රගත ප්‍රකාශනයයි.**

22. **අධිරාජ්‍යවාදී පද්ධතිය තුළ සාකච්ඡා කර ලබාගත හැකි සාමයක් නොමැත,** එමෙන්ම යුද්ධයට එරෙහිව ආයාචනයක් යොමු කළ හැකි පාලක පන්තියේ කිසිදු කල්ලියක්—ඩිමොක්‍රටික් හෝ රිපබ්ලිකන්, යුරෝපීය හෝ ඇමරිකානු—නැත. යුද්ධය අවසන් කරනු ලබන්නේ අධිරාජ්‍යවාදයේ රාජ්‍ය තාන්ත්‍රිකයින් විසින් නොව, එය නැවැත්වීමේ බලය සහ වෛෂයයික උනන්දුව සහිත එකම සමාජ බලවේගය වන ජාත්‍යන්තර කම්කරු පන්තිය විසිනි.

23. ඉරානයට එරෙහි සියලුම ඇමරිකානු සහ ඊශ්‍රායල හමුදා මෙහෙයුම් වහාම සහ කොන්දේසි විරහිතව අත්හිටුවන ලෙසත්, නාවික අවහිරය ඉවත් කරන ලෙසත්; ගාසා හි ජන සංහාරය නැවැත්වීමටත්; මැද පෙරදිගින් සහ ලතින් ඇමරිකාවෙන් සියලුම ඇමරිකානු හමුදා ඉවත් කර ගන්නා ලෙස හා නිකොලස් මදුරෝ (Nicolás Maduro) නිදහස් කරන ලෙසත්; කියුබාවට එරෙහි සම්බාධක අවසන් කරන ලෙසත්; රුසියාවට එරෙහි යුද්ධය අවසන් කරන ලෙසත් සහ චීනයට එරෙහිව

 ISSN 3093-6217

ගොඩනගමින් පවතින ලෝක යුද යන්ත්‍රණය විසුරුවා හරින ලෙසත් SEP බලකර සිටියි. අනිවාර්ය හමුදා සේවය නැවත හඳුන්වා දීමට, තෝරාගත් සේවාව (Selective Service) සඳහා ස්වයංක්‍රීය ලියාපදිංචිය ස්ථාපිත කිරීමට, සහ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ යුද්ධයන්හිදී මරා දැමීමට සහ මිය යාමට ඇමරිකානු තරුණයින් බලහත්කාරයෙන් යෙදවීමට දරන සියලු උත්සාහයන්ට එය විරුද්ධ වෙයි.

24. සමාජවාදී සමානතා පක්ෂය, යුක්‍රේනයේ බොග්ඩන් සිරොටියුක් (Bogdan Syrotiuk) වහාම සහ කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස කෙරෙන ඉල්ලීම ද නැවත අලුත් කරයි. 2024 අප්‍රේල් මාසයේදී යුක්‍රේන රහස් ඔත්තු සේවය විසින් අත්අඩංගුවට ගන්නා ලද ඔහු, ඔහුගේ සමාජවාදී සහ යුද විරෝධී ක්‍රියාකාරකම් වෙනුවෙන් වසර පහළොවේ සිට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලැබිය හැකි “දේශද්‍රෝහී” චෝදනාවලට මුහුණ දෙයි. ප්‍රමුඛ යුක්‍රේන අපරාධ විද්‍යාඥයෙකුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවක් මගින් මෙම නඩුව දේශපාලන කුමන්ත්‍රණයක් ලෙස හෙළිදරව් කිරීමෙන් පසුව පවා සෙලෙන්ස්කි පාලන තන්ත්‍රය ඔහුව නිදහස් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. ඔහුව මර්දනය කිරීම මගින් පාලන තන්ත්‍රයේ සැබෑ ස්වභාවය හෙළිදරව් කරයි: එනම් අධිරාජ්‍යවාදී බලවතුන් ප්‍රකාශ කරන පරිදි ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයෙකු නොව, යුද්ධයට එරෙහි සියලුම සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී විරුද්ධවාදිකම් තහනම් කරන පොලිස් රාජ්‍යයක් බවයි.

25. දැනට පවතින ආණ්ඩුවලට කරනු ලබන ආයාචනාවලින් මෙම ඉල්ලීම් කිසිවක් ඉටු කරගත නොහැක. ඒවා අරගලයේ වැඩපිළිවෙළ තුළ අන්තර්ගත වන ඒවා වන අතර, ඒ වෙනුවෙන් කෙරෙන සටන කම්කරු පන්තිය ධනපති රාජ්‍යය සමග සෘජු ගැටුමකට මෙහෙයවා, බලය පිළිබඳ ප්‍රශ්නය මතු කරයි.

26. අධිරාජ්‍යවාදයට එරෙහිව සියලු රටවල කම්කරුවන්ගේ එක්සත්කම වෙනුවෙන් සටන් කිරීමටත්; යුද්ධයට එරෙහි සටන ජාත්‍යන්තර කම්කරු පන්තියේ වර්ධනය වන වර්ජන ව්‍යාපාරය සහ එහි දේශපාලන ස්වාධීනත්වය සඳහා වන සටන සමග සම්බන්ධ කිරීමටත්; ලෝක සමාජවාදී විප්ලවයේ වැඩපිළිවෙළ මත කම්කරු පන්තියේ ජාත්‍යන්තර යුද විරෝධී ව්‍යාපාරය ගොඩනැගීමටත් මෙම සම්මේලනය තීන්දු කරයි. සියවසකට වඩා වැඩි කාලයකට පෙර, පළමු ලෝක යුද්ධයේ මිනිස් ඝාතන මධ්‍යයේ, රෝසා ලක්සම්බර්ග් (Rosa Luxemburg) අනතුරු ඇඟවූයේ මානව වර්ගයා විකල්පයකට මුහුණ දී සිටින බවයි: එනම් සමාජවාදය ද නැතහොත් ම්ලේච්ඡත්වය ද යන්නයි. ම්ලේච්ඡත්වය තවදුරටත් අනතුරු ඇඟවීමක් නොව වර්තමාන යථාර්ථයකි. එය මානව සංස්කෘතිය ගිල ගන්නේද, නැතහොත් ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් පෙරළා දමනු ලබන්නේද යන්න **තීරණය වන්නේ විප්ලවවාදී නායකත්වයේ අර්බුදය විසඳීම මගිනි.** එබැවින් මෙම සම්මේලනය, අන් සියල්ලටමත් වඩා, කම්කරු පන්තියේ විප්ලවවාදී නායකත්වය ලෙස සමාජවාදී සමානතා පක්ෂය සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීමට තීන්දු කරයි—එනම් අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි සටන ලෝක සමාජවාදී විප්ලවය බවට පත්කරවන පක්ෂයයි. [අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි]

**ගාසාවේ ජන සංහාරය නවතනු!**

**යුක්‍රේනය තුළ අධිරාජ්‍යවාදී යුද්ධය එපා!**

**කියුබාවට එරෙහි අධිරාජ්‍යවාදී වටකිරීම නවතනු!**

**ඉරානයට එරෙහි ඇමරිකානු-ඉශ්‍රායල ආක්‍රමණයට එරෙහි වනු!**

**IMF කප්පාදු එපා!**

**යුද්ධයට එරෙහිව හතරවන ජාත්‍යන්තරය ගොඩනගනු!**



 ISSN 3093-6217

# සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාරයෙන් වසර 25 ක්



**පැට්‍රික් මාටින්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* සැප්තැම්බර් *11* දින "**25 years since the September 11 terrorist attacks**" යන හිසින් පළවූ පැට්‍රික් මාටින් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනයයි.

එක්සත් ජනපදය තුළ පුද්ගලයින් 3,000 කට ආසන්න සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත් කරමින්, 2001 සැප්තැම්බර් 11 වන දින එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයට අදට වසර 25 ක් සපිරේ. පුද්ගලයින් 19 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් — ඔවුන්ගෙන් 15 දෙනෙකුම සෞදි අරාබියේ වැසියන් විය — ගුවන් යානා හතරක් පැහැරගෙන, ඉන් දෙකක් නිව් යෝර්ක් නගරයේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (World Trade Center) නිවුන් කුළුණු වෙත ද, එකක් පෙන්ටගනය වෙත ද, අනෙක මගීන් ඔවුන්ට එරෙහිව සටන් කිරීමෙන් පසු පෙන්සිල්වේනියා හි එළිමහන් භූමියකට ද කඩා වදින ලෙස පියාසර කළහ. මෙය සිවිල් යුද්ධයෙන් පසුව ඇමරිකාවේ එකම දිනකදී සිදුවූ විශාලතම ප්‍රචණ්ඩකාරී මරණ සංඛ්‍යාව විය.

2001 සැප්තැම්බර් 12 වන දින, ලෝක සමාජවාදී වෙබ් අඩවිය නිවේදනයක් නිකුත් කරමින් මෙසේ ප්‍රකාශ කළේය:

"ලෝක සමාජවාදී වෙබ් අඩවිය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයට සහ පෙන්ටගනයට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර කිසි සැකයකින් තොරව හෙළා දකියි. මගී ගුවන් යානා හතරක් පැහැරගෙන ඒවා පියාසර කරන බෝම්බ බවට පත්කිරීමට වගකිවයුත්තන්, සමූහ ඝාතනයකට වරදකරුවෝ වෙති. මිනිස් ජීවිත මෙලෙස මිලේච්ඡ ලෙස සහ ඉවක් බවක් නැතිව විනාශ කිරීම මත පදනම්ව කිසිදු සාමාජික ප්‍රගතිශීලී අරමුණක් ඉටුකර ගත නොහැක.

"මෙම මිනීමරු ත්‍රස්ත ක්‍රියාවන්ගෙන් පිළිඹිබු වන්නේ, අධෛර්යමත් වූ අශුභවාදය, ආගමික සහ අන්ත-ජාතිකවාදී අන්ධකාරවාදය *(obscurantism)* මෙන්ම, අතිශයින්ම නින්දිත දේශපාලන අවස්ථාවාදයේ විෂ සහිත සංයෝගයකි. ත්‍රස්තවාදී සංවිධාන — ඔවුන්ගේ ඇමරිකානු විරෝධී ප්‍රකාශ *(anti-American rhetoric)* මොනවා වුවත් — තම උපායමාර්ග පදනම් කරගන්නේ, භයානක හදිසි ප්‍රචණ්ඩ ක්‍රියා මගින් ඇමරිකානු පාලක පන්තියේ ප්‍රතිපත්ති වෙනස් කිරීමට බලකළ හැකිය යන මිත්‍යාව මතය. ඒ

අනුව, අවසාන විග්‍රහයේදී ඔවුන් බලාපොරොත්තු වන්නේ වොෂින්ටනය සමඟ ගනුදෙනුවකට එළඹීමටය.

**“තමන්ව සාධාරණීකරණය කිරීමට කෙතරම් උත්සාහ කළද, ත්‍රස්තවාදී ක්‍රමවේදය මූලික වශයෙන්ම ප්‍රතිගාමී වේ. අධිරාජ්‍යවාදී මිලිටරිවාදයට ප්‍රබල පහරක් එල්ල කිරීම කෙසේ වෙතත්, ත්‍රස්තවාදය විසින් සිදුකරන්නේ, පාලක ප්‍රභූ පැළැන්තියේ භූ-දේශපාලනික සහ ආර්ථික වුවමනාවන් වෙනුවෙන් යුද්ධය සාධාරණීකරණය කිරීමට සහ සුජාත කිරීමට මෙවැනි සිදුවීම් භාවිත කරන ඇමරිකානු ආයතන පද්ධතිය *(US establishment)* තුළ සිටින පාර්ශවයන්ගේ හස්තයන් ශක්තිමත් කිරීමයි. අහිංසක සිවිල් වැසියන් ඝාතනය කිරීම මගින් මහජනතාව කෝපයට, අස්ථානගත කිරීමට හා ව්‍යාකූලත්වයට ලක්වේ. එය කම්කරු පන්තියේ ජාත්‍යන්තර එක්සත්කම උදෙසා කෙරෙන අරගලයට හානි පමුණුවන අතර, මැද පෙරදිග වර්තමාන සිදුවීම්වලට පදනම් වූ ඉතිහාසය සහ දේශපාලනය පිළිබඳව ඇමරිකානු ජනතාව දැනුවත් කිරීමට දරන සියලු උත්සාහයන් අඩපණ කරයි.”**

ඉන්පසු සිදු වූ සියලුම සිදුවීම් මගින් මෙම විග්‍රහය තහවුරු විය. වෙනත් බොහෝ ලේඛන සමඟ මෙම ප්‍රකාශය ද, 9/11 ප්‍රහාරය, එහි මූලාරම්භය සහ ප්‍රතිඵල පිළිබඳ WSWS වාර්තාවල <u>විශේෂ ප්‍රදර්ශනයට</u> ඇතුළත් කර ඇත.

මෙම ප්‍රහාරය රටේ ඉතිහාසයේ එක්සත් ජනපද බුද්ධි අංශවල විශාලතම “අසාර්ථකත්වය” ලෙස වහාම විස්තර කරන ලදී. එහෙත් මාධ්‍ය හරහා අතිවිශාල ප්‍රචාරයක් ලබා දීම, 9/11 කොමිෂන් සභාව මගින් සිදුකළ පරීක්ෂණ සහ ගණනය කළ නොහැකි තරම් වූ කොංග්‍රස් මණ්ඩල සභා විමර්ශන පැවැත්වීම නොතකා, මෙම අපරාධය සංවිධානය කිරීම පිළිබඳව එදා දැන සිටි ප්‍රමාණයට වඩා වැඩි යමක් අද වන විටත් ඇමරිකානු ජනතාව දන්නේ නැත.

ඊට අමතරව, මෙම ව්‍යසනය සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුවත් රැකියාවෙන් පහ කිරීම, නිලයෙන් පහත හෙලීම හෝ කිසිදු අයුරකින් වගකිවයුතු හෝ වගවිය යුතු අයෙකු බවට පත් කිරීම සිදු කර නොමැත. 1941 දෙසැම්බර් 7 වන දින පර්ල් හාබර් (Pearl Harbor) වෙත ජපන් ප්‍රහාරය එල්ල වීමෙන් පසුව, නාවික හමුදා අද්මිරාල්වරුන් සහ පහළ ශ්‍රේණිවල නිලධාරීන් කිහිප දෙනෙකුටම තමුන්ගේ රැකියා අහිමි විය. සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් පසුව එවැනි කිසිවක් සිදු වූයේ නැත.

ඒ වෙනුවට, බුද්ධි අංශවලට “තොරතුරු එකිනෙක සම්බන්ධ කර ගැනීමට (connect the dots)” නොහැකි වූ බවට ප්‍රකාශ කරමින්, අඛණ්ඩ සහ ක්‍රමානුකූල වසන් කිරීමක් සිදුවිය. මෙම යෙදුම පැහැදිලි කළ නොහැකි කරුණු පැහැදිලි කිරීම සඳහා වූ සර්වකාර්ය සාධක නිදහසට කරුණක් බවට පත් විය. එක්සත් ජනපද ආරක්ෂක ආයතන විසින් ප්‍රසිද්ධ අල්-කයිඩා ක්‍රියාකාරීන්ට රට තුළට ඇතුළු වීමටත්, මගී ජෙට් යානා පියාසර කිරීමට ඔවුන් පුහුණුව ලැබූ ගුවන් පියාසර පාසල්වලට ඇතුළත් වීමටත්, එකම උදෑසනක බොස්ටන් සහ වොෂින්ටන් ඩී.සී. වෙතින් පිටත්ව ගිය ගුවන් යානා හතරකට ගොඩ වූ සිව්දෙනෙකුගෙන් හෝ පස්දෙනෙකුගෙන් යුත් සන්නද්ධ කණ්ඩායම් සංවිධානය කිරීමටත් ඉඩ හරින ලදී.

<u>ප්‍රදර්ශනයට</u> එකතු කර ඇති ලිපි දුසිම් ගණනකින් WSWS පැහැදිලි කළ පරිදි, සිද්ධිය පිළිබඳ නිල ප්‍රකාශය චේතනාන්විත ආරක්ෂාව ලිහිල් කිරීමකට සුදුහුණු ගෑම සඳහා කළ එකකි. සම්පූර්ණයෙන්ම ප්‍රසිද්ධ මූලාශ්‍ර පදනම් කරගනිමින් ලිපි හතරකින් යුත් විශ්ලේෂණයක් ඉදිරිපත් කරමින් 2002 ජනවාරි මාසයේදී WSWS මෙසේ ලියා සිටියේය: “එදින සිදුවීම් පිළිබඳ අවම පිළිගත හැකි සහ අවම විශ්වාසනීය පැහැදිලි කිරීම වන්නේ, ගුවන් යානා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සහ පෙන්ටගනයේ වදින තෙක්ම එක්සත් ජනපදයේ දැවැන්ත ජාතික ආරක්ෂක යාන්ත්‍රණය ගුවන් යානා පැහැරගත් අයගේ ක්‍රියාකාරකම් පිළිබඳව සම්පූර්ණයෙන්ම නොදැන සිටියේය යන්නයි.”

එල්ල වීමට නියමිත ත්‍රස්ත ප්‍රහාර පිළිබඳව අනතුරු ඇඟවීම් ගණනාවක් තිබූ අතර, ගුවන් යානා පැහැරගැනීමේ අනතුර පිළිබඳව 2001 අගෝස්තු මාසයේදී ජනාධිපති ජෝර්ජ් ඩබ්. බුෂ් වෙත ලබා දුන් සුප්‍රකට තොරතුරු දැනුම්දීම ද ඊට ඇතුළත් විය.

එක්සත් ජනපද ආරක්ෂක සේවාවන්ට යානා පැහැරගත් අය කිහිප දෙනෙකු වෙත සෘජුවම ප්‍රවේශ වීමේ හැකියාව තිබුණි. ඔවුන්ගෙන් දෙදෙනෙකු වූ නවාෆ් අල්-හස්මි (Nawaf al-Hazmi) සහ ඛාලිඩ් අල්-මිහ්දාර් (Khalid al-Mihdhar), සැන් ඩියේගෝ (San Diego) හි එෆ්බීඅයි තොරතුරුකරුවෙකුගේ නිවසේ ලැගුම්ගෙන සිටියහ. ප්‍රධාන සංවිධායකයා වූ මොහොමඩ් අටා (Mohamed Atta), 2001 ජනවාරි මාසයේදී සංචාරක වීසා බලපත්‍රයකින් මියාමි (Miami) වෙතින් නැවත එක්සත් ජනපදයට ඇතුළු වූ අතර, තමා ෆ්ලෝරිඩා ගුවන් පියාසර පාසලක පුහුණුව ලබන බව ආගමන විගමන පරීක්ෂකවරුන්ට පැවසීය — එය ඔහුගේ ඇතුළුවීමේ කොන්දේසිවලට සෘජුවම පටහැනි විය. ඔහුව ද්විතීයික පරීක්ෂාවකට යොමු කළ අතර, කෙසේ

වෙතත් ඇතුළුවීමට ඉඩ දෙන ලදී. ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ උතුරු කුළුණ වෙත ඇමරිකන් එයාර්ලයින්ස් 767 යානයක් පදවාගෙන යාමට හැකි වන පරිදි ඔහු නැවතත් තම පුහුණුවට එක්විය.

අල්-කයිඩා සංවිධානය එක්සත් ජනපද බුද්ධි අංශ හොඳින් දැන සිටි එකකි. එහි නිර්මාතෘ, සෞදි අරාබි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කෝටිපතියෙකු වූ ඔසාමා බින් ලාඩන්, 1979 සෝවියට් ආක්‍රමණය ප්‍රකෝප කිරීම සඳහා ඇෆ්ගනිස්ථානයේ සෝවියට් විරෝධී නො-නිල මිලිටරි බලකායක් ගොඩනැගීමේ උත්සාහයේ කොටසක් ලෙස ඇමරිකානු සීඅයිඒ සංවිධානය විසින් මූල්‍යනය කරනු ලැබීය. ඩිමොක්‍රටික් පක්ෂ ජනාධිපති ජිමී කාටර්ගේ ජාතික ආරක්ෂක උපදේශක ස්බිග්නිව් බ්‍රෙසින්ස්කිගේ (Zbigniew Brzezinski) වචනවලින් කිවහොත්, එහි අරමුණ වූයේ “සෝවියට් සංගමයට එහි ‘වියට්නාමය’ ලබා දීමයි.” බින් ලාඩන් සිය ඇමරිකානු අනුග්‍රාහකයන්ට එරෙහිව හැරුණේ, 1990-91 පර්සියානු ගල්ෆ් යුද්ධයේදී එක්සත් ජනපදය විසින් 700,000 ක සෙබළුන් පිරිසක් – ඉන් වැඩි පිරිසක් සෞදි අරාබියේ රඳවා සිටි – බලමුලු ගැන්වීමෙන් පසුව පමණී.

තවමත් පැහැදිලි නොකළ කුමන්ත්‍රණයේ නිශ්චිත අංග මොනවා වුවද, ප්‍රහාරවල සැබෑ දේශපාලන වැදගත්කම වන්නේ ඇමරිකානු රජයේ විදේශීය මෙන්ම දේශීය ප්‍රතිපත්තියේ ද එය තීරණාත්මක හැරවුම් ලක්ෂයක් බවට පත්වූ ආකාරයයි. “ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය (war on terror)” යන්න පෙර නොවූ විරූ අයුරේ ජාත්‍යන්තර ආක්‍රමණශීලීත්වයේ සහ දේශීය මර්දනයේ ව්‍යාපාරයක් සඳහා වූ සර්වකාර්ය සාධක (කෝකටත් තෛලය) නිදහසට කරුණ බවට පත් විය. මෙම ක්‍රියාමාර්ග දිගු කලක් තිස්සේ සූදානම් කර තිබූ – 9/11 මගින් සපයන ලද – සුදුසු නිදහසට කරුණක් ලැබෙන තෙක් පමණක් බලා සිටි ඒවා විය.

සති කිහිපයක් ඇතුළත, ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පක්ෂවල ඒකමතික ස්වභාවයේ සහයෝගය ඇතිව, 9/11 ප්‍රහාරයට වගකිවයුත්තන්ට එරෙහිව මිලිටරි බලය භාවිත කිරීමේ බලය පැවරීමේ පනත (Authorization for the Use of Military Force – AUMF) කොංග්‍රස් මණ්ඩලය විසින් සම්මත කරන ලදී. ඔසාමා බින් ලාඩන්ගේ ප්‍රධාන කඳවුර පිහිටා තිබූ ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීමේ පදනම ලෙස බුෂ් පරිපාලනය විසින් එය ප්‍රථමයෙන් යොදා ගන්නා ලදී. කෙසේ වෙතත්, ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පරිපාලනයන් විසින්, පාකිස්ථානයේ සිට සිරියාව , ලිබියාව සහ උතුරු අප්‍රිකාව පුරා ඩ්‍රෝන ප්‍රහාර සහ විශේෂ බලකා ප්‍රහාර ඇතුළුව අවම වශයෙන් රටවල් 22 ක තවදුරටත් හමුදා මෙහෙයුම් සඳහා වූ පදනම ලෙස AUMF නැවත නැවතත් යොදා ගන්නා ලදී. බින් ලාඩන් ඝාතනය කර වසර 15 කට පසුවත් එය අදටත් බලාත්මකව පවතී. මේ අතර, වොෂින්ටනයේ ප්‍රතිපත්තියට ගැලපෙන විට, අල්-කයිඩා සංවිධානයට පැහැදිලිවම සම්බන්ධ සිරියානු පාලන තන්ත්‍රයක්, එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්ති ඉලක්කවලට සේවය කිරීමට එකඟ වන විට මිත්‍රයෙකු ලෙස සාදරයෙන් පිළිගනු ලැබේ.

ඉරාක යුද්ධය සඳහා නීතිමය පදනම වෙනම AUMF එකක් වූ අතර, දෙවන යුද යෝජනාව ලබා ගැනීමේ එක් පදනමක් ලෙස බුෂ් පරිපාලනය සදාම් හුසේන් සහ අල්-කයිඩා අතර නොපවතින සම්බන්ධතාවයක් (සැබවින්ම ඔවුන් තදබල සතුරන් විය) උපුටා දැක්වීය. අනෙක් බොරුව වූයේ ඉරාකය සතුව “මහා විනාශකාරී ආයුධ (weapons of mass destruction)” ඇති බවත්, එක්සත් ජනපදයට එරෙහිව භාවිත කිරීම සඳහා අල්-කයිඩාවට පරමාණුක බෝම්බයක් සැපයිය හැකි බවත්ය. ඉරාකය එක්සත් ජනපදයට තර්ජනයක් බවට සාක්ෂි අවශ්‍ය බව ප්‍රතික්ෂේප කරමින් බුෂ්ගේ ජාතික ආරක්ෂක උපදේශක කොන්ඩොලීසා රයිස් (Condoleezza Rice) 2002 දී ප්‍රකාශ කළ පරිදි: “දුම් පිටවන තුවක්කුව (smoking gun) හතු පිපෙන ආකාරයේ පරමාණුක වලාකුළක් (mushroom cloud) වෙනවාට අප කැමති නැත.”




දේශීය වශයෙන්, 9/11 හි බලපෑම සමහර විට ඊටත් වඩා විශාල විය. දැවැන්ත මට්ටමේ අභ්‍යන්තර හමුදා-පොලිස් ක්‍රියාමාර්ග සමඟ රට යුද තත්ත්වයකට පත් කරන ලදී. කොංග්‍රස් මණ්ඩලය විසින් පේට්‍රියට් පනත (Patriot Act) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී 357 ට 66 ක් ලෙසද, සෙනෙට් මණ්ඩලයේදී 98 ට එකක් ලෙසද සම්මත කරන ලදී.

නියෝජිතායතන 22 ක් ඒකාබද්ධ කරමින් සහ ට්‍රම්ප්ගේ පොලිස්-රාජ්‍ය

මෙහෙයුම්වල පෙරමුණ බවට පත්ව ඇති අලුතින් පිහිටුවන ලද ආගමන සහ රේගු බලාත්මක කිරීමේ ඒකකය (Immigration and Customs Enforcement – ICE) ඇතුළත් කරමින්, මාතෘභූමි ආරක්ෂක දෙපාර්තමේන්තුව (Department of Homeland Security) නමැති අලුත් ෆෙඩරල් දෙපාර්තමේන්තුවක් සාදන ලදී. ලොව පුරා පිහිටි රහසිගත සීඅයිඒ (CIA) බන්ධනාගාරවල මෙන්ම කියුබාවේ ගුවන්තනාමෝ බේ (Guantanamo Bay) හි පිහිටි එක්සත් ජනපද නාවික හමුදා කඳවුරේ ප්‍රධාන රැඳවුම් මධ්‍යස්ථානයේ ද වධහිංසා පැමිණවීම සම්මත පුරුද්දක් බවට පත් විය. “නවත් 9/11 ක්” වැළැක්වීමේ නාමයෙන් සිරකරුවන්ට වතුරෙන් වධදීමේ (waterboarding- හිස පහතට සිටිනසේ ලෑල්ලක සිරුර ගැට ගසා නාසය සහ කටට වතුර වත් කරමින් ගිලෙන සෙයක් දැනීමට සැලැස්වීම) ක්‍රමය සාධාරණීකරණය කරමින් අධිකරණ දෙපාර්තමේන්තුවේ (Justice Department) සටහන් නිකුත් විය.

ඩිමොක්‍රටික් පක්ෂය “ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ” පූර්ණ පාර්ශ්වකරුවෙකු වූ අතර, බුෂ්ගේ යුද්ධ සඳහා අරමුදල් සැපයීමට නැවත නැවතත් ඡන්දය දුන් අතර, පසුව එක්සත් ජනපද-නැටෝ ලිබියානු බෝම්බ හෙලීම සහ සිරියාවේ සහ යේමනයේ එක්සත් ජනපද අනුග්‍රහය ලත් යුද්ධ ආරම්භ කළ ඔබාමා යටතේ ඒවා පවත්වාගෙන යමින් තවදුරටත් පුළුල් කළේය. නීතිමය ක්‍රියාපටිපාටියකින් තොරව එක්සත් ජනපද පුරවැසියන් ඇතුළු පුද්ගලයන් ඩ්‍රෝන මිසයිල මගින් ඝාතනය කිරීම සඳහා නීතිමය පදනම සකස් කළේ ද, එක්සත් ජනපද යුද අපරාධ සහ නීති විරෝධී මහජන පිළිබඳ ඔත්තු බැලීම හෙළිදරව් කළ චෙල්සී මැනින්ග් (Chelsea Manning) සහ එඩ්වඩ් ස්නෝඩන් (Edward Snowden) වැනි ධෛර්ය සම්පන්න තොරතුරු හෙළිදරව් කරන්නන්ට (whistleblowers) හිංසා පීඩා කිරීමට පෙරමුණ ගත්තේ ද ඔබාමාගේ නීතිපති එරික් හෝල්ඩර් (Eric Holder) විසිනි.

සංගත (සමාගම්) මාධ්‍ය ජාත්‍යන්තර නීතියට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එල්ල වූ ප්‍රහාරවල උද්‍යෝගිමත් අනුගාමිකයන් විය. ඩිමොක්‍රටික් පක්ෂ ලිබරල්වාදයේ ප්‍රධාන ප්‍රකාශකයා වූ නිව් යෝර්ක් ටයිම්ස් පෙරමුණ ගනිමින්, මාධ්‍ය ස්වාධීනත්වයේ සෑම අංශුවක්ම අතහැර දමන ලදී.

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ භූමිකාව කෝපරේට් මාධ්‍යවල යටත්වීමට වඩාත්ම තියුණු ලෙස වෙනස් විය. **ප්‍රහාර එල්ල වූ දින සිටම, WSWS ඒවා ප්‍රතිගාමී මහා ඝාතන ක්‍රියා ලෙස හෙළා දුටු අතර, දීර්ඝ කාලයක් තිස්සේ සැලසුම් කරන ලද මිලිටරි ප්‍රහාර සහ දේශීය වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විනාශ කිරීම සඳහා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් ඒවා යොදා ගනු ඇතැයි අනතුරු ඇඟවීය.**

මාධ්‍ය සහ රජය එකතු වී සිදු කළ වසන් කිරීම් හමුවේ වුවද මතුවූ සියලු සාක්ෂි අපි ප්‍රවේශමෙන් විශ්ලේෂණය කළ අතර, ඩිමොක්‍රටිකයන් සහ රෙපබ්ලිකානුවන් යන දෙපිරිසම වැළඳගත් යුද්ධයේ සහ මර්දනයේ වැඩපිළිවෙලට එරෙහිව කම්කරු පන්තිය බලමුලු ගැන්වීමට සටන් කළෙමු. අල්-කයිඩා මහා ඝාතනය අගය කළ සුළු-ධනපති වමේ (petty-bourgeois left) කොටස්වල ජනප්‍රියවාදී ප්‍රකාශ (demagogy) අපි ප්‍රතික්ෂේප කළ අතර, ප්‍රහාරයෙන් දින දහයකට පසු, “ව්‍යාජ සමාජවාදයේ එක් ආකාරයක්, එනම් නරුමයන්ගේ සහ මෝඩයන්ගේ ව්‍යාජ ‘අධිරාජ්‍යවාදී විරෝධය’” ගැන ලියා තැබුවෙමු.

මිලිටරි ආක්‍රමණ, මහා පරිමාණ රඳවා තබා ගැනීම් සහ වධහිංසා පැමිණවීම් සාධාරණීකරණය කිරීමට සැප්තැම්බර් 11 ප්‍රහාරය යොදාගත් ලිබරල් විද්වතුන්ගේ සහ බුද්ධිමතුන්ගේ යටත්වීම අපි හෙළිදරව් කළෙමු. “අප සටන් කරන්නේ කුමක් සඳහාද (What We’re Fighting For)” ප්‍රකාශනයට අත්සන් තැබූ මහාචාර්යවරුන් හැට දෙනා ගැන WSWS මෙසේ ලිවේය: “මෙහි අඩංගු වන්නේ නොදැනුවත්කම හෝ අහිංසකකම නොවෙයි, වංකභාවය සහ නරුමත්වයයි.”

9/11 සිට ගෙවී ගිය වසර 25 බොරු ප්‍රචාරණය අපකීර්තියට පත් කර ඇති අතර ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගැඹුරු වන අර්බුදය පෙන්නුම් කර ඇත. ඇෆ්ගනිස්ථාන යුද්ධය විනාශයකින් කෙළවර වූ අතර, තලිබාන් (Taliban) සංවිධානය නැවත බලයට පැමිණීමෙන් අවසන් වූ වසර 20 ක ගැටුමකදී ඇෆ්ගන් ජාතිකයන් 100,000 කට වැඩි පිරිසක් මෙන්ම ඇමරිකානුවන් 6,000 ක් ද මිය ගියහ. ඉරාක යුද්ධය ඊටත් වඩා විශාල ලේ වැගිරීමක් වූ අතර, ඇමරිකානුවන් 7,000 කට අමතරව ඉරාක ජාතිකයින් මිලියන 1 ක් පමණ මිය ගියහ. එක්සත් ජනපදය දැන් ඉරානය සමඟ යුද්ධයක නියැලී සිටින අතර, ප්‍රහාරකයන්ගෙන් බහුතරයක් සැපයූ සහ ඔවුන්ගෙන් සමහරෙකුට මූල්‍යමය වශයෙන් පවා ආධාර කළ සෞදි අරාබිය, වොෂින්ටනය සමඟ ඊටත් වඩා සමීප සබඳතා පවත්වාගෙන යයි.

9/11 සඳහා එහි ප්‍රතිචාරය මගින් ඇමරිකානු පාලක පන්තිය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ කිසිදු සහයෝගයක් නොමැති බව හෙළි විය. එතැන් සිට, අභ්‍යන්තර පොලිස් බලතල දැඩි කිරීම — නිරීක්ෂණය/ඔත්තු බැලීම, පොලිස් ඝාතන, මහා පරිමාණ රඳවා තබා ගැනීම් — පිම්මේ වර්ධනය වී ඇත. එවැනි තවත් ප්‍රහාරයක් සිදුවුවහොත් — නැතහොත් හිට්ලර්ගේ රයිච්ස්ටැග් ගින්න (Reichstag fire) ආකෘතියෙන් වේදිකාගත කළහොත් — ධනපති රාජ්‍යයේ ප්‍රතිචාරය ඊටත් වඩා පාලනයකින් තොර වනු ඇත. වීදිවල හමුදාව යෙදවීම, මහා පරිමාණ අත්අඩංගුවට ගැනීම් සහ පූර්ණ පරිමාණයේ පොලිස්-රාජ්‍ය ක්‍රමවේද ක්‍රියාත්මක වනු ඇත.

නමුත් කම්කරු පන්තිය ද තිත්ත පාඩම් ඉගෙන ගෙන ඇත. බුෂ්, ඔබාමා, ට්‍රම්ප්, බයිඩන් සහ දැන් නැවතත් ට්‍රම්ප් විසින් ගෙනයනු ලබන “නිමක් නැති යුද්ධ (forever wars)” සඳහා කිසිදු සහයෝගයක් නැත. මිලිටරි-බුද්ධි යාන්ත්‍රණයේ සහ එහි මාධ්‍ය

ප්‍රකාශකයන්ගේ යුද හිතකාමී ප්‍රචාරයන් සැලකිය යුතු ලෙස ගන්නේ ස්වල්ප දෙනෙකි. පොලිසිය විසින් ජෝර්ජ් ෆ්ලොයිඩ් (George Floyd) ඝාතනය කිරීම 2020 දී දැවැන්ත මහජන විරෝධතාවලට හේතු විය. නැවත පිහිටුවන ලද ට්‍රම්ප් පරිපාලනය, “රජවරු එපා (No Kings)” විරෝධතාවලදී, එක්සත් ජනපද ඉතිහාසයේ විශාලතම විපක්ෂ විරෝධතාවලට මුහුණ දී ඇත. කම්කරුවන් වැඩි වැඩියෙන් පන්ති සටන් ක්‍රම වෙත යොමු වෙමින් සිටින අතර, එහිදී ඔවුන්ට වහාම වෘත්තීය සමිති යාන්ත්‍රණයේ විරෝධයට මුහුණ දීමට සිදු වේ.

දැන් පවතින කාර්යය වන්නේ ගෙවී ගිය සියවසෙන් කාලයක — සහ ඊට වැඩි කාලයක — දේශපාලන පාඩම් උකහා ගැනීම සහ ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් යන දෙපිරිසම ඇතුළත් මහා සමාගම් පක්ෂවලින් දේශපාලනිකව වෙන්වීම මත පදනම්ව, විප්ලවවාදී සමාජවාදී වැඩපිළිවෙලක් ඉදිරියට ගනිමින් ධනපති ක්‍රමයට එරෙහිව කම්කරු පන්තියේ බලවත් මහා ව්‍යාපාරයක් ගොඩනැගීමයි.

සැප්තැම්බර් 11, එහි මූලාරම්භය සහ එහි ප්‍රතිවිපාක පිළිබඳ ලෝක සමාජවාදී වෙබ් අඩවියේවාර්තා එකතු කර ඇති, මෙම ප්‍රකාශනය සමඟ ඇති ප්‍රදර්ශනය අධ්‍යයනය කරන ලෙස අපි සියලුම පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම මෙරිං බුක්ස් (Mehring Books) වෙතින් ලබාගත හැකි, 1990 පර්සියානු ගල්ෆ් කලාපයෙන් ආරම්භ වූ යුද ව්‍යාපාරය තුළ මෙම ප්‍රහාර පිහිටුවා විග්‍රහ කරන ඩේවිඩ් නොර්ත්ගේ ශතවර්ෂ කාලක් පුරා යුද්ධ: ගෝලීය අධිපත්‍යය සඳහා එක්සත් ජනපදයේ තල්ලුව 1990-2016 (David North’s *A Quarter Century of War: The US Drive for Global Hegemony 1990-2016*) ග්‍රන්ථය මිලදී ගන්නා ලෙස ද අපි පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු.

[අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි]

## සෞදි අරාබියේදී මරණ දඬුවම නියම වූ ශ්‍රී ලාංකික කම්කරු සිවරාසා අනෝජන්ගේ මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම වහා නවත්වනු:

## විදේශ විනිමය ප්‍රේශණය සඳහා තමන්ගේම කම්කරුවන් අපනයනය කරන රාජ්‍යය පසුව ඔවුන්ව ගහලයාට අතහැර දමයි

**ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ** (Socialist Lead of Sri Lanka and South Asia) ප්‍රකාශය.

මෙම ප්‍රකාශය ඉංග්‍රීසි බසින් 2026 සැප්තැම්බර් 21 දින theSocialist.LK වෙබ් අඩවියේ පළ කෙරුණි.

කල්මුණේ, නට්පිට්ටිමුනෙයි හි දෙමළ විදේශගත කම්කරුවෙකු සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකු වන සිවරාසා අනෝජන් (Sivarasa Anojan) මේ වන විට සෞදි අරාබියේදී මරණ දඬුවම ලබා සිටී. අල්-අහ්සා (Al-Ahsa) හි අභියාචනාධිකරණයක් මගින් ඔහුට මෙසේ මරණ දඬුවම නියම කර ඇත්තේ කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් නිසා නොව, මුද්‍රාහැර විනාඩි කිහිපයක් ඇතුළත ඉවත් කර ප්‍රසිද්ධියේ සමාව අයැදීමක්ද ද ඉදිරිපත් කරන ලදැයි පැවසෙන ෆේස්බුක් සටහනක් වෙනුවෙනි. ඔහුගේ නඩුව වසර පහක සිරදඬුවමක සිට මරණීය දණ්ඩනය දක්වා වර්ධනය වීමට, ඔහුව ආරක්ෂා කිරීමට වගකීම ඇති බව කියන එම ආයතනයම, එනම් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයම, සෑම පියවරකදීම පහසුකම් සපයා ඇත. ශ්‍රී ලංකා රාජ්‍යය සහ විදේශ විනිමය මූලාශ්‍රයක් ලෙස විදේශයන් වෙත අපනයනය කරනු ලබන වැඩකරන ජනතාව අතර පවතින සබඳතාව මෙම සිද්ධිය මගින් අතිශය දරුණු පැහැදිලිභාවයකින් හෙළිදරව් කරයි.

අනෝජන් ජූලි 28 වන දින චෝදනා දෙකකට වරදකරු කරනු ලැබීය: ඒ සෞදි අරාබියේ සයිබර් විරෝධී අපරාධ පනතේ (Anti-Cyber Crime Law) 6 වැනි වගන්තිය යටතේ වූ සයිබර් අපරාධ චෝදනාවක් සහ මුහම්මද් නබිනායකතුමාට අපහාස කිරීමේ ෂරියා (Sharia) වරදක් යන කරුණු දෙකයි. මහාධිකරණය (lower court) විසින් ඔහුට වසර පහක සිරදඬුවමක් සහ සෞදි රියාල් මිලියන තුනක — එනම් විදේශගත ශ්‍රමිකයෙකුට ඇදහිය නොහැකි මුදලක් වන ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් 800,000 ක — දඩයක් නියම කරන ලදී. රජයේ පැමිණිලිකරු (public prosecutor) විසින් දේවඅපහාස චෝදනාව (blasphemy) සඳහා වඩාත් දැඩි, අධිකරණයේ විවේචනාත්මක විචක්ෂණභාවය මත පදනම් වූ ‘තඃසීර්’ (ta’zir) දඬුවමක් ඉල්ලා සිටි නමුත්, නඩු විභාග කළ විනිසුරුවරුන් එය පැනවීම ප්‍රතික්ෂේප කළහ.

ශ්‍රී ලංකා රාජ්‍යය මැදිහත් වූයේ මෙන්න මේ මොහොතේදීය — ඒ විනාශකාරී ප්‍රතිඵල ගෙනදෙමිනි. ‘ජැෆ්නා මොනිටර්’ (Jaffna Monitor) සඟරාව මගින් නිරීක්ෂණය කරන ලද ලේඛනවලට අනුව, රියාද් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින්ම සාර්ථක වීමේ හැකියාව “අතිශයින්ම අඩු” බවට නීති උපදෙස් ලබාගෙන තිබියදී පවා, විදේශ කටයුතු අමාත්‍යාංශය අභියාචනයක් ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීය. සෞදි නීති පටිපාටිය යටතේ, අභියාචනයක් මගින් දඬුවම



සිවරාසා අනෝජන්. ඡායාරූපය: 'ජැෆ්නා මොනිටර්' (Jaffna Monitor) අනුග්‍රහයෙන්

වැඩි කිරීමට හැකි බවට — එනම් සිරදඬුවමක් මරණ දඬුවම දක්වා ඉහළ නැංවීම ඇතුළුව — අනෝජන්ගේ පවුලට කිසිදු අනතුරු ඇඟවීමක් වාර්තා කර නොතිබුණි. මෙම අභියාචනය සම්පූර්ණයෙන්ම ගොඩනඟා තිබුණේ සයිබර් අපරාධ චෝදනාවේ ව්‍යවස්ථාපිත උපරිම සීමාව පදනම් කරගෙන වන අතර, හන්බාලි නීති ක්ෂේත්‍රය (Hanbali school of jurisprudence) යටතේ ඉහළ සීමාවක් නොමැති දේවඅපහාස චෝදනාවට එම සීමාව අදාළ නොවීය. දඬුවම අධිකද යන්න පිළිබඳ ප්‍රශ්නය නැවත විවෘත කිරීම මගින්, පැමිණිලිකරු ඉල්ලා සිටි සහ නඩු විභාග කළ අධිකරණය ප්‍රතික්ෂේප කළ දැඩි දඬුවම ද ඇතුළුව, මුළු දඬුවමම නැවතත් සලකා බැලීමට අවස්ථාවක් උදාවීම මෙම අභියාචනය හේතු විය.

බ්‍රහස්පතින්දා, අභියාචනාධිකරණය විසින් සිරදඬුවම අහෝසි කර මරණ දඬුවම පනවන ලදී.

**දඬුවම් ලැබූවන්ගෙන් අය කරන අමාත්‍යාංශයක්**

ශ්‍රී ලංකා රාජ්‍යය විසින් මෙම පවුලට සැලකූ ආකාරය කම්කරු පන්තිය කෙරෙහි පවතින නිලධාරීවාදී අවඥාවට නිදසුනකි. අනෝජන්ගේ පියා රුපියල් 1,890,766 ක මුදලක් — එනම් ඇමෙරිකානු ඩොලර් 6,300 ක් පමණ — විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන නිල ගිණුමකට කෙලින්ම තැන්පත් කර තිබූ අතර, තැන්පතු පත්‍රිකාවේ සටහන් කර තිබුණේ "අනෝජන් නඩුව" ලෙස පමණි. අමාත්‍යාංශය විසින් අභියාචනයේ පිටපතක් පියා වෙත යවා ඇත්තේ එය ගොනු කර සති තුනකටත් වඩා වැඩි කාලයකට පසුව සහ නඩුවේ තීන්දුව දීමට මෙපිට එක් දිනකට පෙරය — ඒ වන විට එහි කිසිවක් වෙනස් කිරීමට හැකියාවක් නොතිබුණි. නඩු විභාගයට සැබවින්ම පෙනී සිටි නීතිඥවරයාගේ නම පවුලේ අයට කිසි විටෙකත් පවසා නොතිබුණි. තවද ඔවුන් මරණ දඬුවම ගැන දැනගත්තේ තමන්ගේ රජයෙන් නොව, නඩු විභාගයෙන් පසුව ගෙදරට දුරකථන ඇමතුමක් ගැනීමට අවසර ලැබුණු අනෝජන්ගෙන්ම ය.

ඕමානයේ රැකියා අහිමි වන විදේශගත කම්කරුවන් ආරක්ෂා කිරීම ප්‍රතික්ෂේප කරන්නේද මෙම රාජ්‍යයමය. ලෝක සමාජවාදී වෙබ් අඩවිය (World Socialist Web Site – WSWS) වාර්තා කළ පරිදි, 2024 ජනවාරි මාසයේදී, රැකියාවලින් දොට්ට දමන ලද ශ්‍රී ලාංකික කම්කරුවන් පිරිසක් මස්කට් (Muscat) හි පිහිටි තානාපති කාර්යාලය ඉදිරිපිට රැස්වී තමන්ව ආපසු රටට ගෙනියන ලෙස රජයෙන් ඉල්ලා සිටි විට, තානාපති කාර්යාලය ඊට ප්‍රතිචාර දැක්වූයේ ඔවුන් සංචාරක වීසා මත පැමිණ ඇති බැවින් ඔවුන් ගැන කිසිදු "වගකීමක්" දැරිය නොහැකි බව ප්‍රකාශ කරමින්, දඩ මුදල් ගෙවා රටින් පිටවන ලෙස උපදෙස් දෙමිනි. කාන්තාවන් 30 දෙනෙකු ඇතුළුව කම්කරුවන් 80 දෙනෙකු පමණ ඕමාන් පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලද අතර, කාන්තාවන් ආරක්ෂා කිරීම සඳහා යැයි කියමින් පිහිටුවා තිබූ තානාපති කාර්යාලයේ "ආරක්ෂිත නිවස" (safe house) ද අසරණ වූවන්ට වසා දමන ලදී. අතරමං වූ කම්කරුවන්ට වැසිකිළි හෝ සෞඛ්‍ය පහසුකම් නොමැතිව, දහවල අධික රස්නයටත් රාත්‍රියට අධික ශීතලටත් මුහුණ දෙමින්, මහා මාර්ගයක් අසල පදික වේදිකාවේ කාඩ්බෝඩ් මත නිදා ගැනීමට සිදු වූ අතර, ඔවුන් ජීවත් වූයේ සෙසු කම්කරුවන්ගේ පරිත්‍යාගයන්ගෙනි. ඔවුන් විරෝධතාවල නිරත වූ විට, යකඩ පොලු අතැති කල්ලි ඔවුන්ට ප්‍රහාර එල්ල කර කාන්තාවන් බලහත්කාරයෙන් ඇදගෙන යාමට උත්සාහ කළ අතර, එම ප්‍රහාරවලට තානාපති කාර්යාලයේ සහාය ලැබුණු බව කම්කරුවෝ පැවසූහ.

එම අත්හැර දැමීම සිදුවූයේ රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව යටතේය; අනෝජන්ගේ ජීවිතය දැන් අනුර කුමාර දිසානායකගේ ජේවීපී/එන්පීපී (JVP/NPP) ආණ්ඩුව යටතේ දැඩි අවදානමකට ලක්ව තිබේ. මෙම ආණ්ඩුවද උරුම කරගෙන ඇත්තේ එම රාජ්‍ය යන්ත්‍රණයම, විදේශ ප්‍රේෂණ ආදායම මත පවතින එම පරායත්තතාවයම සහ තමන් විදේශයන්ට යවන කම්කරුවන් කෙරෙහි දක්වන එම අවඥාවමය. ආණ්ඩුවේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය යනු අත්හැර දැමීමට ප්‍රතිපක්ෂ දෙයක් නොව, එය සිදුකරන යාන්ත්‍රණයයි. පාලන තන්ත්‍රයේ දේශපාලන පාට වෙනස් වුවද, විදේශගත කම්කරුවාට දක්වන සැලකිල්ල වෙනස් නොවේ — මන්ද්‍රයත්, මෙය වෙන් වෙන් ඇමතිවරුන් පිළිබඳ ප්‍රශ්නයක් නොව, විදේශයන්හි සිටින සිය පුරවැසියන්ගේ ශ්‍රමය මත යැපෙමින්, ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරගැනීම උදෙසා එම ප්‍රේෂණ

ආදායමෙන් රුපියලක්වත් වියදම් කිරීම ප්‍රතික්ෂේප කරන රාජ්‍යයක් පිළිබඳ කාරණාවක් වන බැවිනි.

### සෞදි පාලන තන්ත්‍රයේ ප්‍රතිගාමී ස්වභාවය

මෙම මරණ දඬුවම හුදෙක් අසාමාන්‍ය සිදුවීමක් නොව, සෞදි රාජ්‍යයේ ස්වභාවයේම ප්‍රකාශනයකි — ඒ වූකලී, එහි නීති පද්ධතිය මධ්‍යකාලීන ෂරියා නීති අධිකාරය (Sharia jurisprudence) බනිජ තෙල් කතිපයාධිකාරයක මර්දනය සමඟ ඒකාබද්ධ කරන වැඩවසම්-ධනපති රාජාණ්ඩුවකි. සෞදි අරාබිය, ඕමානය, ජෝර්දානය (Jordan) සහ අනෙකුත් ගල්ෆ් (Gulf) රාජ්‍යයන්හි, ශ්‍රී ලාංකික කම්කරුවෝ — විශේෂයෙන්ම ගෘහ සේවිකාවන් ලෙස සේවය කරන කාන්තාවෝ — නූතන වහල් ශ්‍රමයට සමාන තත්ත්වයන්ට මුහුණ දෙති. ‘කෆාලා’ පද්ධතිය (kafala system) මගින් විදේශගත කම්කරුවන්ව, ඔවුන්ගේ පදිංචිය පාලනය කරන සහ කිසිදු දඬුවමකින් තොරව වේතන සහ විදේශ ගමන් බලපත්‍ර රඳවා තබාගැනීමට බලය ඇති අයිතිකරුවන්ට බැඳ තබයි. විදේශීය කම්කරුවන් කෙරෙහි එම පාලන තන්ත්‍රයේ ම්ලේච්ඡත්වය මැනවින් ලේඛනගත කර ඇත: එය 2007 දී ශ්‍රී ලාංකික කම්කරුවන් හතර දෙනෙකුගේ හිස ගසා දැමූ අතර, 2013 දී ජාත්‍යන්තර වශයෙන් අනුකම්පාව ඉල්ලා සිටියදී පවා රිසානා නෆීක් (Rizana Nafeek) නැමැති තරුණ ගෘහ සේවිකාව මරා දමන ලදී. 2014 සිට 2025 දක්වා දස වසරක කාලය තුළ, මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ සඳහා මරණ දඬුවම ක්‍රියාත්මක කරන ලද සමස්ත පුද්ගලයන්ගෙන් හතරෙන් තුනක්ම විදේශිකයන් බව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය (ජාත්‍යන්තර ක්ෂමා ආයතනය) ලේඛනගත කර ඇත.

අනෝජන්ගේ නඩුව තුළ තවත් නිශ්චිත භීෂණයක් ගැබ්ව පවතී. නබිනායකතුමාට අපහාස කිරීම “පොදු අයිතිවාසිකමක්” (al-haqq al-amm) ලෙස නඩු පවරනු ලබන බැවින්, සමාව දීමට හෝ ලේ වන්දි (blood money) භාර ගැනීමට පුද්ගලික වින්දිතයෙකු හෝ පවුලක් නොමැත — ගල්ෆ් කලාපයේ මරණ දඬුවමට මුහුණ දෙන පුරවැසියන් රජයන් විසින් මීට පෙර බේරාගත් මාර්ගය එයයි. නියෝගය අත්හිටුවිය හැක්කේ රාජකීය නියෝගයකින් සෞදි රජුට පමණි. දේශපාලන සංස්ථාපිතයේ ප්‍රතිචාරය — එනම් ජනාධිපති දිසානායක වෙත පෙත්සම් ඉදිරිපත් කිරීම සහ සෞදි රාජාණ්ඩුවෙන් “අනුකම්පාව” ඉල්ලා සිටීම — නිරර්ථක සහ ස්වයං-රැවටීම් සහිත ක්‍රියාවකි. එයින් සිදුවන්නේ මෙම දඬුවම නිර්මාණය කළ පද්ධතියෙන්ම අනුකම්පාව අයැදීමයි.

### අනෝජන්ගේ නඩුව ශ්‍රී ලංකා රාජ්‍යය හෙළිදරව් කරයි

මෙම නඩුව මගින් ශ්‍රී ලංකා රාජ්‍යයේ සමස්ත සංක්‍රමණික ප්‍රතිපත්තියේ හදවතෙහි ඇති බොරුව හෙළිදරව් කරයි. **සිංහල ආධිපත්‍යය සහිත රාජ්‍යය විසින් දෙමළ ජනතාවට එරෙහිව ගෙන ගිය වසර තිහකට ආසන්න සිවිල් යුද්ධයෙන් පීඩාවට පත්, මෙරට වඩාත්ම දිළිඳු සහ කොන් වූවන් අතර වන යුද්ධයෙන් බැට කෑ උතුරු සහ නැගෙනහිර පළාත්වල කම්කරුවෝ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු වැඩපිළිවෙළ (austerity) හරහා රට තුළ පනවා ඇති ආර්ථික විනාශය නිසා විදේශගත වීමට තල්ලු කරනු ලැබෙති. ඒ, ඔවුන්ගේ ශ්‍රමය දැඩි ලෙස සූරාකනු ලබන සහ ඔවුන්ගේ ජීවිත නීතිමය වශයෙන් කිසිදු වටිනාකමක් නැති ගල්ෆ් රාජාණ්ඩුවක බලප්‍රදේශයට විකුණනු ලැබීමට පමණි.** ඔවුන්ගේ ප්‍රේෂණයන්ගෙන් ලාභ ලබන එම රජයම, අකාර්යක්ෂම නීතිමය නියෝජනයක් වෙනුවෙන් ඔවුන්ගේ පවුල්වලින් මුදල් අය කර, අවදානම් සඟවා, ඔවුන්ව පෝරකයට අතහැර දමයි.

ශ්‍රී ලංකා රජයට, සෞදි රාජාණ්ඩුවට හෝ “ජාත්‍යන්තර ප්‍රජාවට” කෙරෙන කිසිදු ඉල්ලීමකට අනෝජන් හෝ ඔහු සිටින තත්ත්වයේ සිටින සිය දහස් සංඛ්‍යාත කම්කරුවන් බේරාගත නොහැක. මේවා ඔහුගේ මෙම අකරතැබ්බයට වගකිව යුතු බලවේගයන්ගෙන්ම කෙරෙන ඉල්ලීම්ය. ශ්‍රී ලංකා රජය මෙන්ම ගල්ෆ් රාජාණ්ඩු ද සංක්‍රමණික ශ්‍රමය සූරාකෑමේ මෙම පද්ධතියෙන් ලාභ ලබති. මෙය ගෝලීය ධනපති පර්යායේ නිෂ්පාදනයක් වන අතර, එහිදී දකුණු ආසියාවේ සහ අප්‍රිකාවේ දිළිඳු කම්කරුවන් ලාභ ශ්‍රමය ලෙස අපනයනය කරනු ලබන්නේ, ඔවුන්ගේ සමෘද්ධිය එම කම්කරුවන්ගේ ශ්‍රමය මත පදනම් වූ ගල්ෆ් කතිපයාධිකාරීන්ගේ යහපත උදෙසාය.

### අනෝජන්ගේ ජීවිතය බේරා ගැනීමට එකතු වනු!

ගෙවී යන සෑම දිනයක්ම සිවරාසා අනෝජන්ව වධකයාගේ කඩුව වෙත තවත් සමීප කරයි. පස්පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් හමුවේ අභියෝග කිරීම සඳහා ඇති කාලය සති කිහිපයකට සීමා වී ඇති අතර, එය නිහඬ රාජ්‍ය තාන්ත්‍රිකභාවය සඳහා නොව කම්කරු පන්තියේ උපරිම බලමුලු ගැන්වීමක් සඳහා භාවිත කළ යුතුය. පූර්ව නිදර්ශනය පවතී: සෙලෙන්ස්කි (Zelensky) පාලන තන්ත්‍රය විසින් සිරගත කරන ලද යුක්‍රේන සමාජවාදී බොග්දාන් සිරෝටියුක් (Bogdan Syrotiuk) නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය පෙන්නුම් කළේ, ලොව පුරා සිටින කම්කරුවන්, තරුණයින්, වරාය කම්කරුවන්, සිසුන් සහ විද්වතුන් එක් හඬක් නගන විට — එනම් තානාපති කාර්යාල සහ කොන්සිල කාර්යාල (consulates) ඉදිරිපිට ජාත්‍යන්තර පිකටින් මගින්, කර්මාන්තශාලා සහ කම්කරු ක්‍රියාකාරී කමිටු මගින් නිකුත් කරන ප්‍රකාශ මගින්, ප්‍රසිද්ධ රැස්වීම් සහ මෙම අයුක්තිය නොකඩවා ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම මගින් — තමන්ගේ ගොදුරු බවට පත්වූවන් අදෘශ්‍යමාන යැයි සිතන පාලක පන්තීන්ට තමන් සූරාකන පන්තියේ සංවිධානාත්මක බලය ගැන සලකා බැලීමට සිදුවන බවයි. අනෝජන් බේරා ගැනීම සඳහා දැන් අනුගමනය කළ යුත්තේ ද එම ක්‍රමයමය.

සෞදි අධිකරණය විසින් එම මරණ දඬුවම අහෝසි කර කොන්දේසි

විරහිතව අනෝජන් නිදහස් කර ආපසු නිවසට එවීම සඳහා බල කරන ලෙස ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (Socialist Lead of Sri Lanka and South Asia – SLAA) සහ theSocialist.LK වෙබ් අඩවිය සෑම කම්කරුවෙකුගෙන්ම සහ තරුණයෙකුගෙන්ම ඉල්ලා සිටියි. ඔහුව මරණයට කැපකළ අභියාචනය සඳහා ඔහුගේ පවුලෙන් රුපියල් මිලියන 1.89 ක් අය කළ විදේශ කටයුතු අමාත්‍යාංශයට හෝ ඔහුව මරණයට තීන්දු කළ රාජාණ්ඩුවෙන්ම අනුකම්පාව අයැදිමින් ඔහුගේ ඉරණම ගැන දැන් රඟපාන දේශපාලනඥයන්ට මෙය භාරදිය හැකි යැයි කිසිවෙකු නොරැවටිය යුතුය.

අවශ්‍ය වන්නේ සෞදි බලධාරීන් සහ ශ්‍රී ලංකා රජය බිය වන එකම බලවේගය වන කම්කරු පන්තිය හරහා පීඩනය එල්ල කිරීමය: එනම් ශ්‍රී ලංකාවේ, ගල්ෆ් කලාපයේ සහ මුළු ලෝකය පුරාම කම්කරු පන්තියේ මහජන බලමුලු ගැන්වීම හරහාය. විදේශගත කම්කරුවන් ආරක්ෂා කිරීමේ එකම බලවේගය වන්නේ කම්කරු පන්තියේම සංවිධානාත්මක බලයයි. තමන්ගේ මව් රටවල රජයන්ට සහ ගල්ෆ් පාලන තන්ත්‍රයන්ට එරෙහි අරගලයේදී ශ්‍රී ලාංකික, ඉන්දියානු, බංග්ලාදේශ, පිලිපීන, නයිජීරියානු සහ ගල්ෆ් කලාපයේ සිටින සියලුම සංක්‍රමණික කම්කරුවන්ගේ එක්සත්කම, මෙම මරණ දඬුවම් නැවැත්වීමට සහ අවසානයේ කම්කරුවන්ට විදේශයන්හි වහල්භාවයට තමන්ගේ ජීවිත විකුණා දැමීමට බලකරන සූරාකෑමේ පද්ධතිය අහෝසි කිරීමට අවශ්‍ය පූර්ව කොන්දේසියයි. අනෝජන්ගේ ජීවිතය බේරා ගැනීම සඳහා අප ජාත්‍යන්තර ව්‍යාපාරයක් — එනම් ධනපති ප්‍රභූන්ගේ නොව, පන්ති අරගලයේ ව්‍යාපාරයක් — ගොඩනැගිය යුතුය. ඔහුගේ ජීවිතය රඳා පවතින්නේ ඒ මත ය. එසේම, ඔවුන්ගේ ශ්‍රමය රාජ්‍යය විසින් විදේශ විනිමය වෙනුවෙන් ගල්ෆ් රාජාණ්ඩුවල තිරිසන්කමට අතහැර විකුණා දමා ඇති සෑම සංක්‍රමණික කම්කරුවෙකුගේම ආරක්ෂාව ද එසේ ඒ මතම රැඳී ඇත.

# LTTE අපරාධ සහ රාජ්‍ය යුද අපරාධ: අපගේ ආස්ථානය පිළිබඳ දේශපාලනික පැහැදිලි කිරීමක්

**සංජය** ජයසේකර විසිනි.

මෙම ලිපිය ඉංග්‍රීසි බසින් ***LTTE Crimes and State War Crimes: A Political Clarification on our Position*** යන සිරසින් *2025* සැප්තැම්බර් *5* දින *theSocialist.lk* හි පළ කෙරුණි.

සහෝදරවරුනි, හිතවතුනි,

උතුරු-නැගෙනහිර යුද්ධයේදී දකුණේ සිංහල රාජ්‍යයේ මිලිටරිය කරපු අපරාධ පමණක් අපි මතු කරනවා, නමුත් එල්.ටී.ටී.ඊ. (LTTE) එකේ වෙන වෙනම අපරාධ වාර්තා කරන්නේ නැහැ කියමින්, ඒ හරහා අපි LTTE එකට සහනශීලී වෙනවා කියලා ව්‍යාජ චෝදනා කරන බොරු සදාචාරවාදීන්ට සහ සිංහල වර්ගවාදී ආස්ථානයන්ට විරුද්ධව අපි කෙටියෙන් මෙසේ පැහැදිලි කරන්න ඕනේ.

LTTE ය සාහසික යුද අපරාධ කළා කියලා අපි කවුරුත් දන්නවා. අපි කොහෙවත් ඒවා ප්‍රතික්ෂේප කරලා නැහැ. ඒ අපරාධ කරන්න හේතු වුණු ප්‍රතිගාමී දේශපාලන වැඩපිළිවෙළ වගේම දෘෂ්ටිවාදයත්, ඒ අපරාධත් ප්‍රතික්ෂේප නොකරන්න අපිට කිසිම හේතුවක් නැහැ — අපි කිසිදු දේශපාලනික දෙපිටිකාට්ටු කමකින් තොරව, සම්පූර්ණයෙන්ම හා දේශපාලන කොන්දේසියකින් තොරව ඒවා ප්‍රතික්ෂේප කරනවා. LTTE එක විසින් සිංහල සිවිල් වැසියන්ට එල්ල කළ බෝම්බ ප්‍රහාර, 1987 දී අරන්තලාවේදී බාල වයස්කාර භික්ෂූන් ඇතුලු භික්ෂූන් තිස්තුන් දෙනෙකු ඝාතනය කිරීම, 1990 දී උතුරු පළාතෙන් මුස්ලිම් වැසියන් හැත්තෑපන්දහසක් වාර්ගික සුද්ද කිරීම (ethnic cleansing), දේශපාලන ප්‍රතිවාදීන් සහ වෘත්තීය සමිති නායකයින් ඝාතනය කිරීම, දෙමළ ළමුන් ළමා සෙබළුන් ලෙස පැහැරගැනීම, සහ දෙමළ සමාජය තුළ වූ සෑම ස්වාධීන සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයක්ම ම්ලේච්ඡ ලෙස මර්දනය කිරීම — මේ සියල්ල කම්කරු පන්තියට එරෙහිව සිදු කළ දේශපාලන අපරාධ. අපි කිසිදු පැකිළීමකින් තොරව ඒ සියල්ල හෙළා දකිනවා.

හැබැයි ඒ අපරාධ ලැයිස්තුගත කළාට විතරක් දේශපාලනිකව මොනවත් වෙන්නේ නැහැ. අපි දේශපාලන සංවිධානයක් — ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ කම්කරු පන්තියේ සමාජවාදී පූර්වගාමී නායකත්වය ලෙස ගොඩනගන ට්‍රොට්ස්කිවාදී දේශපාලන නායකත්වයක් මිසක්, මානව හිමිකම් වාර්තා සකසන NGO එකක් නෙවෙයි. අපගේ කාර්යභාරය වන්නේ අපරාධකාර කණ්ඩායම් දෙකක් අතර සදාචාරාත්මක සමානතාවක් පෙන්වීම නෙවෙයි. **අපගේ කාර්යභාරය වන්නේ මේ අපරාධවල පන්තිමය ස්වරූපය, ඒවායින් සේවය වුණේ කාටද, සහ කම්කරු පන්තිය ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන්න කම්කරු පන්තියට පැහැදිලි කර දීමයි.**

## LTTE භීෂණය මූලෝපායක්, පිස්සුවක් නොවේ

LTTE එක මේ සියලු අපරාධ කළේ නිශ්චිත දේශපාලන වැඩපිළිවෙළක් වෙනුවෙන්: එනම් දෙමළ ජාතික බෙදුම්වාදය — එනම්, දෙමළ ධනපති පන්තියට සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයට දෙමළ කම්කරු ශ්‍රමය සූරාකෑමට හැකි වෙනම අධිරාජ්‍යවාදී-ගැති ධනපති රාජ්‍යයක් පිහිටුවීම සඳහාය. මේ වැඩපිළිවෙළට තිබුණු ප්‍රධානම තර්ජනය ශ්‍රී ලංකා මිලිටරිය නෙවෙයි. ප්‍රධානම තර්ජනය වුණේ උතුරේ, නැගෙනහිර සහ කොළඹ ජීවත්වෙන දෙමළ කම්කරුවන් සහ

 ISSN 3093-6217




අතුරුදහන් වූවන්ගේ ජාත්‍යන්තර දිනය සලකුණු කරමින් පැවැත්වූ "යුක්තිය උදෙසා වූ දීර්ඝ මාවත" සම්මේලනයේ කොටසක් ලෙස, *2026* අගෝස්තු *30* වන දින යාපනයේදී පවත්වන ලද, උතුර සහ නැගෙනහිර අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද විරෝධතා රැලියකදී විරෝධතාකරුවෙකු විසින් චාරිත්‍රානුකූල පහනක් දල්වනු ලබයි. ඡායාරූපය කුමරන් කනාගෙනි.

පීඩිතයන්, පන්ති අරගලයේ පදනම මත ජාතික ප්‍රශ්නයට පොදු විසඳුමක් සොයාගැනීමට සිංහල කම්කරු පන්තිය සමඟ එකමුතු වීමේ හැකියාවයි. එකී එකමුතුව — එනම් සිංහල සහ දෙමළ කම්කරුවන් තමන්ගේ පොදු පන්ති සතුරාට එරෙහිව එකතු වීම — LTTE යට දේශපාලනිකව දරාගත නොහැකි වූ එකම වර්ධනය වුණා.

ඒ නිසා LTTE ය ක්‍රමානුකූලව කටයුතු කළේ එය වැළැක්වීමටයි. භේද කිරීම යනු ඔවුන්ගේ දේශපාලන ඔක්සිජන් වුණා. දෙමළ සහ සිංහල ජනතාව අතර බද්ධ වෛරයක් වැපිරීම ඔවුන්ගේ මූලෝපායේ අතුරු ඵලයක් නෙවෙයි — එය එහි මූලිකම කොටස වුණා. LTTE එක කවමදාවත් සිංහල කම්කරුවන්ට පන්තිමය ආමන්ත්‍රණයක් නොකළේ මෙන්න මේ නිසයි. සිංහල ජාතිය තමන්ගේ සතුරා ලෙස අර්ථ දක්වන වාර්ගික ජාතිකවාදී සංවිධානයකට ව්‍යූහාත්මකවම එබඳු ආමන්ත්‍රණයක් කරන්න බැහැ. ඒ වෙනුවට ඔවුන් කළේ සිංහල ජනතාව භීතියට පත් කිරීමයි: කොළඹ ජනාකීර්ණ වීදි සහ දුම්රිය ස්ථානවල බෝම්බ ප්‍රහාර එල්ල කිරීම, මායිම් ගම්මානවල සිටි සිංහල සහ මුස්ලිම් ගොවි ජනතාව සමූලඝාතනය කිරීම, සහ සිංහල බෞද්ධ සංස්කෘතියේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන දළදා මාලිගාවට ප්‍රහාර එල්ල කිරීම සිදු කළා. බෙදුම්වාදී ව්‍යාපාරයක් ලෙස, වාර්ගික සුද්ද කිරීම හරහා තමන් හිමිකම් කී ප්‍රදේශ ජනගහන පදනමෙන් තහවුරු කරගැනීමටත් ඔවුන් මේ ප්‍රහාර එල්ල කළා.

මේවා උමතු ක්‍රියා හෝ සරල පළිගැනීමේ ක්‍රියාවන් නෙවෙයි. ඒවා වාර්ගිකවාදී භීෂණය මගින් තමන්ගේ බෙදුම්වාදී වැඩපිළිවෙළට සේවයක් වන බව ඉතා දැඩි ලෙස තේරුම් ගත් නායකත්වයක් විසින් ගත් ගණන් බලන ලද (calculated) දේශපාලන තීන්දුයි. කොළඹ මඟී දුම්රියක පිපිරුණු සෑම බෝම්බයක්ම, යුද්ධයම ප්‍රශ්න ගත කිරීමට ඉඩ තිබූ සිංහල කම්කරුවන්ව නැවතත් පාලක පන්තියේ විලංගුවට තල්ලු කළා. මායිම් ගම්මානවල සිදු වූ සෑම සමූලඝාතනයක්ම, සිංහල ගොවියන්ට තමන්ගේ දෙමළ අසල්වැසියන්ව "කොටියෙකු" හෝ "ත්‍රස්තවාදියෙකු" ලෙස මිස වෙන යම් ආකාරයකින් දැකීම දේශපාලනිකව කළ නොහැකි තත්ත්වයට පත් කළා. මේක හිතාමතාම, මූලෝපායිකව වෛරය නිෂ්පාදනය කිරීමක් වුණා — එනම් පන්ති දේශපාලනය වෙනුවට වාර්ගික භීෂණයත්, කම්කරු පන්තික එකමුතුව වෙනුවට වාර්ගිකවාදී භේදයත් ආදේශ කිරීමයි.

**දේශපාලන සහජීවනයක්: එල්ටීටීඊය සහ දකුණේ පාලක පන්තිය**

අනෙක් අතට සිංහල-දෙමළ විතැන්වීම (alienation) උත්සන්න කිරීම තමයි දකුණේ පාලක පන්තියටත් හරියටම ඕන කළේ — මාක්ස්වාදී විශ්ලේෂණයකින් පමණක් පැහැදිලිව පෙනෙන තීරණාත්මක දේශපාලන කාරණය වන්නේ මෙයයි. ඇත්තටම ගත්තොත්, LTTE එක මේ අපරාධ සිදු

කිරීමම තමයි දකුණේ පාලක පන්තියට අවශ්‍ය වෙලා තිබුණේ.

1948 ඊනියා නිදහසෙන් පස්සේ, පාලක ආණ්ඩු විසින් ගෙනගිය දේශපාලන වැඩපිළිවෙළ සකස් වුණේ කම්කරු හා පීඩිත ජනතාවගේ එකමුතුවට එරෙහිව ක්‍රමානුකූලව යොදවන ලද දෙමළ හා මුස්ලිම් විරෝධී ස්වෝත්තමවාදය (chauvinism) මතයි. 1948 පුරවැසි පනත මගින් වතුකරයේ දෙමළ ජනතාව ලක්ෂ දහයකගේ ඡන්ද අයිතිය අහෝසි කළා. 1956 රාජ්‍ය භාෂා පනත මගින් දෙමළ ජාතික පීඩනය ආයතනගත කළා. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බෞද්ධ ආධිපත්‍යවාදය (supremacism) තහවුරු කළා. සිංහල කම්කරු පන්තිය තමන්ගේ විප්ලවීය විභවය පෙන්නුම් කළ අවස්ථාවේදී — එනම්, සියලු වාර්ගිකත්වවල කම්කරුවන් එකතු කර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දණගැස්වූ 1953 හර්තාලයේදී — පාලක පන්තිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගුවේ ඒ එකමුතුව නැවත ඇතිවීම වැළැක්වීමේ සිංහල ස්වෝත්තමවාදී පදනම මතයි. 1980 දී සාධාරණ වේතන ඉල්ලා රාජ්‍ය අංශයේ කම්කරුවන් ශ්‍රී ලංකා ඉතිහාසයේ විශාලතම මහ වැඩවර්ජනය දියත් කළ විට, ජයවර්ධන ආණ්ඩුව කම්කරුවන් ලක්ෂයක් රැකියාවලින් දොට්ට දමා, දෙමළ කොළඹ ගිනිබත් කරමින් පූර්ණ පරිමාණ සිවිල් යුද්ධයක් ආරම්භ කළ 1983 කළු ජූලි වාර්ගික හිංසන (pogrom) සංවිධානය කළා.

ශ්‍රී ලංකාවේ ධනපතියෝ මේ "බෙදා පාලනය කිරීමේ" මූලධර්මය ඉගෙනගත්තේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් — ඉන්දියාව බෙදා වෙන්කිරීමේ බේදවාචකයේ පාඩම මගින් පෙන්නුම් කළේ ඒකයි — ඔවුන් එය ඉතා විනාශකාරී ලෙස එක දිගටම භාවිත කළා. LTTE එක සිදු කළේත් මේ දේශපාලන ක්‍රමවේදයම එහි ඉතාම මිලේච්ඡ ස්වරූපයෙන් ක්‍රියාත්මක කිරීමයි. උපායමාර්ගිකව, සිංහල කම්කරුවන් හා ගොවියන් භීතියට පත් කරමින් සෑම දෙමළ මනුස්සයෙකුම "කොටියෙකු" ලෙස දැකීමට සැලැස්වීමෙන්, ඔවුන් දෙමළ තරුණයන්ව බෙදුම්වාදී දේශපාලන ආවෘත අන්තයක සිරකර, සිංහල පන්ති මිතුරන්ගෙන් ඔවුන්ව වෙන් කර, ඔවුන්ගේ කෝපය හා කැපකිරීම එහි මිලිටරි අනුකණ්ඩ වලට බලහත්කාරයෙන් යොදාගත්තා. මූලෝපායිකව, කම්කරු පන්තික එකමුතුව මර්දනය කිරීමට, මිලිටරි අයවැය සාධාරණීකරණය කිරීමට, යුද විරෝධය නිහඬ කිරීමට සහ යුද්ධය විවේචනය කරන සෑම කෙනෙකුම ත්‍රස්තවාදී හිතවාදියෙකු ලෙස හංවඩු ගැසීමට දකුණේ පාලක පන්තියට අවශ්‍ය වූ වාර්ගික ධ්‍රැවීකරණය LTTE එක විසින් ලබාදුන්නා.

අදටත් මේ වාර්ගික විතැන්කිරීම ඉදිරියට අරගෙන යන, සිංහල ස්වෝත්තමවාදී සමාජ මාධ්‍ය තුළ දෙමළ මුල්ලිවයික්කාල් සැමරුම්වලට එරෙහිව වෛරය පතුරුවන, "රණවිරු" මිථ්‍යාව උත්කර්ෂයට නංවන තරුණයෝ සහ කම්කරුවෝ කියන්නේ LTTE එකේත් දකුණේ පාලක පන්තියේත් මේ තුච්ඡ දේශපාලනයේ ගොදුරුයි. LTTE එකේ ත්‍රස්තවාදය සහ පාලක පන්තියේ ස්වෝත්තමවාදය කියන්නේ එකිනෙකට විරුද්ධ බලවේග නෙවෙයි. ඒවා එකිනෙකා මත යැපුණු දේශපාලන සහජීවනයක් (symbiosis) වුණා වගේම, දෙපාර්ශවයේම කම්කරු ජනතාව බිලිදෙමින් එක් පාර්ශවයක් විසින් ඔවුන්ගේ ජනතාව තම ග්‍රහණයට ගැනීම සඳහා අනෙක් පාර්ශවය උදව් වුණා. මේ ගතිකයන් සියල්ල පැහැදිලිව පෙනෙන්නේ මාක්ස්වාදී විශ්ලේෂණයක් ඇතුළේ විතරයි.

**සැබවින්ම LTTE එකේ මේ බෙදුම්වාදී දේශපාලනයේ කොටසක් වුණේ එහි භීෂණය හරහා සිංහල ජනතාව දෙමළ ජනතාවගෙන් බිඳවීම සහ ඒ හරහා සිංහල ස්වෝත්තමවාදය පෝෂණය කිරීමයි.** අද දක්වා දෙමළ ජනතාවට එරෙහිව මේ සිංහල ස්වෝත්තමවාදය ඉදිරියට ගෙනියන අය කරන්නේ දකුණේ ධනපති පන්තියත්, LTTE එකත් එක්ව පූර්ණත්වයට පත් කළ දේශපාලන මූලෝපාය ඉදිරියට ගෙනයෑමයි. මේ නිශ්චිත ඓතිහාසික අර්ථයෙන් ගත්තොත්, LTTE යේ දේශපාලන පීතෘත්වය හිමි වන්නේ කොළඹ පාලක පන්තියටයි — 1980 මහ වැඩවර්ජනයට සහ සිංහල-දෙමළ කම්කරු පන්තික එකමුතුවේ තර්ජනයට පිළිතුරු ලෙස වර්ගවාදී යුද්ධයක් නිර්මාණය කළ පාලක පන්තියක දුෂ්ට ඵලයක් තමයි LTTE එක.

**වගවීම මගින් අපරාධකරුවන් ආරක්ෂා කළ රාජ්‍යය හෙළිදරව් කරයි**

දැන්, අපි පැහැදිලිව කියනවා: ඔය අපරාධවලට වගකිව යුතු LTTE නායකත්වයක් ජීවතුන් අතර ඉන්නවා නම් ඔවුන්ව වගවීමට ලක් කරන්න ඕනේ. මෙතැනදී දැනට පවතින ඇත්ත තත්ත්වය මොකක්ද කියලා අපි නිශ්චිතව තේරුම් ගන්න අවශ්‍යයි.

LTTE එකේ ඉහළම දේශපාලන සහ මිලිටරි නායකත්වය — ප්‍රභාකරන්, සූසෙයි, චාල්ස්, බාලසිංහම් සහ අනෙකුත් අය — 2009 දී හෝ ඊට පෙර මියගොස් අවසන්. හැබැයි ඊට වගකිව යුතු සියලුදෙනාම මියගොස් නැහැ. කරුණා අම්මාන් (විනයාගමූර්ති මුරලිදරන්) — නැගෙනහිර පළාතේ LTTE බලඇණි මෙහෙයවූ අතර, අරන්තලාව සංහාරය ඇතුළු එහි සිදු වූ අපරාධවල අණදීමේ වගකීම දරනවා. 2004 දී සංවිධානයෙන් වෙන් වීමෙන් පසු, ශ්‍රී ලංකා මිලිටරි බුද්ධි අංශයේ ආරක්ෂාව යටතේ LTTE විරෝධී පැරාමිලිටරි නායකයෙකු ලෙස කටයුතු කළ පිල්ලෙයාන් — සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් — ළමා සෙබළුන් පැහැරගැනීම් සහ දේශපාලන ඝාතන සම්බන්ධයෙන් වගකිව යුතු ආණ්ඩු හිතවාදී පැරාමිලිටරි බලඇණිවලට නායකත්වය දුන්නා. කේ.පී. (කුමරන් පත්මනාදන්) — LTTE එකේ ආයුධ මිලදී ගැනීම් සහ ජාත්‍යන්තර ජාලයන් මෙහෙයවූවා. මේ තිදෙනාම අද ජීවතුන් අතර ඉන්නවා.

සමස්ත පද්ධතියේම තීරණාත්මක හෙළිදරව්ව තියෙන්නේ මෙන්න මෙතැනයි: අපි LTTE එකේ අපරාධ ගැනත් කතා කරන්න ඕනේ කියලා බලකරන දකුණේ සිංහල ස්වෝත්තමවාදී රාජ්‍යය කියන්නේ, කරුණා අම්මාන්ට රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර ලබාදුන්, පිල්ලෙයාන්ව

 ISSN 3093-6217

නැගෙනහිර පළාත් මහ ඇමති ලෙස පත්කළ, සහ අරන්තලාව ඇතුළු ඔවුන් කළ අපරාධවලින් ඔවුන්ව ආරක්ෂා කරමින් තමන්ගේම දේශපාලන යාන්ත්‍රණයට මොවුන්ව එකතු කරගත් රාජ්‍යයමයි. ඒ නිසා LTTE එකේ යුද අපරාධ ගැන කෙරෙන ඕනෑම සැබෑ පරීක්ෂණයකින් කරුණා සහ පිල්ලෙයාන් ආරක්ෂා කිරීමට රාජ්‍යයේ ඇති අපරාධකාරී සම්බන්ධය විතරක් නෙවෙයි හෙළිවෙන්නේ — 1983 කළු ජූලිය සහ දශක ගණනාවක ක්‍රමානුකූල දෙමළ විරෝධී මර්දනය හරහා LTTE එක නිර්මාණය කිරීමේ රාජ්‍යයේ දේශපාලන වගකීමත්, මුල්ලිවයික්කාල්, චෙම්මනි, මන්නාරම සහ වසර තිහක මිලිටරි පාලනය පුරා රාජ්‍යය විසින්ම සිදු කළ සෘජු යුද අපරාධත් එළියට එනවා. දකුණේ රාජ්‍යය ඊට සූදානම් නැහැ. කොළඹ පාලක පන්තිය විසින් එබඳු කිසිදු පරීක්ෂණයකට කිසිදිනක ඉඩ නොදෙන්නේත්, පාර්ශව දෙකේම අපරාධවල සත්‍යය එකවිට යටගසන්නේත් මෙන්න මේ නිසයි.

### සදාචාරයේ ගිණුම් පොත නොව, දේශපාලන ප්‍රශ්නයයි වැදගත්

දකුණේ රාජ්‍යය කියන්නේ දේශපාලනික හා මර්දනකාරී ආයතනයක් මිසක්, අපරාධ කළ පුද්ගලයන් කිහිපදෙනෙකුගේ එකතුවක් විතරක් නෙවෙයි. සමූලඝාතන, අතුරුදහන් කිරීම්, චෙම්මනි සමූහ මිනීවලවල් — මේවා අහම්බෙන් සිදු වූ බලය ඉක්මවා යාම් නෙවෙයි. ඒවා ධනපති ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා යොදවන ලද රාජ්‍ය භීෂණයේ ව්‍යුහාත්මක ක්‍රියාත්මක කිරීම්. ඒ රාජ්‍යය අදටත් හෙටටත් මේ අපරාධ නැවත කිරීමට සූදානමින් ඉන්නවා — දෙමළ ජනතාවට එරෙහිව විතරක් නෙවෙයි, IMF කප්පාදු ක්‍රියාත්මක කරමින්, වැඩවර්ජන තහනම් කරමින්, ඊට එරෙහි වන කම්කරුවන්ට එරෙහිව මිලිටරිය යෙදවීමට ලෑස්ති වෙමින්, සමස්ත සිංහල, දෙමළ හා මුස්ලිම් කම්කරු පන්තියටම එරෙහිව ඔවුන් එය කරන්න සූදානම්.

ඒ නිසා අපිට වැදගත් වෙන්නේ "පාර්ශව දෙකම සදාචාරාත්මකව වැරදියි" කියලා පෙන්වන්න අපරාධ ලැයිස්තු පෙළගස්වන එක නෙවෙයි. වඩාත්ම වැදගත් වෙන්නේ සදාචාරාත්මක ප්‍රශ්නය නෙවෙයි, දේශපාලන ප්‍රශ්නයයි. සදාචාරාත්මකව බැලුවොත් මේ සියලු අපරාධ, අපරාධම තමයි — අපි ඒ සියල්ල හෙළා දකිනවා. **නමුත් දේශපාලනික වගවීම අතිමූලිකවම පැවරෙන්නේ දකුණේ සිංහල ස්වෝත්තමවාදී ධනපති රාජ්‍යයටයි.** ඒක තමයි අනවරතව පවතින ආයතනය. ඒක තමයි සන්නද්ධ යාන්ත්‍රණය. තමන්ගේ අපරාධකරුවන් ආරක්ෂා කරමින්, අදටත් කම්කරු පන්තියට තර්ජනය කරමින් ආරක්ෂිතව පවතින පන්ති සතුරා වන්නේ එයයි.

දකුණේ කිසිදු සංස්ථාපිත මාධ්‍යයක් "රණවිරුවන්" උත්කර්ෂයට නැංවීමෙන් ඔබ්බට යන්නේ නැහැ. උතුරේ සහ නැගෙනහිර යුද්ධයේදී රාජ්‍ය හමුදා කළ අපරාධ සම්බන්ධයෙන් දකුණේ සියලු මාධ්‍යයන් නිහඬතාවක් රකිනවා. දේශපාලන පිරිවැයක් දරමින් ම මේ සත්‍යය හෙළිදරව් කරන ඉතා සුළු පිරිස අතර අපි ඉන්නවා — රාජ්‍යයෙන් වගේම LTTE එකෙන් අපේ ව්‍යාපාරයට සිදු වූ පීඩාවල ඉතිහාසය මගින් ඒක ඔප්පු වෙනවා. විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (RCL) සාමාජිකයන් තිදෙනෙකු ජේවීපී (JVP) එක විසින් ඝාතනය කළා. සමාජවාදී සමානතා පක්ෂයේ (SEP) සාමාජිකයන් පස්දෙනෙකු LTTE එකෙන්ම පැහැරගනු ලැබුවා. අපි කවදාවත් ඒ දෙගොල්ලන්ටම යටත් වුණේ නැහැ.

එබැවින්, අපේ "ස්වාධීනත්වය" මැනීමේ පරීක්ෂණයක් ලෙස LTTE අපරාධ ගැන ලියන්න කියලා අපිට අභියෝග කරන සිංහල ස්වෝත්තමවාදීන්ට අපි මෙසේ කියනවා: උතුරේ සහ නැගෙනහිරදී දකුණේ සිංහල ආණ්ඩුවේ හමුදාව යුද අපරාධ කළ බව පිළිගන්න. 2009 සිට පත් වූ සෑම ආණ්ඩුවකටම සහ දකුණේ ප්‍රධාන මාධ්‍යවලට ඒ අපරාධ එකින් එක හෙළිදරව් කරන්න කියලා බල කරන්න. අරන්තලාව සමූල ඝාතනය සම්බන්ධයෙන් ඔබේම ආණ්ඩුව විසින් වැළැක්වූ නඩු කරුණාට එරෙහිව පවරන්න කියලා බල කරන්න. හැබැයි අපි ඔබට කියනවා: දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔබ සේවය කරන පාලක පන්තියටවත්, ඔබටවත් කිසිසේත්ම ඒක කරන්න බැහැ. මොකද එහෙම කළොත් ඔබ ආරක්ෂා කරන මුළු පද්ධතියම හෙළිදරව් වෙන නිසයි.

**දකුණේ රාජ්‍යයේ අපරාධ මතු කළා කියලා LTTE එකේ අපරාධ අහෝසි වෙන්නේ නැහැ.** සැබවින්ම, දකුණේ රාජ්‍යය තමන්ගේ අපරාධ යටගහලා සත්‍යය වසං කරන්න හදන නිසාම තමයි LTTE නායකත්වය සහ එහි ඉතුරු වෙලා ඉන්න කොටස්කරුවන් කරපු අපරාධවලටත් එරෙහිව වගවීමේ සැබෑ යාන්ත්‍රණයකට යන්න බැරි වෙලා තියෙන්නේ. එහෙම කරන්න නම් දකුණේ රාජ්‍යයේ යුද අපරාධ පිළිගන්න වෙනවා, ඒ වගේම කරුණා සහ පිල්ලෙයාන් LTTE එකෙන් වෙන් වුණාට පස්සේ කළ අපරාධ සම්බන්ධයෙන් රාජ්‍යයේ ඇති අපරාධනීය සහභාගීත්වයත් පිළිගන්න වෙනවා. දකුණේ රාජ්‍යය ඒකට ලෑස්ති නැහැ — ඒ නිසයි ඔවුන් මේ සියල්ලේ සත්‍යය යටගහන්නේ. ඒ නිසයි අපි සත්‍යය වෙනුවෙන් පෙනී සිටිමින්, සත්‍යය යටගැසීමේ සෑම උත්සාහයකටම එරෙහිව එය මතු කරන්න ඕනේ.

### ඉදිරිය සඳහා ඇති එකම මාවත: ජාත්‍යන්තර සමාජවාදී එක්සත් කම

තවත් බෙදුම්වාදී අන්තයන්ට, වාර්ගික ඝාතනයන්ට සහ අලුත් අපරාධයන්ට මේ රට තල්ලු වීම වැළැක්වීම සඳහා කම්කරුවන් සහ පීඩිත ජනතාව සංවිධානය කිරීමයි අපගේ ප්‍රධාන අරමුණ. යුද්ධය අවසන් වී දා හත් වසරකට පසුව, ජනගහනයෙන් සියයට 23ක් දිළිඳුකමේ පසුවෙද්දී, දෙමළ ජනතාවගේ ඉඩම් තවමත් මිලිටරි පාලනය යටතේ පවතිද්දී, අතුරුදහන් වූවන් ගැන තවමත් තොරතුරක් නැතිවෙද්දී, සහ JVP/NPP ආණ්ඩුව එක පැත්තකින් "රණවිරු දිනය" සමරමින් අනික් පැත්තෙන් සිංහල හා දෙමළ කම්කරුවන් එකසේ විනාශ කරන IMF කප්පාදු ක්‍රියාත්මක කරද්දී — දෙමළ ජාතික ප්‍රශ්නය විසඳී නැහැ. එය තවත් තීව්‍ර වෙලා තියෙනවා. දකුණේ ධනපති රාජ්‍යයට එය විසඳීමට නොහැකි තාක්, දෙමළ ජාතිකවාදී

ධනපති නායකයෝ කරන්නේ දෙමළ ජනතාවගේ නොවිසඳුණු සැබෑ ප්‍රශ්න පාවිච්චි කරමින් නැවතත් බෙදුම්වාදය ඉදිරියට ගේන්න උත්සාහ කරන එකයි.

එය වැළැක්වීම සඳහා, මේ ධනපති රාජ්‍යයේ සහ එහි මර්දනකාරී මෙවලම්වල සැබෑ ස්වරූපය පිළිබඳව කම්කරු පන්තිය නිරන්තරයෙන් දැනුවත් කළ යුතුයි — එනම්, පාලක පන්තිය විසින් නිර්මාණය කරන, පවත්වාගෙන යන සහ ප්‍රයෝජනයට ගන්නා ජාති, ආගම් හෝ කුල මල බේද කිසිවක් නොසලකා, මේ රාජ්‍යය පිහිටුවා ඇත්තේ කම්කරුවන්ට සහ පීඩිත ජනතාවට එරෙහිව බවත්; එහි හමුදාව යනු එහි මර්දන යන්ත්‍රය බවත්; ඔවුන් උත්කර්ෂයට නංවන "රණවිරුවන්" යනු ඔවුන් විසින්ම ආරක්ෂා කරන යුද අපරාධකරුවන් බවත් ඒත්තු ගැන්විය යුතුයි. රාජ්‍යයේ අපරාධ, කාලයෙන් හෝ මර්දනයෙන් වැසී යාමට ඉඩ නොදිය යුතුයි. ඒවා මතුපිටට ගෙන සිහිපත් කළ යුත්තේ, ඒ ඉතිහාසය නොමැතිව අලුත් පරම්පරාවන්ට පවතින රාජ්‍යයේ සැබෑ ස්වරූපය වටහාගත නොහැකි නිසයි. නැවතත් මේ රට වාර්ගික සංහාරයන්ට යන එක වළක්වා ගැනීමට සිංහල කම්කරුවෝ, ගොවියෝ සහ තරුණයෝ මේ දේශපාලන යථාර්ථය හරියට තේරුම් ගන්න ඕනේ. ඒ වගේම, මුල්ලිවයික්කාල් හි සිදුවූ යුද අපරාධ සඳහා, අතුරුදහන් වූවන් සඳහා, සහ මිලිටරිය අත්පත් කරගත් ඉඩම් සඳහා යුක්තිය ඉටුකර ගැනීම දෙමළ ප්‍රභූන් නියෝජනය කරන දෙමළ ජාතිකවාදී පක්ෂවලින්වත්, භූ-දේශපාලනික අවශ්‍යතාවලට සේවය කරන අධිරාජ්‍යවාදී අධිකරණවලින්වත් ලබාගත නොහැකි බවත්, එය ලබාගත හැක්කේ සියලු ජාතීන්ගේ කම්කරු පන්තියේ එක්සත් අරගලයකින් පමණක් බවත් දෙමළ කම්කරුවෝ, ගොවියෝ සහ තරුණයෝ තේරුම් ගන්න ඕනේ.

පාලක දේශපාලන පන්තිය, රාජ්‍යය සමඟ පෙළගැසුණු බෞද්ධ බල ධූරාවලිය, පාලක පන්තික අවශ්‍යතාවලට සේවය කරන මාධ්‍ය පද්ධතිය, සහ ඔවුන්ගේ ඒජන්ත වර්ගවාදී සංවිධාන නැවත වරක් දෙමළ හා මුස්ලිම් විරෝධී වාර්ගිකවාදය ඇවිළවීමට සූදානම් වෙනවා. දෙමළ ජනතාවගේ දුක්ගැනවිලි කෙරෙහි JVP/NPP ආණ්ඩුව දක්වන සීමිත හා මතුපිටින් කෙරෙන ප්‍රදර්ශනාත්මක පැලැස්තර — එනම්, මිලිටරි අත්පත් කරගැනීම් සහ මර්දන යාන්ත්‍රණය එලෙසම පවත්වා ගනිමින් දෙමළ ඡන්ද ලබාගැනීමට සිදු කරන ගණන් බලන ලද මැතිවරණ උපමාරු — දෙමළ ඩයස්පෝරාවට යටත් වීමක් සහ සිංහල ජාතිය පාවාදීමක් ය යන්නට "සාක්ෂි" ලෙස දක්වමින් ජාතිවාදී බලවේග විසින් ඒවා ආයුද බවට පත් කර ගැනීමට කටයුතු කරනවා. මේ ප්‍රචාරය සිතා මතා උවමනාවෙන්ම සිදු කරන බේගල් ඇදබෑමක්. දිසානායක ආණ්ඩුව දෙමළ ජනතාවගේ එකම මූලික ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීමක්වත් විසඳා නැහැ: මිලිටරිය තවමත් දෙමළ ඉඩම් අත්පත් කරගෙන ඉන්නවා, අතුරුදහන් වූවන් ගැන තොරතුරක් නැහැ, සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) එලෙසම පවතිනවා. ස්වෝත්තමවාදීන් දෙමළ ජනතාවට දෙන ලද "සහන" ලෙස පෙන්වන්නේ, සිංහල ආධිපත්‍යයවාදී රාජ්‍ය බලයේ පූර්ණ යන්ත්‍රණය ක්‍රියාත්මක වෙද්දී මතුපිටින් දැමූ බොරු ආවරණයකට විතරයි. ගෝලීය ආර්ථික අර්බුදයේ සහ අධිරාජ්‍යවාදී යුද සූදානමේ බලපෑම රට තුළට කඩාවදින විට — වඩාත් දරුණු සමාජ කප්පාදු පටවමින්, වෘත්තීය සමිති නිලධාරිත්වයේ සහායෙන් දිසානායක ආණ්ඩුව විසින් කෘත්‍රිමව මර්දනය කර ඇති කම්කරු පන්තික අරගලවල පිපිරුම්කාරී වර්ධනයක් ඇතිවෙද්දී — පාලක පන්තිය අනිවාර්යයෙන්ම කම්කරු පන්තිය වාර්ගික හා ආගම් පදනමින් බෙදා වෙන්කිරීමේ අත්හදා බලා පිරික්සන ලද පැරණි ක්‍රමවේදයන් වෙත යොමුවෙනු ඇති. යුද්ධයෙන් පසු සිදු වූ මිලිටරීකරණය, "රණවිරු" දේශප්‍රේමී මිථ්‍යාව, සහ අනුප්‍රාප්තික ආණ්ඩු විසින් සිංහල-බෞද්ධ ආධිපත්‍යයවාදී සංවිධාන ක්‍රමානුකූලව පෝෂණය කිරීම මගින් ශ්‍රී ලාංකේය සමාජය තුළ ගොඩනගා ඇති නැගී එන ෆැසිස්ට්වාදී ප්‍රවණතාවයන් පිළිබඳව සියලු ජාතීන්ගේ කම්කරු පන්තිය සහ තරුණයන් විමසිලිමත් විය යුතුය — එකී ප්‍රවණතාවන්හි වඩාත්ම දෘශ්‍යමාන ප්‍රකාශනය වර්තමානයේ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන සමාජ මාධ්‍ය ව්‍යාපාර තුළින් දැකිය හැකි අතර, ගැඹුරු වන ආර්ථික අර්බුදය සහ කම්කරු පන්තික අරගලයන්හි පිපිරුම්කාරී වර්ධනය විසින් ඉල්ලා සිටින විට, සංවිධානාත්මක වීදි හිංසනයක් ලෙස ඒවා බලමුලු ගැන්වීමට පාලක පන්තිය කිසිසේත්ම පසුබට නොවනු ඇත.

මේ කර්තව්‍යයන් සාක්ෂාත් කිරීම සඳහා, අපි ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනය යටතේ විප්ලවවාදී සමාජවාදී නායකත්වයක් ගොඩනගමින් සිටිනවා — එනම්, 1938 දී ලියෝන් ට්‍රොට්ස්කි විසින් පිහිටුවන ලදුව, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI) විසින් ඉදිරියට ගෙන යනු ලබන හතරවන ජාත්‍යන්තරයේ ඉදිරිදර්ශනයයි. උතුරේ, දකුණේ සහ නැගෙනහිර තරුණයන්ට සහ කම්කරුවන්ට අතීත අපරාධ සහ වේදනාවන් තේරුම් ගනිමින්, පොදු පන්ති සතුරාට — එනම් ධනපති පාලක පන්තියට සහ එය ආරක්ෂා කරන පද්ධතියට — එරෙහිව එක්වීමටත්, 1987නොවැම්බර් ජාත්‍යන්තර කමිටුව ඉදිරිපත් කළ ඉදිරිදර්ශනය වන දකුණු ආසියාතික සමාජවාදී ජනරජයන්ගේ සම්මේලනයක කොටසක් ලෙස ශ්‍රී ලංකා සහ දෙමළ ඊළාම් සමාජවාදී ජනරජයක් වෙනුවෙන් එක්ව සටන් කිරීමටත් හැකිවෙන්නේ මෙබඳු ඉදිරිදර්ශනයක් යටතේ පමණයි. වාර්ගිකව වෙනම රාජ්‍ය කැබලිවලට බෙදීමක් හෝ ධනපති රාජ්‍යත්වය වෙනුවට කම්කරු පන්තික බලය හරහා දෙමළ ජාතික ප්‍රශ්නය විසඳන මෙම රාමුව යටතේ පමණක්, නැවත බෙදුම්වාදයකට ඉඩක් නොමැති වන අතර, අලුත් සමූලඝාතන සාධාරණීකරණය කිරීමක් සිදු නොවන අතරම, මේ යුද්ධයේ සියලු විපතට පත්වූවන්ට සැබෑ යුක්තිය ඉටුවෙනු ඇත.

මේ අරගලය සඳහා අප හා එක්වන්න. අපි ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) යි. theSocialist.lk සමාජවාදී වෙබ් අඩවිය පළ කරන්නෙ අපි.




**LTTE සංවිධානය ෆැසිස්ට්වාදී වූයේ ද? නාසිවාදය යනු ෆැසිස්ට්වාදය ද? ෆැසිස්ට්වාදීන් සැමරීමේ අයිතියක් අපි ආරක්ෂා කරමු ද?**

LTTE දේශපාලනය නාසිවාදය හා සමාන කිරීම වැරදිය. LTTE සංවිධානය ෆැසිස්ට්වාදී නොවූ අතර, එය ෆැසිස්ට් ව්‍යාපාරයක් ද නොවීය. එබැවින්, LTTE සංවිධානය නාසිවාදීන් සමඟ සැසඳිය නොහැකි අතර, ප්‍රභාකරන්ව හිට්ලර් හෝ මුසෝලිනි සමඟ ද සැසඳිය නොහැක. නාසිවාදය යනු ෆැසිස්ට්වාදයේ විශේෂිත වූ සහ දැඩි ලෙස විනාශකාරී ඓතිහාසික රූපයකි. එබැවින්, තිලීපන් හෝ LTTE නායක ප්‍රභාකරන් ඇතුළු දෙමළ ජනතාවගේ යුද මළවුන් සමරීමේ අයිතිය – ඔවුන්ගේ ක්‍රියා කොතරම් කෲර වුව ද – මාක්ස්වාදීන් විසින් ආරක්ෂා කරනු ලබන අතරම, නාසිවරුන් හෝ ෆැසිස්ට්වාදීන් සැමරීමේ අයිතියක් අපි පිළිගන්නේ හෝ ආරක්ෂා කරන්නේ නැත.

මෙය අත්‍යවශ්‍ය සත්‍යයක් සළකුණු කිරීමකි. ෆැසිස්ට්වාදය යනු ඕනෑම ප්‍රතිගාමී දෙයක් හැඳින්වීම සඳහා අවභාවිත කරන ලිහිල් පදයක් නොවේ — එය විශේෂිත ඓතිහාසික සංසිද්ධියකි: එනම් සංවිධානාත්මක කම්කරු පන්තිය සහ සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් විනාශ කිරීම සඳහා, මූල්‍ය ප්‍රාග්ධනය විසින් මුදල් සපයනු ලැබ මෙහෙයවනු ලබන, සුළු ධනපති පන්තිය මහා පරිමාණයෙන් බලමුලු ගැන්වීමයි. එය නාසි පාලනයෙන් සහ හොලෝකෝස්ටයෙන් (Holocaust) උපරිමයට ළඟා විය. LTTE සංවිධානය යනු එය නොවේ. එය දෙමළ ජාතිකවාදය මත පදනම් වූ ප්‍රතිගාමී, වාර්ගිකවාදී, බෙදුම්වාදී ව්‍යාපාරයක් විය — නමුත් එය ෆැසිස්ට් ව්‍යාපාරයක් නොවූ අතර, ප්‍රභාකරන් කොතරම් කෲර වුව ද, හිට්ලර් හෝ මුසෝලිනි නොවීය. ඔවුන් සමාන කිරීම යනු ෆැසිස්ට්වාදය යන්නේ නියම අර්ථය අඳුරු කිරීමකි. එයින් සේවයක් වන්නේ ෆැසිස්ට්වාදය යනු සැබවින්ම කුමක්ද යන්න සඟවා තැබීමට අවශ්‍ය අයට පමණි.

සැමරීමේ අයිතියේ පවතින වෙනස සඳහා පදනම් වන්නේ මෙම වෙනස්කමයි. ජාතික පීඩනයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පුළුල් කොටසක් ලෙස, තිලීපන් සහ ප්‍රභාකරන් ඇතුළු සිය යුද මළවුන් සැමරීමට දෙමළ ජනතාවට ඇති අයිතිය මාක්ස්වාදීහු කොන්දේසි විරහිතව ආරක්ෂා කරති. මෙම මිනිසුන් කොතරම් සාහසික වුව ද, ඔවුන් ෆැසිස්ට්වාදීන් නොවන අතර, ඔවුන් සැමරීම යනු කම්කරු පන්තිය අතුගා දැමීම සැමරීමක් නොව, පීඩිත ජනතාවකගේ ක්‍රියාවකි.

නමුත් නාසිවාදය හෝ ෆැසිස්ට්වාදය සැමරීමට කිසිදු අයිතියක් නැත. ෆැසිස්ට්වාදයේ අන්තර්ගතය වන්නේ සැමරීමට ඇති අයිතියම තහවරු කරනු ලබන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පවා කුඩු කර දැමීමයි. හිට්ලර්ගේ නාසි ඝාතක හමුදාව වූ එස්.එස්. (SS) බලකාය හෝ ෆියුරර් (Führer/හිට්ලර්) ඇගයීමේ අයිතිය ආරක්ෂා කිරීම යනු කම්කරු පන්තිය අතුගා දැමීමේ දේශපාලන වැඩසටහන ආරක්ෂා කිරීමයි. අපි පළමු කී අයිතිය ආරක්ෂා කරන නමුත් දෙවැන්න ප්‍රතික්ෂේප කරමු — එමෙන්ම මෙම වෙනස පදනම් වන්නේ නාසිවාදය ෆැසිස්ට්වාදයක් වන අතරම, LTTE සංවිධානය ෆැසිස්ට්වාදී නොවූයේය යන සත්‍යය මතය.

2026 සැප්තැම්බර් 26.

theSocialist.LK හි Facebook පිටුවෙනි.

# ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වාර්ගික පදනමක් මත, රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ජනගහන සංයුතිය වෙනස් කිරීමේ ක්‍රියාවලියට එරෙහි වනු! ඉදිරි මඟ කුමක් ද?

මෙම ලිපිය “Oppose Communally Driven State-Sponsored Demographic Engineering in the North and East of Sri Lanka: The Way Forward” යන හිසින් theSocialist.lk හි ඉංග්‍රීසි බසින් 2026 ජූලි 6 දින පළ වුණි.

සංජය ජයසේකර විසිනි.

2026 ජූලි 3 වන දින “යාපනය මාධ්‍ය සමාජය” පරිශ්‍රයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී, සිංහල ජාතික කථිකයෙකු විසින් පොදුවේ පිළිගැනෙන සිංහල-බෞද්ධ වාර්ගිකවාදී (communal/communalist) තර්කයක් මතු කරන ලදී. එනම්, ශ්‍රී ලංකාවේ අගනුවර වන කොළඹ තුළ දෙමළ, සිංහල සහ මුස්ලිම් ජනයා එකට ජීවත් වන බැවින්, එම අයුරින්ම යාපනය ඇතුළු උතුරු සහ නැගෙනහිර පළාත්වල ද සිංහල ජනතාව සාමකාමීව පදිංචි කරවිය හැකි බවයි. මෙය දෙමළ බහුතරයක් වෙසෙන ප්‍රදේශ රජයේ අනුග්‍රහය ඇතිව සිංහලීකරණය කිරීම සාධාරණීකරණය කිරීම සඳහා ගොඩනගන ලද වැරදි සහගත මතයකි. මෙම තර්කය වංචනිකය. මෙය පොදු මූලධර්මයක් ලෙස පිළිගතහොත්, දකුණේ ප්‍රධාන වශයෙන් සිංහල ජනයා වෙසෙන ප්‍රදේශ වන මාතර, වීරකැටිය, දික්වැල්ල, තංගල්ල, අම්බලන්තොට, මිරිස්ස, ගාල්ල සහ දෙනියාය වැනි ප්‍රදේශවල දෙමළ ජනතාවට ඉඩම් ලබාදීමට රජය කටයුතු කිරීම ද ඒ හා සමානවම සාධාරණීකරණය කළ හැකිය. මෙම කථිකයා එය කිසිසේත්ම පිළිගනු නැත. මන්ද, රජයේ අනුග්‍රහය සහිත පදිංචිකිරවීම්/ජනාවාසකරණය (settlement) යනු ස්වේච්ඡා සහජීවනය සඳහා කෙරෙන ආරාධනයක් නොව, බලය ක්‍රියාත්මක කිරීමේ මෙවලමක් බව ඔහු මැනවින් දන්නා බැවිනි. බහු-වාර්ගික සහජීවනයේ මූලධර්මයක් ලෙස මෙහිදී ඉදිරිපත් කෙරෙන්නේ, සැබවින්ම රජයේ අනුග්‍රහය ඇතිව සිංහල වාර්ගික ආධිපත්‍යය පැතිරවීම සාධාරණීකරණය කිරීමකි. මෙම ගැටලුව ජනවාර්ගිකත්වය පිළිබඳ හෝ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනයාට ස්වේච්ඡාවෙන් එකට ජීවත් විය හැකිද යන්න පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. මෙහි ඇති සැබෑ ප්‍රශ්නය නම්, රජය විසින් මෙහෙයවනු ලබන ජනගහන සංයුතිය




*යෝජිත කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය රජය විසින් නැවත ආරම්භ කිරීමට එරෙහිව, වවුනියාව නෙඩුන්කේණි ප්‍රදේශයේ පදිංචිකරුවෝ සහ ගොවියෝ 2026 පෙබරවාරි 2 වන දින විරෝධතාවයක නිරත වූහ. මෙම ව්‍යාපෘතිය මඟින් සිංහල ජනාවාස ඇති කිරීම සිදුවන බවත්, එමඟින් උතුරු-නැගෙනහිර ප්‍රදේශයේ ජනගහන සංයුතිය වෙනස් වන බවත් ඔවුහු ප්‍රකාශ කරති. ඡායාරූපය: ‘ශ්‍රී ලංකා බ්‍රේකින් නිවුස්’ (Sri Lanka Breaking News) ෆේස්බුක් පිටුවෙනි.*

වෙනස් කිරීමේ දේශපාලන ස්වභාවය සහ එය සේවය කරන ධනේශ්වර පාලනයේ වාර්ගිකවාදී මූලෝපාය යි.

**ඓතිහාසික වාර්තාව**

1948 දී ලැබූ ව්‍යාජ නිදහසේ සිට, බලයට පත් වූ අනුප්‍රාප්තික ශ්‍රී ලංකා ආණ්ඩුවල වාර්ගිකවාදී පාලනයේ ප්‍රධාන කුළුණක් ලෙස උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනගහන සංයුතිය වෙනස් කිරීමේ උපක්‍රමය (demographic engineering) අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඩී. එස්. සේනානායක ආණ්ඩුවේ පළමු ක්‍රියාමාර්ගවලින් එකක් වූයේ වතුකරයේ දෙමළ භාෂාව කතා කරන ලක්ෂ දහයකට අධික ජනතාවකගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමයි. එක්සත් ජාතික පක්ෂය ආරම්භයේ සිටම මෙම වාර්ගිකවාදී මූලධර්මය ක්‍රියාවට නැංවූ අතර, ඒ පිළිබඳව කොල්වින් ආර්. ද සිල්වා 1948 දී පුරවැසි පනතට විරුද්ධව කළ දේශනයේදී මෙසේ අනාවැකිමය ප්‍රකාශයක් කළේය: "රාජ්‍යය ජාතිය (nation) සමඟ ද, ජාතිය වර්ගය (race) සමඟ ද කාල සමපාත විය යුතුය." මෙය "යල් පැන ගිය මතයක් සහ බිඳ වැටුණු දර්ශනයක්" බවට අනතුරු ඇඟවූ ඔහු, වැඩිදුරටත් මෙසේ ද පැවසීය: "ජාතිය වර්ගය සමඟ සමපාත කිරීමටත්, වර්ගය රාජ්‍යයේ ව්‍යුහය තීරණය කරන ප්‍රධාන සාධකය බවට පත් කිරීමටත් කටයුතු කෙරුණේ හරියටම ෆැසිස්ට්වාදය යටතේ ය.[1]

මහ වැඩවර්ජනය හේතුවෙන් ධනේශ්වර පාලනයේ පදනම සෙලවී ගිය 1953 හර්තාලයෙන් පසුව මෙම රටාව වඩාත් තීව්‍ර විය. කම්කරු පන්තිය තුළ ට්‍රොට්ස්කිවාදීන්ට තිබූ බලපෑමට වැට බැඳිය හැක්කේ දෙමළ විරෝධී පටු ආකල්ප ඇවිස්සීමෙන් පමණක් බව බණ්ඩාරනායක නිගමනය කළේය. කෙසේ වෙතත්, මෙම වාර්ගිකවාදී ව්‍යාපෘතිය නීති පැනවීමට සහ පරිපාලනමය වෙනස්කම්වලට පමණක් සීමා නොවීය. රටේ ජනගහන සිතියම භෞතිකව වෙනස් කිරීම මඟින් ද එය එලෙසම දැඩි වීර්යයකින් යුතුව ඉදිරියට ගෙන යන ලදී.

1950 දශකයේ සිට ඉදිරියට, බලයට පත් වූ අනුප්‍රාප්තික ආණ්ඩු විසින් තෙත් කලාපයේ ජීවත් වූ සිංහල ගොවි ජනතාව වියළි කලාපයට අයත් උතුරු සහ නැගෙනහිර පළාත්වල පදිංචි කරවීම සඳහා රජයේ අනුග්‍රහය සහිත වාරිමාර්ග හා භූමි ජනපදකරණ (coloniztion) ව්‍යාපෘති භාවිත කරන ලදී. 1949 දී ඩී. එස්. සේනානායක යටතේ ආරම්භ කරන ලද **ගල්ඔය ව්‍යාපෘතිය** මඟින්, ගල්ඔය ගඟ හැරවීමෙන් සංවර්ධනය කරන ලද ඉඩම්වල දසදහස් සංඛ්‍යාත සිංහල පදිංචිකරුවන් පිරිසක් පදිංචි කරවන ලදී. ඒකාබද්ධ මඩකලපුව-අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල ජනගහනය 1911 දී 4,702 ක් වැනි සුළු අගයක පැවති අතර, එය 1981 වන විට 150,000 ඉක්මවන තෙක් ඉහළ ගියේය. මෙය සාමාන්‍ය ස්වාභාවික ජනගහන වර්ධන වේගයකින් සිදුවිය නොහැකි, කැපී පෙනෙන වර්ධනයකි. සිංහල බහුතරයක් වෙසෙන දකුණු පළාත්වලින් රැගෙන ආ පදිංචිකරුවන්ට රජයේ ඉඩම්, වාරිමාර්ග යටිතල පහසුකම් සහ වගා අයිතීන් ක්‍රමවත්ව ලබාදීම මඟින් මෙම වර්ධනය අත්පත් කරගන්නා ලදී. 1961 අප්‍රේල් මාසයේදී මඩකලපුවෙන් අම්පාර පරිපාලනමය වශයෙන් වෙන් කිරීම ඉදිරිපත් කෙරුණේ, එම කලාපයේ වර්ධනය හේතුවෙන් අවශ්‍ය වූ නිලධාරිවාදී විමධ්‍යගත කිරීමේ පියවරක් ලෙසය. නමුත් සැබවින්ම එය දශකයකට වැඩි කාලයක් තිස්සේ සැලසුම්සහගතව සිදුකළ ජනගහන සංයුතිය වෙනස් කිරීමේ වැඩපිළිවෙළේ දේශපාලන ස්ථාවරීකරණයකි. දිස්ත්‍රික් සීමා නැවත ඇඳීම මඟින් එතෙක් දෙමළ සහ මුස්ලිම් බහුතරයක් ජීවත් වූ භූමියෙන් සිංහල බහුතරයක් සහිත නව අභ්‍යන්තර ප්‍රදේශයක් වෙන් කරගත් අතර, දෙමළ සහ මුස්ලිම් ජනතාව බහුලව වෙසෙන වෙරළබඩ ප්‍රදේශවලින් එය පරිපාලනමය වශයෙන් වෙන් කරන ලදී. එතෙක් දෙමළ බහුතරයක් සිටි පළාතක් තුළ සිංහල පාර්ලිමේන්තු නියෝජනයක් කෘත්‍රිමව නිර්මාණය කිරීම සඳහා මැතිවරණ සීමා නැවත සකස් කිරීම හරහා සිදුකළ අම්පාර බෙදීම, සංවර්ධන ප්‍රතිපත්තියක අහඹු අතුරු ඵලයක් නොවීය; එය සිංහල ධනේශ්වර පන්තියේ ජාතිය ගොඩනැඟීමේ ව්‍යාපෘතියේ අත්‍යවශ්‍ය යාන්ත්‍රණයක් විය. තාක්ෂණික පරිපාලනයක් සහ ග්‍රාමීය සංවර්ධනයක් ලෙස හඳුන්වා දුන් දෙය, එහි ආරම්භයේ සිටම පාලක පන්තිය විසින් කම්කරු පන්තිය වාර්ගික පදනමින් කැබලි කිරීම සඳහා භාවිත කළ මූලෝපාය සමඟ බද්ධ වී තිබූ බව මින් තහවුරු වේ.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් බැහැරින් කැඳවාගෙන ආ ගොවි ජනතාව, එතෙක් දෙමළ බහුතරයක් ජීවත් වූ **කන්තලේ** ප්‍රදේශයේ පදිංචි කරවීම මඟින් ද මෙවැනිම ක්‍රියාවලියක් සිදු විය. අනුරාධපුර නගරයේ සිට කිලෝමීටර් 65ක් දුරින් පිහිටි පදවිය වැව ව්‍යාපෘතිය හරහා මෙම ක්‍රියාපිළිවෙතම වයඹ දෙසින් පිහිටි අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙමළ බස කතා කරන ප්‍රදේශ දක්වා ද ව්‍යාප්ත කරන ලදී. මෙම ව්‍යාපෘති පුරාම ඉඩම් බෙදාදීමේ රටාව එක හා සමාන මෙන්ම පැහැදිලි එකක් විය: අල්ලෙයි ව්‍යාපෘතිය මඟින් පදිංචිකරුවන් සඳහා වෙන් කළ ඉඩම් කොටස්වලින් සියයට 65ක් ද, කන්තලේ ව්‍යාපෘතිය මඟින් සියයට 77ක් ද සිංහල පදිංචිකරුවන් වෙත ලබා දෙන ලද අතර, ඒ සෑම අවස්ථාවකදීම එහි සිටි දෙමළ සහ මුස්ලිම් ජනතාවට ඉතිරි වූයේ ඉතා සුළු ඉඩම් ප්‍රමාණයකි. මෙහි සමස්ත ජනගහන බලපෑම අතිශයින්ම කැපී පෙනුණි. එනම්, 1946 දී සියයට 15ක් පමණ වූ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සිංහල ජනගහනය 1981 වන විට සියයට 33ක් දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනය ස්වාභාවික ජනගහන වර්ධනයක් ලෙස සැලකිය නොහැකි අතර, එයින් පැහැදිලි වන්නේ සිංහල-බෞද්ධ ජාතිය ගොඩනැඟීමේ මෙවලමක් ලෙස රාජ්‍ය මැදිහත් වීමෙන් සිදුකළ ජනපදකරණයේ ක්‍රමානුකූල ස්වභාවයයි.

1969 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) මූලික සැලැස්මකට අනුව 1960 දශකයේ අගභාගයේදී ඩඩ්ලි සේනානායක රජය යටතේ නව අදියර ආරම්භ වූ, පසුව 1977 දී එක්සත් ජාතික පක්ෂය

(UNP) යළි බලයට පත්වීමෙන් පසු සැලසුම්ගත වසර තිහක කාලය වසර හතක් දක්වා කැපී පෙනෙන ලෙස වේගවත් කරන ලද **මහවැලි සංවර්ධන වැඩසටහන** විසින්, මෙම සැලසුම් සහගත ජනගහන සංයුතිය/ව්‍යුහය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ගුණාත්මක වශයෙන් නවතම මට්ටමකට ගෙන යන ලදී. **බී (B), සී (C), එච් (H) සහ එල් (L) කලාපවල** ජනාවාස පිහිටුවීම මගින් උතුරු සහ නැගෙනහිර පළාත් වෙත අතිමහත් බහුතරයක් වූ සිංහල පදිංචිකරුවන් රැගෙන එන ලදී: එවකට දෙමළ බහුතරයක් සිටි ප්‍රදේශයක් වූ නැගෙනහිර පළාතට මෙම භූමිය අයත් වුවද, එච් (H) සහ සී (C) කලාපවල පදිංචිකරුවන්ගෙන් සිංහල සහ මුස්ලිම් ජාතිකයන් පිළිවෙලින් සියයට 90 ක සහ සියයට 10 ක ජනතාවක් වූ අතර දෙමළ ජනතාව වෙත කිසිදු ඉඩමක් වෙන් කර නොතිබුණි. මෙම සංයුතිය අහඹු එකක් නොවීය; මහවැලි අධිකාරියේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පසුව පිළිගෙන තිබුණේ, විශේෂයෙන්ම **වැලිඔය (මනාල් ආරු)** ප්‍රදේශයේ එල් (L) කලාපය ජනාවාස කිරීම සැලසුම් කර තිබුණේ "දෙමළ ඊළාමේ පැවැත්මට ඇති ඉඩම් පදනම විනාශ කිරීම" සඳහා බවයි. එනම්, උතුරේ දෙමළ ප්‍රදේශ සහ නැගෙනහිර දෙමළ හා මුස්ලිම් වැසියන් සිටින ප්‍රදේශ වෙන් කරන පටු භූමි තීරුව තුළට රජයට පක්ෂපාතී සිංහල ජනගහනයක් ඇතුළු කර, ඔවුන් (දෙමළ ජනතාව) තම මව්බිම ලෙස හිමිකම් කියන ප්‍රදේශය භූගෝලීය වශයෙන් ස්ථිර ලෙසම දෙකඩ කිරීම සඳහාය.[2] වැලිඔය යනු සිංහල ජනපදකරණයේ වඩාත්ම මිලිටරීකරණය වූ ස්වරූපය වූ අතර, 1980 දශකයේ මැද භාගයේ සිට ජනාධිපති ජයවර්ධනගේ සමීපතමයන්ගේ කවයේ සහාය ඇතිව, බෞද්ධ භික්ෂුවකගේ නායකත්වයෙන් යුත් බලමුලු ගැන්වීමක් යටතේ රහසිගතව එහි ජනාවාස පිහිටුවන ලදී. එහිදී පදිංචිකරුවන්ට ආයුධ ලබා දී හමුදාව සමඟ එක්ව ග්‍රාමාරක්ෂකයන් ලෙස යොදවන ලදී.

1985 නොවැම්බර් කලාපයේ ටැමිල් ටයිම්ස් (Tamil Times) පුවත්පත වාර්තා කළ පරිදි, 1985 වසරේදී රජය විසින් පත් කරන ලද "අධ්‍යයන කණ්ඩායමක්" (study group) විසින් දෙමළ බහුතරයක් වෙසෙන උතුරු සහ නැගෙනහිර පළාත් අතර පවතින භූමිය සම්බන්ධ කරන සබැඳිය බිඳ දැමීම සඳහා සිංහල ජනපදකරණය භාවිත කිරීමට පැහැදිලිවම නිර්දේශ කරන ලදී. එම වාර්තාව යෝජනා කළේ, "මෙම ප්‍රදේශය [ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය] ජන වර්ග යා කරන පාලමක් බඳු වන අතර, මෙම කලාපය තුළ සිංහල ජනගහනය පදිංචි කරවීම මගින් දිස්ත්‍රික්ක අතර පවතින මෙම වාර්ගික [දෙමළ] සබැඳිය බිඳ දැමිය හැකි" බවයි. පළාත් සීමා වෙනස් කරමින් සහ නව දිස්ත්‍රික්ක නිර්මාණය කරමින් ශ්‍රී ලංකා සිතියම නැවත ඇඳීම හරහා, උතුරු සහ නැගෙනහිර දෙමළ ප්‍රදේශවල වාර්ගික සංයුතිය වෙනස් කර එහි සිංහල ජනතාව බහුතරය බවට පත් කිරීම ඇතුළු නිර්දේශ අටක් එහි වාර්තා කර තිබුණි. 1985 ජනවාරි 21 වන දින ලොස් ඇන්ජලීස් නිව්ස් (Los Angeles News) පුවත්පත වාර්තා කළ පරිදි, උතුරු පළාතේ ප්‍රමාණවත් තරම් සිංහල ජනතාව පදිංචි කරවීමේ සැලසුම් ජනාධිපති ජයවර්ධන විසින්ම ප්‍රකාශයට පත් කරන ලදී. ආනමඩුව ප්‍රදේශයේ පැවැති ප්‍රසිද්ධ රැස්වීමකදී ඔහු කියා සිටියේ, "අපි ශ්‍රී ලංකාව සලකන්නේ සියයට 75ක් සිංහල සහ සියයට 25ක් වෙනත් ජාතීන්ගෙන් සමන්විත, සියලු පුරවැසියන්ට අයිති එකම භූමියක් ලෙසයි. ඒ අනුව, අපි රජයේ ඉඩම්වල මෙම ප්‍රතිශතයට අනුව දිවයින පුරා ශ්‍රී ලාංකිකයන් පදිංචි කරනු ලබනවා," යනුවෙනි.

මෙය යුද සමයට පමණක් සීමා වූ වැඩපිළිවෙළක් නොවීය. 2009 වසරේදී එල්.ටී.ටී.ඊ. (LTTE) සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමෙන් පසුව ද මෙය යළි ආරම්භ වූ අතර, එහිදී මහවැලි අධිකාරිය සහ ආරක්ෂක අංශ මැදිහත් වී ප්‍රධාන වශයෙන්ම හම්බන්තොට ප්‍රදේශයෙන් ඉඩම් නොමැති සිංහල ජනතාවගේ නව කණ්ඩායම්, පෙර පරිදිම රහසිගත ආකාරයෙන් වැලිඔය ප්‍රදේශයට රැගෙන එන ලදී. තවද, ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ශ්‍රී ලංකා කැබිනට් මණ්ඩලය විසින් 2026 ජනවාරි මාසයේදී මහවැලි එල් (L) කලාපයේ **කිවුල් ඔය** ජලාශ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අනුමැතිය ලබා දීමත්




වවුනියාවේ නෙදුන්කේර්ණී ප්‍රදේශයේ පදිංචිකරුවන් සහ ගොවීන් විසින්, යෝජිත කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවරට එරෙහිව *2026* පෙබරවාරි *2* වන දින විරෝධතාවක් පවත්වන ලදී. මෙමඟින් සිංහල ජනපදකරණයට ඉඩ සැලසෙන බවත්, උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනගහන සංයුතිය වෙනස් වන බවත් ඔවුහු එහිදී චෝදනා කළහ. ඡායාරූපය: ටැමිල් ගාඩියන් *(Tamil Guardian)* අනුග්‍රහයෙනි.

සමඟ මෙම ක්‍රියාවලිය වර්තමානය දක්වාම අඛණ්ඩව සිදුවේ. වාර්තාවලට අනුව මෙම ව්‍යාපෘතිය මගින් දෙමළ ජනතාවට අයත් කුඹුරු ඉඩම් අක්කර 1,600කට වඩා වැඩි ප්‍රමාණයක් පවරා ගැනීමට නියමිත අතර, එහි පදිංචි කිරීමට අපේක්ෂිත 7,000කට අධික පිරිස සම්පූර්ණයෙන්ම පාහේ සිංහල ජාතිකයන් බව පැවසේ. එහිදී දශක ගණනාවක් තිස්සේ එම ප්‍රදේශයේ වගා කටයුතුවල නිරත වූ දෙමළ ප්‍රජාව වෙනුවෙන් කිසිදු ඉඩමක් වෙන් කර නොමැති බව වාර්තා වේ.




මුලතිව්, කේප්පාපිලව් ප්‍රදේශයේ පදිංචිකරුවන් විසින් *2009* වසරේ සිට හමුදා පාලනය යටතේ පවතින තම 'පාරම්පරික ඉඩම්' සහ පොදු දේපළ නැවත ලබා දෙන ලෙස ඉල්ලා, *2026* පෙබරවාරි *5* වන දින අඛණ්ඩව *12* වන දිනටත් විරෝධතාවක නිරත වූහ. ඡායාරූපය: කුමනන් කණා *(Kumanan Kana)* අනුග්‍රහයෙනි.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේ ජාතික සංවර්ධනය සහ ඉඩම් ප්‍රතිසංස්කරණය යන ලේබලයන් යටතේය. නමුත් ඒවා කිසිසේත්ම එවැනි දේ නොවීය. ඒවා මගින් සමස්ත දිස්ත්‍රික්කවලම වාර්ගික සංයුතිය වෙනස් කරන ලද අතර, දෙමළ බහුතරයක් වෙසෙන භූමියේ පවතින භූගෝලීය අඛණ්ඩතාව කැබලි කර දමන ලදී. මෙය දෙමළ ජාතිකවාදී දේශපාලනයට සහ පසුව ඇති වූ සන්නද්ධ ගැටුමට පාදක වූ ප්‍රධානතම දුක්ගැනවිලිවලින් එකක් බවට පත් විය. 1983 දී පුපුරා ගිය යුද්ධය සහ උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පැවැති හමුදා පාලනය මෙම ජනාවාසකරණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ආවරණය සපයා දුන්නේය. 2012 වසරේදී ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) වාර්තා කළ පරිදි, යුද පශ්චාත් සමයේදී රාජපක්ෂ රජය විසින් ක්‍රමානුකූල 'සිංහලීකරණ' ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. එහිදී දෙමළ ග්‍රාම නාම සිංහල භාෂාවට හැරවීම, බුදු පිළිම ඉදිකිරීම සහ "දේශපාලනික මෙන්ම සමාජීය වශයෙන් බලපෑම් සහගත වන අයුරින් ජනගහන සමතුලිතතාව වෙනස් කිරීම" [3] සඳහා සිංහල පදිංචිකරුවන් උතුරු දෙසට සංක්‍රමණය කරවීම සිදු කරන ලදී. එහිදී හමුදාව විසින් ඉඩම් බෙදාදීමේ කටයුතු පාලනය කළ අතර, අවතැන් වූ දෙමළ ජනතාවට නැවත ඔවුන්ගේ ගම්බිම් වෙත පැමිණීම වළක්වන ලදී.

මෙම ජනපදකරණ ව්‍යාපෘති හරහා උතුරු සහ නැගෙනහිර පළාත්වල පදිංචි කරවන ලද සිංහල ගොවි ජනතාව ද මෙම වාර්ගිකවාදී මූලෝපායයේම ගොදුරු බවට පත් වූවෝ වෙති. ආරම්භක පෙළඹවීම් ලෙස ඔවුන් වෙත ඉඩම් සහ රාජ්‍ය ආධාර ලබා දුන්නද, පසුව ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට දැඩි දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය. මිලිටරිමය වශයෙන් අනාරක්ෂිත මායිම් කලාපවල ඔවුන්ව පදිංචි කරවීම හේතුවෙන්, ඔවුහු LTTE සහ අනෙකුත් සන්නද්ධ කණ්ඩායම්වල මාරාන්තික ප්‍රහාරවලට නැවත නැවතත් ලක් වූහ. එසේ වුවද, ඔවුන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් හෝ දිගුකාලීන ආර්ථික සුරක්ෂිතතාවක් ලබා දීමට රජය නිරන්තරයෙන්ම අසමත් විය. බොහෝ පදිංචිකරුවන්ගේ පවුල්වලට පොරොන්දු වූ ජීවන තත්ත්වයන්ගේ දියුණුව කිසිදා උදා නොවීය. එසේ වුවද, මෙම ව්‍යාපෘති මගින් ඓතිහාසිකව දෙමළ බහුතරයක් සිටි ප්‍රදේශවල ජනගහන සංයුතිය දැඩි ලෙස සහ ස්ථිර ලෙසම වෙනස් කරන ලදී. පර්යේෂණ විශාල ප්‍රමාණයකින් ලේඛනගත කර ඇති පරිදි, මෙම ප්‍රතිඵලය අහඹු එකක් නොවූ අතර එය අනුප්‍රාප්තික රජයන්හි ප්‍රධාන දේශපාලන අරමුණක් විය. මෙම වෛෂයික වාර්තා මගින් පැහැදිලි වන්නේ, වාර්ගිකවාදී බෙදීම් හරහා භෞමික සහ දේශපාලන අධිකාරිය තහවුරු කර ගැනීමේ පුළුල් මූලෝපාය වෙනුවෙන්, මෙම සිංහල-ස්වෝත්තමවාදී රාජ්‍යය විසින් දෙමළ ජනතාවගේ මෙන්ම දුප්පත් සිංහල පදිංචිකරුවන්ගේ ද සුභසාධනය යටපත් කරන ලද බවයි. මෙහිදී සිංහල ගොවි ජනතාව යොදවන ලද්දේ මෙම ව්‍යාපෘතිවල ප්‍රධාන ප්‍රතිලාභීන් ලෙස නොව, වාර්ගික ධ්‍රැවීකරණය හරහා ධනේශ්වර පාලනය රැක ගැනීම මුල් කරගත් ප්‍රතිගාමී රාජ්‍ය ප්‍රතිපත්තියක මෙවලම් ලෙසය.

**දෙමළ ඊළාමය යනු ශ්‍රී ලංකාවේ ගාසා තීරයයි**

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත් තුළ අඛණ්ඩව සිදුවන මිලිටරීකරණය, සිංහල-බෞද්ධ ස්වෝත්තමවාදී රාජ්‍යයේ අනුග්‍රහය ඇතිව සිදු කෙරෙන ඉඩම් කොල්ලකෑම් සහ සිංහල ජනාවාස පිහිටුවීම් මෙන්ම, 1980 දශකයේ මුල් භාගයේ සිට දෙමළ ජනතාවට එරෙහිව සිදු කරන ලද මිලේච්ඡ ක්‍රියා, ආක්‍රමණයට ලක්ව ඇති පලස්තීනය (occupied Palestine) සමඟ පැහැදිලි සමානකමක් පෙන්නුම් කරයි. මෙම සමානකම අහම්බයක් නොවේ. ශ්‍රී ලංකාවේ පාලක පන්තිය සයොන්වාදී ජනාවාස-යටත්විජිතවාදය (Zionist settler-colonialism) පූර්වාදර්ශයක් ලෙස අධ්‍යයනය කර තමන්ට ගැළපෙන පරිදි සකස් කරගත් බවත්, 1980 දශකයේ දී ඊශ්‍රායල සහ ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන අතර සෘජු උපදේශන සබඳතා පැවති බවත් සාක්ෂි සහිතව වාර්තා වී ඇත. මේවායේ දෘෂ්ටිවාදී පදනම් පුදුමාකාර ලෙස සමාන ය. 1948 නක්බා (Nakba) ජන හිංසනයේ සිට සයොන්වාදී දෘෂ්ටිවාදය ගොඩනැඟී ඇත්තේ, පලස්තීනයේ ස්වදේශික (indigenous) ජනගහනයේ පැවැත්ම අතුගා දමමින්, භූමිය සඳහා තමන්ට දිව්‍යමය සහ ඓතිහාසික අයිතියක් ඇති බවට කෙරෙන යටත්විජිතවාදී කියාපෑම මත ය. එලෙසම, සිංහල-බෞද්ධ ස්වෝත්තමවාදය පදනම් වී

ඇත්තේ දෙමළ ජනතාව ඓතිහාසිකව මේ දිවයින ආක්‍රමණය කළ පිරිසක්ය යන අසත්‍ය සහ කාල විරෝධී (anachronistic) කියාපෑම මත ය. මෙම මිථ්‍යා ප්‍රබන්ධය මඟින් උතුරු සහ නැගෙනහිර පළාත්වල සියවස් ගණනාවක් පුරා පැවති දෙමළ ජනතාවගේ පැවැත්ම ප්‍රතික්ෂේප කෙරෙන අතර, ඔවුන් සතු දේ අහිමි කිරීමට අවශ්‍ය දෘෂ්ටිවාදී ආවරණය ද සපයයි. මෙම දෘෂ්ටිවාද දෙකෙහිම ප්‍රායෝගික ස්වරූපය එක හා සමාන වී ඇත: එනම් රාජ්‍ය අනුග්‍රහය සහිතව ජන සංයුතිය වෙනස් කිරීමේ අරමුණින්ම ජනාවාස පිහිටුවීමයි. පලස්තීනයේ, පලස්තීන භූමිය කැබලි කිරීමට, ජලය හා ඉඩම් සම්පත් අත්පත් කර ගැනීමට සහ ස්වෛරී පලස්තීන රාජ්‍යයක් බිහිවීම වැළැක්වීමට සයොන්වාදී ජනාවාස ක්‍රමානුකූලව ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකාව තුළ, 1949 ගල්ඔය ව්‍යාපාරයේ සිට මහවැලි සංවර්ධන වැඩසටහන හරහා පශ්චාත් යුද සමයේ මිලිටරි ජනාවාස දක්වා, රාජ්‍යය විසින් ඓතිහාසිකව දෙමළ ජනතාව බහුතරයක් ජීවත් වූ ප්‍රදේශවල සිංහල ගොවීන් පදිංචි කරවා ඇත. ඒ, ජනගහන සිතියම වෙනස් කිරීමට, භූගෝලීය අඛණ්ඩතාව බිඳ දැමීමට සහ "දෙමළ ඊළාමේ පැවැත්මට ඇති ඉඩම් පදනම විනාශ කිරීම" ට ය. මෙම අවස්ථා දෙකේදීම දේශපාලන අරමුණ වූයේ හුදෙක් භූමිය අත්පත් කර ගැනීම පමණක් නොව, කම්කරු පන්තියේ එකමුතුකම වැළැක්වීම සඳහා වාර්ගිකවාදී බෙදීම් හිතාමතාම ශක්තිමත් කිරීමයි. එමෙන්ම මෙම අවස්ථා දෙකේදීම, ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් – එහිදී, විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදය – මෙම ව්‍යාපෘති සඳහා දේශපාලන ආවරණය, මිලිටරි සහාය සහ රාජ්‍ය තාන්ත්‍රික ආරක්ෂාව සපයා දී ඇත. මේ අවස්ථා දෙකේදීම, සිවිල් ජනතාව ජාතික පීඩනයට එරෙහිව නැගී සිටි විට ඔවුන්ව දැඩි මිලිටරි ප්‍රහාරයන්ට ලක් කරන ලදී. ගාසා තීරයට එල්ල කෙරෙන ජන සංහාරක ප්‍රහාරය මෙන්ම, 2009 වසරේ මුල්ලිවයික්කාල්හිදී දස දහස් සංඛ්‍යාත දෙමළ ජනතාවක් ඝාතනය කිරීම ද දශක ගණනාවක් තිස්සේ පැවති ආක්‍රමණය, ජනාවාසකරණය සහ වාර්ගික ශුද්ධකිරීම්වල ලේවැකි උච්චතම අවස්ථාව විය. දෙමළ ඊළාමය යනු ශ්‍රී ලංකාවේ ගාසා තීරයයි. එය හුදු අලංකාරෝක්තියක් නොවේ. එය පලස්තීනයේ හෝ ශ්‍රී ලංකාවේ වේවා, පීඩිත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මර්දනය කිරීමට සහ කම්කරු පන්තිය වාර්ගික පදනමින් බෙදා වෙන් කිරීමට, ජනාවාස-යටත්විජිතවාදය, වාර්ගිකවාදී යුද්ධය සහ ස්ථිර මිලිටරි ආක්‍රමණයන් භාවිත කරන ධනේශ්වර ජාතික රාජ්‍යයේ එකම තර්කනයේ ප්‍රතිඵලයකි.

**වර්ගිකවාදයේ පන්තිමය තර්කනය**

ජනගහන ව්‍යුහය/සංයුතිය වෙනස් කිරීමේ ප්‍රතිපත්ති මඟින් දෙමළ සහ සිංහල කම්කරුවන් අතර එකමුතුකමක් ප්‍රවර්ධනය වී නැත. ඒ වෙනුවට ඒවා මඟින් සිදු වී ඇත්තේ අන්‍යෝන්‍ය අවිශ්වාසය සහ වාර්ගික බෙදීම් තවදුරටත් දැඩි වීමයි. මෙය කම්කරු පන්තියේ ස්වාධීන එකමුතුකම දුර්වල කරමින් සිංහල පාලක පන්තියේ අවශ්‍යතාවලට සේවය කරන අතර, එමඟින්ම වාර්ගික බෙදීම් තවදුරටත් තහවුරු කිරීමට සහ බෙදුම්වාදය සඳහා වන සහයෝගය ශක්තිමත් කිරීමට දෙමළ ජාතිකවාදී ධනේශ්වර නායකයන්ට අවශ්‍ය දේශපාලන මෙවලම් ද සපයයි. සිංහල පාලක පන්තිය සහ දෙමළ ධනේශ්වර ජාතිකවාදීන් යනු සැබෑ ප්‍රතිවාදීන් නොවේ. ඔවුහු එකිනෙකා මත යැපෙන්නෝ (symbiotic) වෙති. එක් පාර්ශවයක් අනෙක් පාර්ශවය මත පෝෂණය වන අතර, ඔවුන් දෙපාර්ශවයේම පැවැත්ම රඳා පවතින්නේ දෙමළ, සිංහල සහ මුස්ලිම් කම්කරුවන් පන්තිමය පදනමක් මත එකමුතු වීම වැළැක්වීම මත ය.

උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදුකරන ජනගහන ව්‍යුහය වෙනස් කිරීම මඟින් නිශ්චිත පන්තිමය කාර්යභාරයක් ඉටු කෙරේ. එමඟින් සිංහල පදිංචිකරුවන්ට ඉඩම් සහ අනුග්‍රහය ලබා දෙන අතර, එම වාර්ගිකවාදී වැඩපිළිවෙළ තුළින් ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබන කණ්ඩායම්වල සමාජ පදනමක් ද ගොඩනගයි. එය වැඩකරන ජනතාව වාර්ගික පදනමින් බෙදා වෙන් කරන අතර, එමඟින් දෙමළ සහ සිංහල කම්කරුවන්ට තමන්ට පොදු වූ අවශ්‍යතා හඳුනා ගැනීම වඩාත් දුෂ්කර කරයි. තවද, ස්වාධීන කම්කරු පන්ති දේශපාලනයක් මතු වීම වළක්වන බෙදීම් තවදුරටත් ශක්තිමත් කරමින්, (දෙමළ) වාර්ගික සහයෝගීතාවය ගොඩනැගීම සඳහා දෙමළ ජාතිකවාදී ධනේශ්වර පන්තියට අවශ්‍යම දුගැනවිලි ද මෙයින් සපයා දෙයි.

මෙය වළක්වා ගත නොහැක්කක්ව තිබුණේ නැත. සමාජවාදී සමානතා පක්ෂයේ (SEP) සහ ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වයේ (SLLA) ට්‍රොට්ස්කිවාදී පූර්වගාමියා වූ ඉන්දියානු බෝල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂය (BLPI), 1940 ගණන්වලදී වඩාත්ම පන්ති-සවිඥානික (පන්ති අවබෝධයක් ඇති) කම්කරුවන්ගේ පක්ෂපාතිත්වය දිනාගෙන තිබුණි. බ්‍රිතාන්‍ය යටත්විජිත කාර්යාලය විසින් සූදානම් කරන ලද ව්‍යාජ නිදහස ප්‍රතික්ෂේප කිරීම සඳහා, 1948 පෙබරවාරි 4 වන දින එම පක්ෂය ගාලු මුවදොර පිටියට දෙමළ, සිංහල සහ මුස්ලිම් කම්කරුවන් 50,000ක් බලමුලු ගැන්වීය. වතුකරයේ දෙමළ කම්කරුවන්ගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම මගින් වෙනස්කොට සැලකීමේ දාමයක් ආරම්භ වන බවට BLPI පක්ෂය අනතුරු ඇඟවීය. ව්‍යවසනය ළඟා වූයේ ලංකා සමසමාජ පක්ෂයේ (LSSP) දේශපාලන පිරිහීමත් සමගය. හතරවන ජාත්‍යන්තරයේ පැබ්ලෝවාදී සංශෝධනවාදීන්ගේ දිරිගැන්වීම මත, සමසමාජ පක්ෂ නායකයෝ බණ්ඩාරනායකගේ සිංහල ජනතාවාදයට (Sinhala populism) ක්‍රමයෙන් අනුගත වෙමින්, 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (SLFP) ආණ්ඩුවට ඇතුළු වූහ. 1972 වන විට, හිටපු ට්‍රොට්ස්කිවාදියෙකු වූ කොල්වින් ආර්. ද සිල්වා, බුද්ධාගම රාජ්‍ය ආගම ලෙසත් සිංහල භාෂාව එකම රාජ්‍ය භාෂාව ලෙසත් තහවුරු කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරමින් සිටියේය. මෙය 1948 දී ඔහු සටන් කළ සෑම දෙයක්ම සෘජුවම ප්‍රතික්ෂේප කිරීමක් විය. සමසමාජ

පක්ෂයේ මෙම පාවාදීම, කම්කරු පන්තියේ ස්වාධීන විප්ලවවාදී ව්‍යාපාරයක වර්ධනය අඩාල කළ අතර, එය සිංහල ග්‍රාමීය තරුණයන් අතර ජනතා විමුක්ති පෙරමුණත් (JVP), දෙමළ තරුණයන් අතර එල්.ටී.ටී.ඊ. (LTTE) සංවිධානයත් ඇතිවීමට මග පාදා දුන්නේය.

**ඉදිරි මාවත**

රාජ්‍යය මැදිහත් වී සිදුකරන ජනගහන ව්‍යුහය වෙනස් කිරීම් මගින් කිසිදු ජනකොටසක ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරක්ෂිත කළ නොහැක. ඒ සඳහා, තමන්ගේම පැවැත්ම වෙනුවෙන් ක්‍රමානුකූලව වාර්ගික බෙදීම් උපයෝගී කරගත් ධනේශ්වර රාජ්‍යයට සහ වාර්ගිකවාදයට එරෙහිව දෙමළ, සිංහල සහ මුස්ලිම් කම්කරුවන්ගේ සවිඥානික දේශපාලන එක්සත්කමක් අවශ්‍ය වේ.

දේශපාලන අභිප්‍රායන් මත ක්‍රියාත්මක වූ ජනාවාසකරණ ව්‍යාපෘති මගින් ජනකොටස් (communities) නැවත පදිංචි කර ඇති ස්ථානවල, අනාගතයේදී සිදුකරන ඕනෑම විසඳුමක්ම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරකින, ස්වේච්ඡාවෙන් සිදුවන, ප්‍රමාණවත් වන්දි සහ ජීවනෝපාය සහතික කෙරෙන, මෙන්ම පීඩාවට පත් ජනතාව සමග සාකච්ඡා කර තීරණය කරනු ලබන එකක් විය යුතුය; එය වාර්ගිකවාදී අරමුණු මුදුන්පත් කරගැනීම වෙනුවෙන් රාජ්‍යය විසින් බලයෙන් පටවනු ලැබූවක් නොවිය යුතුය. එහෙත්, එවැනි ප්‍රජාතන්ත්‍රවාදී පියවරයන් පවා සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කරගත හැක්කේ, පාලන මෙවලමක් ලෙස වාර්ගිකවාදය (communalism) උපදවන්නා වූ ධනේශ්වර ක්‍රමයට එරෙහි පුළුල් දේශපාලන අරගලයක් තුළින් පමණි.

සිංහල ආධිපත්‍යවාදය (supremacism) හෝ දෙමළ බෙදුම්වාදය වේවා, කම්කරු පන්තිය විසින් සියලු ආකාරයේ ජාතිකවාදයන් සහ වාර්ගිකවාදයන් ප්‍රතික්ෂේප කළ යුතුය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) සමාජවාදී ජාත්‍යන්තරවාදී වැඩපිළිවෙලට සහයෝගය දක්වමින්, ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) කම්කරු-ගොවි ආණ්ඩුවක් වෙනුවෙන් සහ ආගම, වර්ගය, කුලය මෙන්ම ස්ත්‍රී-පුරුෂ භාවය මත පදනම් වූ දශක ගණනාවක වෙනස්කොට සැලකීම් හා පීඩනයන් අහෝසි කිරීම සඳහා සැබෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවක් කැඳවීම වෙනුවෙන් සටන් කරයි. **ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහතික කළ හැක්කේ සමාජය සමාජවාදී පරිවර්තනයකට ලක් කිරීම තුළින් සමාජ අසමානතාවය අවසන් කිරීමෙන් පමණි.**

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI), දකුණු ආසියානු එක්සත් සමාජවාදී රාජ්‍යයන්ගේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාවේ සහ [දෙමළ] ඊළාම් එක්සත් සමාජවාදී සමූහාණ්ඩුවක් පිළිබඳ ඉදිරිදර්ශනය ඉදිරිපත් කරයි. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI) පවසන 'දෙමළ ඊළාමය' යනු LTTE සංවිධානයේ ධනේශ්වර ඊළාමය නොවේ. එය කම්කරු රාජ්‍යයක් මගින් සහතික කරනු ලබන, ස්වේච්ඡාවෙන් එකතු වූ සමාජවාදී සමූහාණ්ඩුවක ව්‍යවස්ථාපිත කොටසක් වන, සමාජවාදී දෙමළ ඊළාමයකි. මෙය ධනේශ්වර ජාතික රාජ්‍යයන් අතර සාකච්ඡා සඳහා වූ රාජ්‍ය තාන්ත්‍රික සූත්‍රයක් නොවේ. එය විප්ලවවාදී ක්‍රියාමාර්ගයක් සඳහා වූ මගපෙන්වීමකි. එනම්, සිංහල සහ දෙමළ කම්කරුවන් තමන්ගේ පොදු පන්ති සතුරාට එරෙහිව පොදු අරගලයකට ඒකාබද්ධ කිරීමයි. 1987 හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශය පැහැදිලි කළ පරිදි, කම්කරු පන්තිය පීඩිත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන්නේ "ජාතික ධනේශ්වර පන්තියේ අනුබද්ධ කොටසක් ලෙස නොව, එහි ක්ෂමා විරහිත සතුරා ලෙසය."[4] කෙතරම් නිර්භීත හෝ සටන්කාමී වුවද, ජාතීන්ට **ස්වයං-නීර්ණ** අයිතිය ලබා ගැනීම ධනේශ්වර සහ සුළු-ධනේශ්වර ව්‍යාපාර හරහා සාක්ෂාත් කරගත නොහැක; එය සාක්ෂාත් කරගත හැක්කේ නිර්ධන පන්තිය විසින් මෙහෙයවනු ලබන සමාජවාදී විප්ලවයේ අතුරු ඵලයක් ලෙස පමණි. එමගින් තමන්ගේ ආඥාදායකත්වය (පාලනය) පිහිටුවීමෙන් පසු, ස්වේච්ඡාවෙන් එක්සත් වූ සමාජවාදී සමූහාණ්ඩුවක් තුළ සියලු පීඩිත ජනතාවට ඔවුන්ගේ සුජාත ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහතික කෙරේ.

එසේ නම්, මෙම ප්‍රතිගාමී වැඩපිළිවෙලවල් යටතේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පදිංචි කරවා ඇති සිංහල ගොවි ජනතාවට ඇති ඉදිරි මාවත කුමක්ද? දැනටමත් එහි පදිංචි කරවා වසර ගණනාවක් තිස්සේ සින්නක්කර ඔප්පු ලබා දී ඇති අය – ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් දශක ගණනාවක් එහි ජීවත් වී ඇති, දරු පවුල් හැදූ සහ වෙනත් කිසිදු නවාතැනක් ගැන නොදන්නා අයයි – සඳහා වන ඕනෑම විසඳුමක් ප්‍රජාතන්ත්‍රවාදී සහ ස්වේච්ඡාවෙන් සිදුවන එකක් විය යුතු අතර, එය දඬුවම් දීමේ ස්වභාවයක් නොගත යුතුය. ඔවුන්ගේ ජීවිතවල සහ දේපළවල ආරක්ෂාව, පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මෙන්ම ඔවුන්ගේ දෙමළ සහ මුස්ලිම් අසල්වැසියන් සමග එම කලාපයේ ආර්ථික හා සමාජීය ජීවිතයට සමාන ලෙස දායක වීමේ අයිතිය ඔවුන්ට සහතික කළ යුතුය. එහි පදිංචි කරවා ඇති නමුත් කිසි දිනක විධිමත් සින්නක්කර ඔප්පු ලබා නොදුන් අය සඳහා, බලපෑමට පත් සියලුම ජනකොටස් සමග සාකච්ඡා කර තීරණය කරනු ලබන කොන්දේසි මත රාජ්‍යය විසින් ඔවුන්ගේ භුක්ති විඳීමේ අයිතිය විධිමත් කළ යුතුය; නැතහොත් ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි වීමට තෝරා ගන්නේ නම්, ඔවුන්ට ප්‍රමාණවත් වන්දි සහ ජීවනෝපාය සහතිකයන් සැපයිය යුතුය. වර්තමානයේ ක්‍රියාත්මක වාර්ගිකවාදී ව්‍යාපෘතියේ වඩාත්ම සක්‍රීය පෙරමුණ වන, නව ජනාවාස ව්‍යාපෘති වෙත රාජ්‍යය විසින් අද පොළඹවා ගනු ලබන සිංහල ජනතාව සඳහා ඇති පිළිතුර වන්නේ එය ප්‍රතික්ෂේප කිරීමයි. සිංහල-ස්වෝත්තමවාදී රාජ්‍යය විසින් ජනගහන සංයුතිය වෙනස් කිරීමේ ඉත්තන් ලෙස තමන්ට පවරා ඇති කාර්යභාරය සිංහල කම්කරුවන්,

තරුණයන් සහ ගොවීන් විසින් ප්‍රතික්ෂේප කළ යුතුය. අද ඔවුන්ට ඉඩම් ලබා දෙන රාජ්‍යය, ඔවුන්ට පෙර සිටි පදිංචිකරුවන්ගේ පරම්පරා ගණනාවක් අත්හැර දැමුවා සේම, ඔවුන්ගේ දේශපාලන ප්‍රයෝජනය අවසන් වූ පසු හෙට දින ඔවුන්ව ද අත්හැර දමනු ඇත. සිංහල ගොවීන්ගේ සැබෑ යහපත පවතින්නේ දෙමළ සහ මුස්ලිම් වැඩකරන ජනතාවට අහිමි කරමින් ඔවුන්ගෙන් සොරකම් කළ ඉඩම් ලබා ගැනීම තුළ නොව, තමන් සියලු දෙනාම සූරාකන සහ බෙදා වෙන් කරන ධනේශ්වර ක්‍රමයට එරෙහි පොදු අරගලයකදී එම වැඩකරන ජනතාව සමග අත්වැල් බැඳගැනීම තුළය.

අනෙකා බැහැර කරන වාර්ගික පදනමක් මත සීමා මායිම් ලකුණු කිරීම හෝ එක් ජනකොටසකට එරෙහිව තවත් ජනකොටසක් යොදවමින් සිදුකරන ජනගහන සංයුතිය වෙනස් කිරීම තුළ කම්කරු පන්තියට කිසිදු යහපතක් නැත. විවිධ ජනවාර්ගික කණ්ඩායම් විවිධ රාජ්‍යයන් ලෙස වෙන් විය යුතුය යන අදහස ඔවුන් ප්‍රතික්ෂේප කළ යුතුය. අපගේ භාවිතයේදී “දෙමළ ඊළාමය” යන භූමියෙන් අදහස් කරන්නේ උතුරු සහ නැගෙනහිර පළාත්ය. එනම්, දෙමළ ජනතාව ඓතිහාසිකව සාන්ද්‍රගත ප්‍රජාවක් ලෙස ජීවත් වූ, ජාතික පීඩනය වඩාත්ම උග්‍ර වූ සහ දෙමළ ජාතිකවාදී ව්‍යාපාරය විසින් ඓතිහාසිකව වෙනම දෙමළ රාජ්‍යයක් සඳහා වූ ඉල්ලීම මතු කරන ලද ප්‍රදේශයන්ය. එහෙත්, අප එසේ කරන්නේ ස්වයං-නීර්ණ අයිතිය පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම සහ සමාජවාදය සඳහා වූ අරගලය පදනම් කරගනිමින්, එක්සත් සමාජවාදී රාජ්‍යයන් (United Socialist States) පිළිබඳ රාමුව තුළය; එය දෙමළ ජනතාවගේ වාර්ගික බහිෂ්කාරකතාවය (exclusivity), වාර්ගික අනන්‍යතාවය මත පදනම් වූ ආදිකල්පික උරුමයක් පිළිබඳ ජාතිකවාදී “නිජබිම” පිළිබඳ හිමිකම් පෑම් හෝ දෙමළ ධනේශ්වර පන්තියේ සිතියම්විද්‍යාමය (cartographic) මවාපෑම් මත පදනම් වූවක් නොවේ. කම්කරු පන්තියේ සැබෑ යහපත පවතින්නේ සමාජය සමාජවාදී පරිවර්තනයකට ලක් කිරීම තුළින් සමස්ත ධනේශ්වර වාර්ගිකවාදී පාලන ක්‍රමයම අහෝසි කිරීම තුළය. සිංහල කම්කරුවන්, තරුණයන් සහ ගොවීන්, රාජ්‍ය අනුග්‍රහය ලත් ජනාවාසකරණ ප්‍රතිපත්තිවල ප්‍රතිගාමී ස්වභාවය සහ දශක ගණනාවක් තිස්සේ ඒවායින් ඇති කර ඇති විනාශකාරී ප්‍රතිඵල හඳුනාගත යුතුය. දෙමළ කම්කරුවන්ගේ මිතුරන් සොයාගත හැක්කේ දෙමළ ධනේශ්වර පන්තියේ බෙදුම්වාදී නායකත්වයන් තුළ නොව, ඔවුන්ගේ සිංහල සහ මුස්ලිම් පන්ති සහෝදර සහෝදරියන් අතරය. වාර්ගික අරමුණු මත පදනම් වූ ජනගහන සංයුතිය වෙනස් කිරීමට එරෙහි සටන, සමාජවාදය සඳහා වූ සටනෙන් වෙන් කළ නොහැක.

**අපි පැහැදිලිව තේරුම් ගනිමු**

යුද්ධයෙන් වසර දහහතකට පසුව, අත්පත් කරගනු ලැබූ තමන්ගේ ඉඩම් නැවත ලබාගැනීමට දෙමළ ජනතාවට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය කිසිදු කොන්දේසියකින් තොරව තහවුරු කළ යුතුය. තනි තනි දෙමළ පුද්ගලයන් සතුව නිල ඉඩම් ඔප්පු තිබේද නැද්ද යන්න ඔවුන්ගේ අයිතිවාසිකමේ සුජාතභාවයට අදාළ නොවේ. මේවා ඓතිහාසිකව දෙමළ ජනාවාස ප්‍රදේශ (neighbourhoods) වේ — එනම් දෙමළ ජනයා ඓතිහාසිකව සංකේන්ද්‍රගත වී සිටි, ඔවුන්ගේ නිවාස, දෙමළ ගම්මාන සහ සංස්කෘතික ස්ථාන පිහිටා තිබූ ප්‍රදේශ වේ. රාජ්‍යය විසින් නිකුත් කරන ලද ලේඛන නොමැති වීම මඟින්, තමන්ගේ ප්‍රජාව (community) පරම්පරා ගණනාවක් තිස්සේ ජීවත් වූ ඉඩම් සඳහා ජනතාවකට ඇති අයිතිය අහෝසි වන්නේ නැත. ඊට පටහැණිව, වාඩිලාගෙන සිටින / ආක්‍රමණික රාජ්‍යය විසින් ක්‍රමානුකූලව ඉඩම් ඔප්පු අහිමි කිරීම හෝ විනාශ කිරීම යනුම ඉඩම් අහිමි කිරීමේ (dispossession) මෙවලමක් මිස, නැවත ඉඩම් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වන යුක්තිසහගත පදනමක් නොවේ.

තමන්ගේම ජනාවාස ප්‍රදේශ සඳහා දෙමළ ජනතාවට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පිළිගත යුතු අතර එය නැවත ස්ථාපිත කළ යුතුය. මෙය වාර්ගික පරම (බහිෂ්කාරක) අයිතියක් (ethnic exclusivity) සඳහා කියාපෑමක් නොවේ. වෙනත් කිසිදු වාර්ගික ප්‍රජාවක සාමාජිකයෙකුට, රාජ්‍යයේ මැදිහත්වීමකින් තොරව, තමන්ගේ ස්වේච්ඡාවෙන් මෙම ප්‍රදේශවල පදිංචි වීමට කිසිදු බාධාවක් නොමැත. මෙහිදී තහවුරු කරනු ලබන අයිතිය යනු වාර්ගිකව පිරිසිදු භූමියක් සඳහා වන ධනපති-ජාතිකවාදී ඉල්ලීම නොව, ඓතිහාසිකව පීඩාවට පත් වූ ජනතාවකට තමන්ගේ සම්ප්‍රදායික ජනාවාස ප්‍රදේශවලට, තමන්ගේ ඓතිහාසික ගම්මාන සහ නගර වෙත — එනම් වාර්ගිකවාදී යුද්ධය, මිලිටරි වාඩිලෑම සහ රාජ්‍ය අනුග්‍රහය ලත් ජනපදකරණය මඟින් තමන්ව පන්නා දමන ලද ස්ථානයන් වෙත — නැවත පැමිණ ජීවත් වීමට ඇති අනුලංගනීය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියයි. මාක්ස්වාදීන් පිළිගන්නා පරිදි ඉඩම් සඳහා වන කිසිදු අනන්‍ය/පරම වාර්ගික අයිතියක් නොමැත. නමුත් ප්‍රජාවක සම්ප්‍රදායික ජනාවාස ප්‍රදේශවල, එනම් තමන්ගේ ඓතිහාසික ගම්මාන සහ නගර ලෙස පිළිගැනෙන ප්‍රදේශවල, පොදු සංස්කෘතියක් භුක්ති විඳි එකම ජනවාර්ගිකත්වයට (ethnicity) අයත් ජනයාට එකී ඉඩම්වල පදිංචි වී සිටීමට අනුලංගනීය අයිතියක් ඇත.

මෙම විලක්ෂණය(වෙනස) අතිමූලික වේ. සිංහල-ස්වෝත්තමවාදී රාජ්‍යය දශක ගණනාවක් තිස්සේ මෙම අයිතිය ක්‍රමානුකූලව උල්ලංඝනය කර ඇත — එනම් ගල්ඔය සහ මහවැලි ජනපදකරණ ව්‍යාපෘති හරහා, 1980 සහ 1990 දශකවල සිදුකළ සමූහ නෙරපා හැරීම් හරහා, 2009 සංහාරයෙන් පසුව සිදුකළ මිලිටරියේ ඉඩම් අත්පත් කරගැනීම් හරහා, සහ දෙමළ පවුල්වලට නැවත පැමිණීම තහනම් කරන ලද ඉඩම්වල සිංහල ජනපදිකයින් (colonists) පදිංචි කරවීමේ දැනටත් ක්‍රියාත්මක වන ප්‍රතිපත්තිය හරහා ය. මෙම අත්පත් කරගැනීම් සාධාරණීකරණය කිරීම සඳහා රාජ්‍යය නිල නීතිමය හිමිකම් වල අවශ්‍යතාවය කියා පායි, නමුත් එකී නීතිමය රාමුවම එම වාර්ගිකවාදී ව්‍යාපෘතියේම නිර්මිතයකි. අයිතිවාසිකම්වල අවසන් තීරකයා ලෙස

රාජ්‍යයේ නීතිමය හිමිකම පිළිගැනීම යනු ඉඩම් අහිමි කිරීමේ යුක්තියුක්තභාවය පිළිගැනීමකි.

දෙමළ ජනාවාස ප්‍රදේශ, ගම්මාන සහ නගර නැවත ස්ථාපිත කිරීම යනු කම්කරු පන්තිය පෙරමුණ ගෙන ආරක්ෂා කළ යුතු ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීමකි. ඒ සඳහා උතුරෙන් සහ නැඟෙනහිරෙන් මිලිටරිය වහාම සහ කොන්දේසි විරහිතව ඉවත් කරගැනීම, අත්පත් කරගත් ඉඩම්වල පිහිටුවා ඇති අධි ආරක්ෂිත කලාප සහ හමුදා කඳවුරු ඉවත් කිරීම, සහ වාඩිලාගෙන සිටින ඉඩම් ඒවායේ සම්ප්‍රදායික දෙමළ වැසියන්ට (inhabitants) නැවත ලබාදීම අවශ්‍ය වේ. රාජ්‍ය අනුග්‍රහය ලත් ව්‍යාපෘති හරහා පදිංචි කරන ලද සිංහල ජනපදිකයන් — විශේෂයෙන් කිසිදා නිල හිමිකම් පත්‍ර නොලැබූ අය — මෙම වාඩිලෑම පවත්වාගෙන යාම සඳහා රාජ්‍යය විසින් මිනිස් පලිහක් ලෙස යොදා නොගත යුතුය. පිටස්තර පදිංචිකරුවන් දශක ගණනාවක් තිස්සේ පදිංචිව සිටින සහ ඔවුන් වෙනත් නවාතැනක් ගැන නොදන්නා අවස්ථාවන්හිදී, අදාල විසඳුම් ප්‍රජාතන්ත්‍රවාදී, ස්වේච්ඡා සහ පීඩාවට පත් දෙමළ ප්‍රජාවන් සමඟ සාකච්ඡා කරගත් ඒවා විය යුතුය; එහිදී බලපෑමට ලක්ව ඇති දෙමළ පීඩිත ජනතාවගේ අයිතීන්ට මූලිකස්ථානය හිමිවේ. නමුත් මූලධර්මය පැහැදිලිය: තමන්ගේ ඓතිහාසික ගම්මාන සහ නගර සඳහා දෙමළ ජනතාවට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අනුලංඝනීය වන අතර, එය උල්ලංඝනය කළ රාජ්‍යය ඊට අදාළ වන්දි/සහනය සැලසීමේ වගකීම දරයි.

අවසාන වශයෙන්, පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි පරම (බහිෂ්කාරක) අයිතිය සම්බන්ධයෙන් අලුතින් මතු වී ඇති අර්බුද පිළිබඳව වූ හිමිකම් කියාපෑම්වලට අදාළව, අපි එක් ප්‍රධාන මූලධර්මයක් ද අවධාරණය කළ යුත්තෙමු: එනම්, පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි මධ්‍යතන හෝ පුරාණ මූලාරම්භයන් කුමක් වුවත්, එම ස්ථානවල අයිතිය තමන්ට පමණක් සතු කරගැනීමට (exclusive right) කිසිදු ජනවාර්ගික-ආගමික කණ්ඩායමකට අයිතියක් නොමැත. මෙම මූලධර්මය ඉතා අවධාරණාත්මකව ප්‍රකාශ කළ යුත්තේ, අද වන විට උතුරේ සහ නැඟෙනහිර පිහිටි පුරාණ ස්ථානයන් ගණනාවක් සම්බන්ධයෙන් සැලකිය යුතු ආගමික අර්බුද නිර්මාණය කරමින්, සිංහල ස්වෝත්තමවාදීන් මෙන්ම දෙමළ ජාතිකවාදීන් ද මතු කරනු ලබන්නේ අතීත මුතුන්මිත්තන්ගේ පරම හිමිකාරීත්වය පිළිබඳ මෙකී කියාපෑමම වන බැවිනි. සිංහල-බෞද්ධ ස්වෝත්තමවාදීන් ප්‍රකාශ කරන්නේ දිවයිනේ “පුරාණ හෝ ඓතිහාසික අනන්‍යතාව” පරම ලෙසම සිංහල-බෞද්ධ වුවක් බවත්, ඒකීය සිංහල රාජ්‍යයක “සාක්ෂි මකා දැමීමේ දුෂ්ට අරමුණින්” දෙමළ ජනයා බෞද්ධ ස්ථාන “ආක්‍රමණය කර ඇති” බවත්ය. මුල්ලතිව්හි කුරුන්දියන්මලේ දී මෙන් දෙමළ ගොවීන් වගා කළ ඉඩම්වල බෞද්ධ විහාරස්ථාන ඉදි කිරීමත්, ත්‍රිකුණාමලයේ දී මෙන් දෙමළ බහුතරයක් වෙසෙන ප්‍රදේශවල නීතිවිරෝධී ලෙස බුදුපිළිම පිහිටුවීමත් සාධාරණීකරණය කිරීමට යොදාගනු ලබන්නේ මෙම කියාපෑමයි. දෙමළ ජාතිකවාදී පක්ෂ ද ඊට ප්‍රතිචාර දක්වන්නේ, එහි පුරාණ ස්ථානයන් දෙමළ ජාතියට පමණක් අයිති යැයි කියන පරම දෙමළ “නිජබිම” පිළිබඳ සිංහල වාර්ගිකවාදයේ ප්‍රතිබිම්බයක් වැනි කියාපෑමෙනි. මෙම කියාපෑම් දෙකම ප්‍රතිගාමී වේ. දිවයිනේ පුරාවිද්‍යාත්මක උරුමය යනු එහි සමස්ත කම්කරු ජනතාවගේම පොදු උරුමයක් මිස, කිසිදු ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමක පුද්ගලික දේපළක් නොවේ. එම ස්ථානයන් — ඒවා බෞද්ධ, හින්දු හෝ මිශ්‍ර හා විවාදාත්මක මූලාරම්භයක් සහිත ඒවා වුවද — සියවස් ගණනාවක පොදු ඉතිහාසයේ, සංක්‍රමණයේ, සංස්කෘතික හුවමාරුවේ සහ සහජීවනයේ (coexistence) ඵලයක් මිස, එකම “වර්ගයක” හෝ “ජාතියක” පරම ජනාවාසකරණයේ ඵලයක් නොවේ. අතීතයේ පරම හිමිකාරීත්වය එක් ප්‍රජාවකට පැවරීමට දරන උත්සාහය ඓතිහාසික ශාස්ත්‍රාලිකත්වයේ ක්‍රියාවක් නොව, පාලක පන්තිය සහ එහි වාර්ගිකවාදී අනුගාමිකයන් විසින් වාර්ගික වෛරය ඇවිළවීමට සහ කම්කරු පන්තිය බෙදීමට යොදවන ලද දේශපාලනික ආයුධයකි. කවර මුතුන්මිත්තන් විසින් කවර නටඹුන් ගොඩනැගුවේද යන්න පිළිබඳ ස්වෝත්තමවාදී තරගය කෙරෙහි කම්කරු පන්තියට කිසිදු උත්සුකයක් නොමැත. එහි උනන්දුව පවතින්නේ තමන්ගේ සංස්කෘතික හා ආගමික ජීවිතය සඳහා වන සියලු ප්‍රජාවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කිරීමත්, ඉඩම් අත්පත් කරගැනීමේ සහ වාර්ගිකවාදී කුපිත කිරීම්වල මෙවලමක් ලෙස රාජ්‍යය විසින් පුරාවිද්‍යාව භාවිත කිරීමට එරෙහි වීමත්, තමන්ගේ පාලනය පවත්වාගෙන යාම සඳහා මෙකී අර්බුද නිර්මාණය කරන ධනපති ක්‍රමයට එරෙහිව දෙමළ, සිංහල සහ මුස්ලිම් කම්කරුවන් එක්සත් කිරීමත් තුළය.

[1] Permanent Revolution and the National Question Today, David North (1993), (16 May 1998) <https://www.wsws.org/en/articles/1998/05/dnkb-m16.html>

[2] The Lure of Land: Peasant Politics, Frontier Colonization and the Cunning State in Sri Lanka, Thiruni Kelegama and Benedikt Korf (2023) Modern Asian Studies 1, Cambridge University Press <https://doi.org/10.1017/S0026749X22000506>

[3] ICG reports detail the militarisation in Sri Lanka’s North, Sampath Perera (24 March 2012) <https://www.wsws.org/en/articles/2012/03/sril-m24.html>

[4] The Situation in Sri Lanka and the Political Tasks of the Revolutionary Communist League, Statement of the International Committee of the Fourth International, David North, Keerthi Balasuriya (19 November 1987) <https://www.wsws.org/en/special/library/fi-15-1/05.html>

**Socialism AI**
by the WSWS
Ask a question
SocialismAI.com

මාක්ස්වාදය, භූ දේශපාලනය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම

Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**Socialism AI ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.**

**සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කම්කරුවෝ පීඩිත ජනතාවට හා තරුණයින්ට නායකත්වය සැපයිය යුතු අතර විප්ලවවාදී පක්ෂයෙන් මෙහෙය වනු ලැබිය යුතුය. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද, ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය. එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්තනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද, සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) සමග එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන **ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය** (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/. මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය **theSocialist.lk** නිති පතා කියවන්න. **The Socialist World** YouTube නාලිකාවේ විවරණ අසන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය wsws.org දිනපතා කියවන්න. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි. එසේම, කම්කරු පන්තියේ නායකත්වය ගොඩනැගීමේ අපගේ අරගලයට එකතු වන්න. **theSocialist.lk** සඳහා මුදලින් දායක වන්න.

**ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න